2016

වාර්ෂික වාර්තාව

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය

Annual Report

Uva Wellassa University

ஆண்டறிக்கை

ஊவா வெல்லஸ்ஸ பல்கலைக்கழகம்

Uva Wellassa University
Passara Road
Badulla

www.uwu.ac.lk

දැක්ම

ජාතික සම්පත් සමුදායට අගය එක් කිරීම
සඳහා වූ විශිෂ්ඨත්වයේ කේන්ද්‍රය වීම

මෙහෙවර

ජාතික සංවර්ධනයට සුවිශේෂී
දායකත්වයන් ලබා දීම පිණිස දැනුමෙන්,
කුසලතාවලින්, සාරධර්මවලින් හා ආකල්පයන්
ගෙන් හෙබි බහුශ්‍රුත, රැකියා නියුක්ත කළ
හැකි, තාක්ෂණතාන්ත්‍රික හා ව්‍යවසායික
උපාධිධාරීන් බිහි කිරීම

ජාතික සම්පත් සමුදායට අගය එක් කිරීම
කෙරෙහි ශක්තිමත් අවධාරණයක් සහිතව
ඉගැන්වීමෙහි, ඉගෙනීමෙහි හා පර්යේෂණයෙහි
උත්කෘෂ්ඨත්වයට පත්වීම

UWU
Uva Wellassa University

උඟව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය

විශ්වවිද්‍යාලීය පරමාර්ථ

විශ්වවිද්‍යාලය ආරම්භයේ සිට එහි පරමාර්ථ නිශ්චය කර ඇත. ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ 2016 වර්ෂය සඳහා වූ පරමාර්ථ පහත දැක්වේ:

1. කර්මාන්ත ක්ෂේත්‍රයේ හා සමාජයේ අවශ්‍යතාවන් සපුරාලන බහුශ්‍රැත උපාධිධාරීන් බිහි කිරීම.

2. වියදම් අඩු නමුත් ජාත්‍යන්තර ප්‍රමිතීන්ට සරිලන ඉහළ ගුණාත්මකතාවෙන් යුතු අධ්‍යයන වැඩ සටහන් ඉදිරිපත් කිරීමෙන් විදේශීය ශිෂ්‍යය ශිෂ්‍යාවන් සඳහා කීර්තිමත් උසස් ඉගෙනුම් කේන්ද්‍රයක් බවට පත්වීම

3. වැඩ සටහන් කාර්යක්ෂම හා සඵලදායී ලෙස පිරිනමනු පිණිස නව්‍ය හා සුනම්‍ය යාන්ත්‍රණ සංවර්ධනය කිරීම.

4. මෙහෙවර ඉටුකරනු පිණිස බලගැන්වුණු අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල සේවායෝජකයෙක් හා ආදර්ශමත් සේවා ප්‍රසම්පාදකයෙක් බවට පත්වීම

5. ප්‍රමුඛ පෙළේ තාක්ෂණයේ පිටුවහල ලබන විශිෂ්ඨතම පරිසරය පිරිනමන වඩාත් ආකර්ෂණීය ලෙස සැලසුම් ගත විශ්වවිද්‍යාලය බවට සංවර්ධනය වීම.

6. අධ්‍යයන, මූල්‍ය හා පරිපාලන කාර්යක්ෂමතාව හා සඵලදායිතාව සාක්ෂාත් කර ගනු පිණිස ආයතනික ධාරිතාව වර්ධනය කර ගැනීම.

උපකුලපතිතුමාගේ පණිවුඩය

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය ශ්‍රී ලංකාවේ අගය එක් කිරීම සඳහා වූ දැනුම මධ්‍යස්ථානය බවට පත් වනු පිණිස ස්ථානගතව තිබේ. 2025 වන විට මෙම දැක්ම සාක්ෂාත් කර ගැනීමට අපගේ ක්‍රමෝපාය අප මෙහෙයවනු ඇත.

මෙම දැක්ම සාක්ෂාත් කර ගැනීම සඳහා වූ ක්‍රමෝපායික මග මහත් පරිශ්‍රමයෙන් ජයගත යුතු අභියෝග ගණනාවකින් යුක්ත එකක් විනා රෝස මලින් තැනූවක් නොවේ. ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගෙන් හා කාර්යය මණ්ඩලයෙන් සමන්විත ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලීය පවුල සිය දැක්මට දෘඪතර ලෙස දිශාගත විය යුතු වන අතර" සමස්ත සංවිධානය එහි මෙහෙවර හා ක්‍රමෝපාය සමග ඒකාබද්ධ විය යුතු ය.

දැක්මත් සමග වර්ධනය වන තරුණ විද්වතුන් සමූහය අපගේ සවිමත් කොඳුනාරටියයි. අපගේ හදවත අන් කිසිවෙකුටත් නොදෙවෙනි තොරතුරු සන්නිවේදන තාක්ෂණ ශක්තියයි. සංවිධානමය ඉගෙනුම් හා වර්ධන අවශ්‍යතා සම්පූර්ණ කිරීමට ඉවහල් වන සංස්කෘතියක් සංවර්ධනය කිරීම අපට නියම වී ඇති කාර්යය යි.

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය සියල්ලන්ගේ ගෞරවයට පාත්‍ර වන්නා වූ අගය එක් කිරීමේ උත්කෘෂ්ට මධ්‍යස්ථානය බවට පත් වනු ඇති අතර එය සේවයියන්ගේ ප්‍රසාදයට භාජනය වන උපාධිධාරීන් බිහි කරනු ඇත. අපි සාර්ථක වන්නෙමු.

ආචාර්ය ජයන්ත ලාල් රත්නසේකර

පටුන

දැක්ම i

මෙහෙවර i

විශ්වවිද්‍යාලීය පරමාර්ථ ii

උප කුලපතිතුමාගේ පණිවුඩය iii

1 උප කුලපතිතුමාගේ සමාලෝචනය 1

1.1 **සංක්ෂිප්ත හැඳින්වීම** 1

1.2 **ජයග්‍රහණ** 4

1.3 **අනාගත සැලසුම්** 6

2 පාලක සභාව සහ සනාතන සභාව 8

2.1 පාලක සභාව - 2016 8

2.2 සනාතන සභාව - 2016 9

3. සංවිධාන ව්‍යුහය - ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය 10

4. ශිෂ්‍යය ශිෂ්‍යයාවෝ සහ මානව සම්පත් 11

4.1 ශිෂ්‍යය ශිෂ්‍යයාවන් බඳවා ගැනීම පිළිබඳ විස්තර (2016.12.31 දිනට) 11

4.2 ප්‍රථම උපාධි වැඩ සටහන් සඳහා අභිනවයෙන් ඇතුළත්වීම් - දේශීය ශිෂ්‍යය ශිෂ්‍යාවෝ 12

4.3 උපාධි ප්‍රදානය - 2016 13

4.4 නේවාසිකාගාර 14

4.4.1 විශ්වවිද්‍යාලයට අයත් නේවාසිකාගාර 14

4.4.2 කුලියට ගනු ලැබූ නේවාසිකාගාර 14

4.5 ශිෂ්‍යත්ත්ව 15

4.5.1 2016 වර්ෂයේ මහපොළ ශිෂ්‍යත්ත්ව හා ශිෂ්‍යාධාර පිළිබඳ විස්තර 15

4.5.2 2016 වර්ෂයේ වෙනත් ශිෂ්‍යත්ත්ව පිළිබඳ විස්තර 15

5. මානව සම්පත් 16

5.1 අධ්‍යයන කාර්යය මණ්ඩලය 16

5.2 පරිපාලන කාර්යය මණ්ඩලය 16

5.3 අධ්‍යයන උපකාරක හා අනධ්‍යයන කාර්යය මණ්ඩල 17

5.4 උපකාරක කාර්යය මණ්ඩල ව්‍යාප්තිය 18

6. පර්යේෂණ හා සංවර්ධනය 19

6.1 පර්යේෂණ, නව්‍යකරණ හා ප්‍රකාශන 19

6.2 වැඩ සටහන්, සම්මන්ත්‍රණ හා වැඩ මුළු 19

	6.3	ලැබූ සම්මාන පිළිබඳ විස්තර	19
7.		**මූල්‍යය හා විගණනය**	20
	7.1	පුනරාවර්තන වියදම්	20
	7.2	ප්‍රාග්ධන වියදම්	20
	7.3	ව්‍යාපෘති (විදේශ/දේශීය අරමුදල් සම්පාදිත)	21
	7.4	ව්‍යාපෘති වියදම් (දේශීය/ විදේශීය අරමුදල් සම්පාදිත)	21
	7.5	මූල්‍ය ප්‍රගතිය (වියදම)	21
	7.6	මූල්‍ය ප්‍රගතිය (උත්පාදිත ආදායම)	22
	7.7	මූල්‍ය ප්‍රගතිය - 2016	22
	7.8	යටිතල පහසුකම් - 2016	23
	7.9	2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය	24
	7.10	2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය කාර්යය සාධනය පිළිබඳ ප්‍රකාශය	25
	7.11	2016 දෙසැම්බර් 31 දිනට මුදල් ප්‍රවාහ ප්‍රකාශය	26
	7.12	විගණකාධිපති වාර්තාව	27
	7.13	විගණකාධිපති වාර්තාව තුළ මතු කරන ලද කාරණා සඳහා පිළිතුරු	39

1. උප කුලපතිතුමාගේ සමාලෝචනය

1.1 සංක්ෂිප්ත හැඳින්වීම

ශ්‍රී ලංකාවේ 14 වැනි ජාතික විශ්වවිද්‍යාලය වන ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය රැකියා සඳහා බඳවා ගැනීමේ නිර්ණායක හා උපාධිධාරී ප්‍රතිදානය අතර අනනුකූලතා පරතරය යා කරනු පිණිස වූ අත්හදා බැලීමක් වශයෙන් 2005 ජූනි 1 වැනි දින පිහිටුවන ලදී. ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය මෙරට ආර්ථික සංවර්ධනයට උරදෙනු පිණිස විද්‍යාත්මක, තාක්ෂණික හා ව්‍යවසායික දැනුම භාවිතා කිරීමේ දක්ෂතාව ඇති උපාධිධාරීන් බිහි කරනු පිණිස සහමුලින්ම ව්‍යවසායික විශ්වවිද්‍යාලයක් ලෙස නිර්මාණය කරන ලදී.

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය බදුල්ල මනරම් කඳුකර ප්‍රදේශයේ මනස්කාන්ත ලෙස පැතිරුනු දර්ශන සහිත අක්කර 59 ක භූමිභාගයක් සිසාරා පැතිර ඇත. ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය දේශීය හා ජාත්‍යන්තර අවශ්‍යතා සපුරන බහුවිෂය ක්ෂේත්‍රීය ප්‍රථම උපාධි වැඩ සටහන් 13 ක් ඉදිරිපත් කරන පීඨ 4 කින් සමන්විත ය.

නවතම පීඨය වශයෙන් තාක්ෂණවේද අධ්‍යයන පීඨය ස්ථාපිත කර ඇති අතර, නව උපාධි වැඩ සටහන් - එනම් කෘෂිකර්මය පිළිබඳ ඉංජිනේරු තාක්ෂණ උපාධිය හා පෙව පද්ධති තාක්ෂණ උපාධිය සඳහා ශිෂ්‍යය ශිෂ්‍යාවන් 167 දෙනකු බඳවා ගෙන ඇත. තවද මෙම විශ්වවිද්‍යාලය පශ්චාත් උපාධි දෙකක්ද මෙහෙයවයි.

පීඨය	උපාධි වැඩ සටහන
සත්ත්ව විද්‍යා හා අපනයන කෘෂිකර්ම	සත්ත්ව විද්‍යාව අපනයන කෘෂිකර්මය තේ තාක්ෂණවේදය හා අගය එක් කිරීම ජලජ සම්පත් තාක්ෂණය තාල හා ක්ෂීර තාක්ෂණය සහ අගය එක් කිරීම
විද්‍යා හා තාක්ෂණ	විද්‍යාව හා තාක්ෂණය පරිගණක විද්‍යාව හා තාක්ෂණය කර්මාන්ත තොරතුරු තාක්ෂණය ඛනිජ සම්පත් හා තාක්ෂණය
කළමනාකරණ	ව්‍යවසායකත්වය හා කළමනාකරණය ආගන්තුක සත්කාර, සංචාරක ව්‍යාපාර සහ සිද්ධි පිළිබඳ කළමනාකරණය
තාක්ෂණික අධ්‍යයන	ඉංජිනේරු තාක්ෂණය ජෛව පද්ධති තාක්ෂණය

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ ප්‍රථම උපාධි ශිෂ්‍යය ගහනය 2066 කි. අධ්‍යයන, පරිපාලන හා සේවා අංශ පුරා පැතිරුණු 272 දෙනකුගෙන් සමන්විත කාර්යය මණ්ඩලයක් එහි සේවය කරති. ආරම්භයේ සිට උප කුලපති තනතුරු සඳහා පත් කිරීම් කරන ලද්දේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපතිවරයා විසිනි.



උපාධි අපේක්ෂකයන් ගහනය

පසුගිය ශිෂ්‍යය කාණ්ඩ 6 පහසුවෙන් මෙරට රැකියා අවස්ථා තුළට අවශෝෂණය කර ගන්නා ලදී. ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය සිය උපාධිධාරීන්ට යහපත් අනාගතයක් සහතික කරයි. එහි ඉහළ රැකියා නියුක්ති අගය මගින් එහි සාර්ථකත්වය තහවුරු වී ඇත.

උපාධි වැඩසටහනේ නම	වර්ෂය					
	2011	2012	2013	2014	2015	2016
සත්ත්ව විද්‍යාව	29	36	50	35	42	31
අපනයන කෘෂිකර්මය	32	38	37	31	43	34
තේ තාක්ෂණවේදය හා අගය එක් කිරීම	-	40	42	37	43	19
ජලජ සම්පත් තාක්ෂණය	-	-	47	39	39	26
තාල හා ක්ෂීර තාක්ෂණය සහ අගය එක් කිරීම	-	-	39	38	44	17
විද්‍යාව හා තාක්ෂණය	38	38	35	41	35	51
පරිගණක විද්‍යාව හා තාක්ෂණය	36	43	39	40	42	68
කර්මාන්ත තොරතුරු තාක්ෂණය	-	41	40	43	40	31
ඛනිජ සම්පත් හා තාක්ෂණය	-	49	36	34	31	39
ව්‍යවසායකත්වය හා කළමනාකරණය	38	52	47	47	49	44
ආගන්තුක සත්කාර, සංචාරක ව්‍යාපාර සහ සිද්ධි පිළිබඳ කළමනාකරණය	-	-	32	51	42	50
එකතුව	**173**	**337**	**444**	**436**	**450**	**410**



උපාධි ප්‍රතිදානය 2011 - 2016

විවෘත හා දුරස්ථ ඉගෙනුම් කේන්ද්‍රය (සී.ඕ.ඩී.එල්.) විශ්වවිද්‍යාලයේ නවතම අංශය වන අතර ඌව පළාතේ ප්‍රජාව සඳහා දැනුම අවශ්‍යතා හා වෘත්තීයවේද හැකියාවන් සවිගැන්වීමට ඉලක්ක කරයි. එය දැනටමත් තොරතුරු තාක්ෂණය හා ඉංග්‍රීසි පිළිබඳ සහතික පත්‍ර පාඨමාලා අරඹා ඇත. එමෙන්ම එම මධ්‍යස්ථානය පළාත් ආණ්ඩුවෙහි විශේෂ අවශ්‍යතා සපුරාලනු පිණිස වූ වැඩ සටහන් වශයෙන් පෙව පද්ධති තාක්ෂණවේදය හා කෘෂිකර්මය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව (2016 වර්ෂය), සහ ඌව පළාතේ පාසල් සඳහා විද්‍යාව ඉගැන්වීම පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව සහ ඌව පළාතේ පාසල් ගුරුවරුන් සඳහා ඉතිහාසය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලා අරඹා ඇත.

යටිතල පහසුකම් සංවර්ධනය යටතේ රුපියල් මිලියන 300 ක පමණ වියදමින් තාක්ෂණවේද අධ්‍යයන පීඨය සඳහා නව සිවිමහල් ගොඩනැගිල්ලක් ඉදිකරනු පිණිස අමාත්‍ය මණ්ඩලය අනුමැතිය දී තිබේ. මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු 2017 ජූනි වන විට ඇරඹෙතැයි අපේක්ෂා කෙරේ. පීඨ ගොඩනැගිල්ල අවශ්‍ය ගිනි විපරම් පද්ධතියට අමතරව ශාලා හා පර්යේෂණාගාර සමඟ තථ්‍ය මනුකරණ පද්ධති, වැසි ජල අස්වනු පද්ධති සමඟ ඉදිකෙරෙනු ඇත. තවද, විශ්වවිද්‍යාලය 2016 වර්ෂය තුළ රුපියල් මිලියන 26.0 ක් වූ පුනරුත්ථාපන කටයුතු සිදු කර ඇත.

අධ්‍යයන කාර්යය මණ්ඩලයේ හා අනධ්‍යයන කාර්යය මණ්ඩලයේ ඇබෑර්තු වලින් බොහෝමයක් පුරවා ඇති අතර මීළඟ වර්ෂයේ මිනිස්බල අවශ්‍යතා සම්බන්ධයෙන් වූ ඉල්ලීමක් මහා භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කර ඇත.

ප්‍රභේදය		වර්ෂය					
		2011	2012	2013	2014	2015	2016
අධ්‍යයන කාර්යය මණ්ඩලය	මහාචාර්යය	02	-	-	-	-	02
	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යය	11	10	13	21	38	45
	කථිකාචාර්ය/ කථිකාචාර්යය (පරිවාස)	75	75	78	66	63	69
පරිපාලන කාර්යය මණ්ඩලය		12	15	13	16	16	16
උපකාරක කාර්යය මණ්ඩලය		04	04	04	04	40	73

පෙර පැවති මෙහෙයුම් සහකාර ක්‍රමය තවදුරටත් ක්‍රියාත්මක නොවන අතර පුහුණුලාභීන්ගේ ක්‍රියාකාරිත්වය හා සේවය සය මසකට සීමා කරනු ලැබ ඇත. නූතන කළමනාකරණ ක්‍රමවේද සැළකිල්ලට ගෙන, මෙම විශ්වවිද්‍යාලය ආරක්ෂක, ප්‍රවාහන, පවිත්‍රකරණ හා තවත් යම් මෙහෙයුම් සේවාවන් බැහැරට පවරා ඇත. විශ්වවිද්‍යාලය තුළ පුහුණු වීමේ පහසුකම් ලබා දීම මගින් ඌව පළාතේ තරුණ තරුණියන්ට සැළකිය යුතු සේවයක් සැළසීමට විශ්වවිද්‍යාලයට හැකි විය.

අභ්‍යන්තර ගුණාත්මකතා සාධක ඒකකය හා වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය වැඩි දියුණු කොට, අධ්‍යයන වැඩ සටහන් වල ගුණාත්මකතාව දියුණු කරනු පිණිස ජ්‍යෙෂ්ඨ කාර්යය මණ්ඩල සාමාජිකයින් දෙදෙනකු අර්ධ-කාලීන පදනමින් අධ්‍යක්ෂවරුන් වශයෙන් පත්කරනු ලදී. වෘත්තීය මාර්ගෝපදේශන අංශය ශිෂ්‍යය ශිෂ්‍යාවන්ගේ අනාගත රැකියා නියුක්තිය සඳහා පුහුණු කරනු පිණිස රැකියා පොළ නිතිපතා පවත්වයි.

2016 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය පහත දැක්වේ.



පුනරාවර්තන වියදම් පිළිබඳ විස්තර



මූලධන වියදම් පිළිබඳ විස්තර

I.2 ප්‍රයත්නයන්

- **යටිතල පහසුකම් සංවර්ධනය**

II අදියර යටතේ උප-ව්‍යාපෘති 41 ක් අනුමත කරනු ලැබූ අතර ඉන් 31 ක් දැනටමත් සම්පූර්ණ කර ඇත.

- **අධ්‍යයන හා පර්යේෂණ ප්‍රයත්නයන්**

2016 වර්ෂයේ දී විද්‍යා හා තාක්ෂණවේද පීඨය හා සත්ත්ව විද්‍යා හා අපනයන කෘෂිකර්ම පීඨය විසින් නව උපාධි වැඩ සටහන් 2 ක් - එනම් පිළිවෙළින් පෙව පද්ධති තාක්ෂණවේදය හා ඉංජිනේරු තාක්ෂණවේදය උපාධි වැඩ සටහන් - හඳුන්වා දෙන ලදී. 2017 වර්ෂයේ දී මෙම උපාධි වැඩ සටහන් 2 අභිනවයෙන් අරඹන ලද තාක්ෂණවේද අධ්‍යයන පීඨය වෙත පැවරීමට අපේක්ෂා කෙරේ.

2015 වර්ෂය තෙක් ශිෂ්‍යය ඇතුළත් කර ගැනීම් අනුපාතිකය උපාධි වැඩ සටහනකට ශිෂ්‍යය ශිෂ්‍යාවන් 50 දෙනෙක් විය. 2016 වර්ෂයේ සිට එය උපාධි වැඩ සටහනකට ශිෂ්‍යය ශිෂ්‍යාවන් 65 ක් දක්වා වැඩි කරන ලදී.

මෙම විශ්වවිද්‍යාලය 2016 වර්ෂයේ දී විදෙස් පර්යේෂකයින්ගේ සහභාගිත්වයෙන් සිය පළමු ජාත්‍යන්තර පර්යේෂණ සමුළුව සංවිධානය කළාය. මෙම විශ්වවිද්‍යාලය පර්යේෂණ සඳහා වූ ජාත්‍යන්තර සහයෝගිත්වයට උරදෙන අතර, ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ පර්යේෂණ වැඩ සටහන් ශක්තිමත් කිරීමට යත්න දරයි.

2016 වර්ෂයේ දී පෙව විද්‍යාව පිළිබඳ විශිෂ්ඨතම කැපී පෙණෙන තරුණ පර්යේෂකයා සඳහා වූ සම්මානය ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලීය අධ්‍යයන කාර්යය මණ්ඩල සාමාජිකයකුට පිරිනමන ලදී.

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය, 2016-2020 ආයතනික සැළැස්ම තුළ පිළිබිඹු කර ඇති සේම, පශ්චාත් උපාධි අපේක්ෂක පුහුණුව, පර්යේෂණය හා ශාස්ත්‍රෝද්ග්‍රහණය කේන්ද්‍රික කර්තව්‍යය වශයෙන් හඳුනා ගෙන ඇත. සත්ත්ව විද්‍යා හා අපනයන කෘෂිකර්ම පීඨය සහ විද්‍යා හා තාක්ෂණවේද පීඨය 2016 වර්ෂයේ දී සිය පර්යේෂණ මගින් වූ උසස් උපාධි වැඩ සටහන ආරම්භ කර ඇති අතර එය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කර ඇත. දැනට එම්.ෆිල් සඳහා ලියාපදිංචි වූ ශිෂ්‍යය ශිෂ්‍යාවන් 5 දෙනෙක් විද්‍යා හා තාක්ෂණවේද පීඨයේ ද, එක් ශිෂ්‍යයෙක් සත්ත්ව විද්‍යා හා අපනයන කෘෂිකර්ම පීඨයේ ද සිටිති. තවද, කළමනාකරණ පීඨය මේ වන විට පර්යේෂණ මගින් වූ උසස් උපාධි වැඩ සටහන සංවර්ධනය කරමින් සිටියි.

- **ප්‍රජා බැහැර අවතීර්ණ වැඩ සටහන්**

සෑම වර්ෂයකම, ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යය ශිෂ්‍යාවන් හා කාර්යය මණ්ඩලය විසින් ප්‍රජා සංවර්ධන වැඩ සටහන් ගණනාවක් සිදු කරනු ලබයි. 2016 වර්ෂයේ දී එබඳු වැඩ සටහන් 51 ක් පවත්වනු ලැබූ අතර, ඉන් කිහිපයක් පිළිබඳ කෙටි විස්තරයක් පහත සඳහන් වේ.

විශ්වවිද්‍යාල-පාසල් ඒකාබද්ධ ක්‍රියාකාරකම්: ඌව පළාතේ ප්‍රමුඛ ජාතික විශ්වවිද්‍යාලය වශයෙන් ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය පාසල් දරුවන් අතර නිර්මාණශීලිත්වය හා නව්‍ය හැඟීම් ප්‍රවර්ධනය කිරීමෙහිලා ප්‍රමුඛත්වය ගනී. මෙම දරුවෝ ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ ඉගෙන ගන්නා මීළඟ පරපුර වනු ඇත. එමෙන්ම ඌව පළාතේ විද්‍යාව හා තාක්ෂණවේදය නගා සිටුවීමේ වගකීම ඇත්තේ ද ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයටයි. මෙම විශ්වවිද්‍යාලය වාර්ෂිකව පාසල් දරුවන් හා ගුරුවරුන් සඳහා විවිධ ක්‍රියාකාරකම් සංවිධානය කරයි.

- ෆුඩ් ෆියෙස්ටා: විනෝදාත්මක ප්‍රවේශයකින් බදුල්ලේ පොදු ජනතාව වෙත පිවිසෙමින් ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය 2016 අගෝස්තු 25 වැනි දින බදුල්ලේ විල්ස් උද්‍යානයේ දී ආහාර උළෙලක් (ෆුඩ් ෆියෙස්ටා) පැවැත්වීය. සුවිශේෂී රස හා පෙනුම සහිත ආහාරයට ගත හැකි විවිධ වර්ග වල නවමු සත්ත්ව, ජලජ හා ශාක නිෂ්පාදන එහි තිබුණි. අධ්‍යයන, පරිපාලන හා අනධ්‍යයන කාර්යය මණ්ඩලය, ශිෂ්‍යය ශිෂ්‍යාවෝ හා පොදු ජනතාව ඉතා උද්‍යෝගයෙන් යුතුව මෙම අවස්ථාවට සහභාගි වූහ.

- පරිගණක විද්‍යාගාරය පරිත්‍යාග කිරීම: වේගයෙන් ඉදිරියට යන තාක්ෂණ ලෝකය තුළට පිවිසීමට වරම් අහිමි ශිෂ්‍යය ශිෂ්‍යාවන්ගේ තොරතුරු තාක්ෂණවේද දැනුම ඔප් නැංවීමේ පරමාර්ථය පෙරදැරි කර ගෙන පරිගණක විද්‍යා හා තාක්ෂණවේද අධ්‍යයනාංශය විසින් ඇල්පිටිය නවෝද්‍යා විද්‍යාලයට පූර්ණ ක්‍රියාකාරී පරිගණක විද්‍යාගාරයක් පරිත්‍යාග කරන ලදී.

- සිසු නැණ සවි: පරිගණක විද්‍යා හා තාක්ෂණවේද උපාධි වැඩ සටහන විසින් පස්සර ගැමුණු විද්‍යාලයේ ශිෂ්‍යය ශිෂ්‍යාවන්ට තාක්ෂණවේදය උපයෝගී කර ගැනීම හා තාක්ෂණය යොදා ගැනීමේ ප්‍රතිලාභ ප්‍රදර්ශනය කිරීම මගින් තාක්ෂණවේද ක්ෂේත්‍රයේ වැදගත්කම පිළිබඳව අවබෝධ කරවනු පිණිස එම ශිෂ්‍යය ශිෂ්‍යාවන් සඳහා තොරතුරු තාක්ෂණය පිළිබඳව දැනුවත් කිරීමේ වැඩ සටහනක් පවත්වන ලදී.

- නැණසට අරුණළු: බනිජ සම්පත් තාක්ෂණවේද උපාධි වැඩ සටහන පස්සර අවට අඩු වරප්‍රසාද ලත් පාසල් වල අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) ශිෂ්‍යය ශිෂ්‍යාවන් සඳහා විද්‍යාව, ගණිතය හා ඉංග්‍රීසි යන විෂයයන් පිළිබඳ සම්මන්ත්‍රණයක් වාර්ෂිකව පස්සර මහා විද්‍යාලයේදී සංවිධානය කරයි.

- මනුසත් හඬ: ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ කලා සමාජය විසින් වාර්ෂිකව සෞන්දර්යාත්මක ක්‍රියාකාරකම් මාලාවකින් සමන්විත සංස්කෘතික සන්දර්ශනයක් සංවිධානය කෙරේ. එය විශ්වවිද්‍යාලීය මෙන්ම පාසල් ශිෂ්‍යය ශිෂ්‍යාවන් ඉලක්ක කරමින්, ඔවුන්ගේ සෞන්දර්යාත්මක දක්ෂතා ප්‍රවර්ධනය කරයි.

- විද්‍යා කඳවුර: විද්‍යා කඳවුර වනාහි 2010 වර්ෂයේ ආරම්භ කරන ලද්දව, ඌව ජනතාවගේ අධ්‍යාපන අවශ්‍යතාවන්ට උරදීමේ අරමුණින් අඛණ්ඩව පවත්වනු ලබන වැඩ සටහනකි. සෑම වර්ෂයක දීම මෙම වැඩ සටහන අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විද්‍යා විෂයය දහරාවේ ශිෂ්‍යය ශිෂ්‍යාවන් වෙත පිරිනමනු ලැබේ.

- ඌව කෘෂිකර්ම සංවර්ධන සංසදය: සත්ත්ව විද්‍යා හා අපනයන කෘෂිකර්ම පීඨය ඌව පළාතේ සංවර්ධන ක්‍රියාකාරකම් වල ක්‍රියාකාරී ලෙස නියැලී සිටින විද්වතුන් හා වෙනත් රාජ්‍ය හා රාජ්‍ය නොවන ක්ෂේත්‍ර වල කොටස්කරුවන්ගේ සහභාගිත්වය ඇතිව ''ඌව කෘෂිකර්ම සංවර්ධන සංසදය'' නමින් සහක්‍රියාකාරී ආයතනයක් ඇති කර තිබේ.

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය විසින් සංවිධානමය ප්‍රතිඵල රාමුසැකැස්ම (ORF) සම්බන්ධයෙන් 2016 වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද වාර්තාව ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ව්‍යාපෘති කළමනාකරණ හා නිරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ඇගැයීමට භාජනය කර ඇත. සංවිධානමය ප්‍රතිඵල රාමුව අනුව ප්‍රතිඵල අත්කර ගැනීමෙහිලා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ කාර්යය සාධනය සතුටුදායක එකක් බැව් ව්‍යාපෘති

කළමනාකරණ හා නිරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජෙනරාල්වරයා සිය ප්‍රතිපෝෂණය තුළ පිළිගැනීමට ලක් කර තිබේ.

I.3 අනාගත සැළසුම්

I. තාක්ෂණවේද අධ්‍යයන පීඨය සඳහා වූ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය සඳහා කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමට අපේක්ෂා කෙරේ. තුන්මහල් ගොඩනැගිලි සංකීර්ණයක ඉදිකිරීම් වැඩ 2017 අගෝස්තු මාසයේ දී අරඹන ලදී. මෙම ව්‍යපෘතිය 2019 අගෝස්තු මාසයේ දී සම්පූර්ණ කිරීමට නියමිත ය.

II. ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය ගොඩනැගිලි ඉදිකරනු පිණිස කර්මාන්ත අමාත්‍යාංශය හා බලන්ගොඩ වැවිලි සමාගම පී.එල්.සී. වෙතින් ඉඩම් අක්කර 64 ක් අත්කර ගෙන ඇත. මේ වන විට බලංගොඩ වැවිලි සමාගම පී.එල්.සී. වෙතින් තවත් අක්කර 25 ක් සඳහා අත්කර ගැනීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මකව පවතී. තවද විශ්වවිද්‍යාලය පුළුල් කිරීම සඳහා බලංගොඩ වැවිලි සමාගම පී.එල්.සී. හි වේවැස්ස වතුයායෙන් අමතර ඉඩම් අක්කර 12 ක් අත්කර ගැනීම සඳහා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත යෝජනාවක් ඉදිරිපත් කර ඇත.

III. මෙම විශ්වවිද්‍යාලය අමු ද්‍රව්‍යවලට අගය එක් කිරීම කෙරෙහි අවධානය යොමු කරමින් ශක්තිමත් පර්යේෂණ සංස්කෘතියක් සංවර්ධනය කරනු ඇත. එමෙන්ම එය මේ දක්වා නොසලකා හරින ලද සේවා අංශය වෙත පර්යේෂණ සබඳතා ගොඩනගනු ඇත. මෙම විශ්වවිද්‍යාලය විසින් ආවරණය කරනු ලබන ක්ෂේත්‍ර වන්නේ තේ, රබර්, තාලවෘක්ෂ (උදා:- පොල්), කෘෂිකාර්මික අපනයන, බනිජ, ධීවර, සත්ව විද්‍යා, කර්මාන්ත හා ව්‍යාපාර තුළ තොරතුරු හා තාක්ෂණවේද ව්‍යවහාරික, ව්‍යවසායකත්වය හා කළමනාකරණය, සංචරණය, සත්කාරකත්ව හා අවස්ථා කළමනාකරණය සහ බලශක්ති ක්ෂේත්‍රයි. අමුද්‍රව්‍ය සම්පත්වලට විශ්වවිද්‍යාලයේ පර්යේෂණ තුළින් නව පිරිසකසු වටිණාකමක් ලැබෙන අතර එම දැනුම විවිධ පාඨමාලා ඔස්සේ ශිෂ්‍යය ශිෂ්‍යාවන්ට හා පොදුවේ රටට ලබා දෙනු ඇත.

මෙම විශ්වවිද්‍යාලය පිහිටුවීම ජාතික සංවර්ධනය සඳහා ධාරිතාව ගොඩනැගීම උදෙසා වූ ඉල්ලුම මඟින් මෙහෙයවනු ලබන අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීමේ රජයේ ප්‍රයත්නයට ප්‍රධාන උත්ප්‍රේරකයකි. මෙම විශ්වවිද්‍යාලය හේතු කොට ගෙන, බදුල්ල දැනටමත් ජාතික අරමුණු සමඟ බද්ධ වූ සුවිශේෂී ක්ෂේත්‍ර මාලාවක් තුළ පෝෂිත පාඨමාලා සඳහා සත්කාරකත්වය දරන විශේෂඥතා සුරක්ෂිතාගාරයක් බවට පත්ව තිබේ. ඌව පළාතේ උපායමාර්ගික හවුල්කරුවකු වශයෙන් වූ සිය කාර්යය භාරය මෙම විශ්වවිද්‍යාලය හඳුනා ගෙන ඇති අතර, එම නිසාම මෙම කලාපයේ ආර්ථික සංවර්ධනය, සාමාජීය සංවර්ධනය හා පාරිසරික තිරසාරත්වය වෙත දායකත්වය ලබා දීමට අපේක්ෂා කරයි.

මෙම විශ්වවිද්‍යාලය ප්‍රථම උපාධි, පශ්චාත් උපාධි, විශේෂඥතා, සංස්ථායික හා අබණ්ඩ අධ්‍යාපන වෙළඳපල ආවරණය කරනු ඇත. මෙම විශ්වවිද්‍යාලය වැඩිහිටියන්ට ඉගෙනුම හා අධ්‍යාපනය ඉදිරියට කර ගෙන යාමේ හැකියාව ලබා දෙමින් අධ්‍යාපනික ක්‍රියාකාරකම් මෙහෙයවනු ඇත. එමෙන්ම එය ශිෂ්‍යය ශිෂ්‍යාවන්ට පාඨමාලා බාහිරව හැදෑරීමට මෙන්ම දුරස්ථ ඉගෙනුම් ක්‍රම හරහා හැදෑරීමට හැකියාව ඇති කරයි.

රැකියා ලෝකය සඳහා අවශ්‍ය වන අත්‍යාවශ්‍ය කුසලතා හා හර වටිණාකම් වල දියුණු නිපුනතාව උත්කෘෂ්ඨ මට්ටමකට සංවර්ධනය කෙරෙනු ඇත.

මෙම විශ්වවිද්‍යාලය නව පාඨමාලා හා වැඩ සටහන් හරහා උසස් අධ්‍යාපනයේ විෂයය පථය පුළුල් කරනු ඇත.

IV. 2018 වර්ෂය වන විට විද්‍යාව හා තාක්ෂණවේදය, කෘෂිකර්මය හා කළමනාකරණය සඳහා විදෙස් ශිෂ්‍යය ශිෂ්‍යාවන් විසින් වඩාත් ඉල්ලුම් කරන විශ්වවිද්‍යාලය බවට ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය පත් කිරීම අභිමතාර්ථයන් ගෙන් එකකි.

V. ගෝලීය ඉල්ලුම සපුරාලනු පිණිස විවිධ පාඨමාලා ඒකාබද්ධ කරමින් උපාධි වැඩ සටහන් වල බහුවිෂය-ක්ෂේත්‍රීය ස්වභාවය පවත්වා ගෙන යනු ඇති අතර එය තවදුරටත් සංවර්ධනය කරනු ඇත.

VI. විශ්වවිද්‍යාලයේ මෙහෙවර සාක්ෂාත් කර ගැනීමේ ධාරිතාව සහිත ඉහළ සුදුසුකම් ඇති කාර්යය බලකාය බඳවා ගැනීම හා රඳවා ගැනීම ඉහළ ප්‍රමුඛත්වයක් වනු ඇත.

VII. මෙම විශ්වවිද්‍යාලය 2018 වර්ෂය වන විට ඉගැන්වීම, ඉගෙනීම හා පර්යේෂණ කටයුතු සඳහා විශිෂ්ඨ යටිතල පහසුකම් නිර්මාණය කිරීමේ සිය අබණ්ඩ ප්‍රයත්නයෙහි නිරතව සිටිනු ඇත.

2. පාලක සභාව හා සනාතන සභාව

2.1 පාලක සභාව

1985 අංක 07 දරන විශ්වවිද්‍යාල (සංශෝධන) පනතේ 24 වගන්තිය මඟින් සංශෝධිත 1987 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 44 වගන්තිය ප්‍රකාරව විශ්වවිද්‍යාලීය පාලක සභාව 2016 වර්ෂයේ දී පහත සාමාජිකයින් ගෙන් සමන්විත විය.

උප කුලපති — **ආචාර්ය පී. චන්ද්‍රසේන**

පීඨාධිපතිවරු

සත්ත්ව විද්‍යා හා අපනයන කෘෂිකර්ම පීඨය	ආචාර්ය එස්.සී. ජයමාන්න
කළමනාකරණ පීඨය	ආචාර්ය පී.අයි.එන්. ප්‍රනාන්දු
විද්‍යා හා තාක්ෂණවේද පීඨය	ආචාර්ය ඊ.පී.එස්.කේ. එදිරිවීර

සනාතන සභාව විසින් පහත සාමාජිකයින් සභාව තුළ නියෝජනය කිරීමට පත් කරන ලදී.

ආචාර්ය කේ.බී. විජේසේකර

ආචාර්ය එල්.එම්.එච්.ආර්. අල්විස් (2016.09.23 දින දක්වා)

ජී.එච්. අබේවීර මහතා (2016.11.18 දින සිට)

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පහත සාමාජිකයින් පත් කරන ලදී.

ආචාර්ය ඩබ්ලියුව්. අබේකෝන්

ටී. නන්දසේන මහතා

ආචාර්ය ඒ. ගුණවර්ධන

එන්. අබේසිරි මහතා (2016.09.13 දින දක්වා)

එච්. දයාවංශ මහතා

2.2 සනාතන සභාව

1985 අංක 07 දරන විශ්වවිද්‍යාල (සංශෝධන) පනත මඟින් සංශෝධිත 1987 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 46 වගන්තිය ප්‍රකාරව සනාතන සභාව 2016 වර්ෂයේ දී පහත සාමාජිකයින් ගෙන් සමන්විත විය.

උප කුලපති — **ආචාර්ය පී. චන්ද්‍රසේන**

පීඨාධිපතිවරු

සත්ව විද්‍ය හා අපනයන කෘෂිකර්ම පීඨය	ආචාර්ය එස්.සී. ජයමාන්න
විද්‍යා හා තාක්ෂණවේද පීඨය (වැඩ බලන)	ආචාර්ය ඊ.පී.එස්.කේ. එදිරිවීර
කළමනාකරණ පීඨය	ආචාර්ය පී.අයි.එන්. ප්‍රනාන්දු

අධ්‍යයනාංශ ප්‍රධානීහු

සත්ව විද්‍යා අධ්‍යයනාංශය	ආචාර්ය ඩී.කේ.ඩී.ඩී. ජයසේන
අපනයන කෘෂිකර්ම අධ්‍යයනාංශය	ආචාර්ය එල්.එම්.එච්.ආර්. අල්විස් (2016.09.30 දින දක්වා)
අපනයන කෘෂිකර්ම අධ්‍යයනාංශය	ආචාර්ය පී.ඒ. කාලියාදාස (2016.10.01 දින සිට)
විද්‍යා හා තාක්ෂණවේද අධ්‍යයනාංශය	ආචාර්ය කේ.බී. විජේසේකර
පරිගණක විද්‍යා හා තාක්ෂණවේද අධ්‍යයනාංශය (වැඩ බලන)	ආචාර්ය ඊ.පී.එස්.කේ. එදිරිවීර
කළමනාකරණ විද්‍යා අධ්‍යයනාංශය	පී.එච්. අබේවීර මහතා
රාජ්‍ය පරිපාලන අධ්‍යයනාංශය	ආචාර්ය එච්.ආර්.එන්. පීරිස් (2016.07.31 දින දක්වා)
රාජ්‍ය පරිපාලන අධ්‍යයනාංශය	ආචාර්ය පී.එච්.ටී. කුමාර (2016.08.01 දින සිට)

පීඨ නියෝජිතවරු

සත්ව විද්‍යා හා අපනයන කෘෂිකර්ම පීඨය	ආචාර්ය ආර්.ආර්.එම්.කේ.කේ. විජේසුන්දර (2016.09.30 දක්වා)
සත්ව විද්‍යා හා අපනයන කෘෂිකර්ම පීඨය	ආචාර්ය ඊ.ඩී.එන්.එස්. අබේරත්න (2016.10.01 දින සිට)
සත්ව විද්‍යා හා අපනයන කෘෂිකර්ම පීඨය	ආර්.එම්.සී.ඩබ්ලිව්.එම්. රත්නායක මිය (2016.10.31 දින දක්වා)
විද්‍යා හා තාක්ෂණවේද පීඨය	ආචාර්ය පී.එම්. සිරිමාන්න (2016.07.31 දක්වා)
විද්‍යා හා තාක්ෂණවේද පීඨය	ආචාර්ය එන්.පී. ප්‍රේමචන්ද්‍ර (2016.08.01 දින සිට)
විද්‍යා හා තාක්ෂණවේද පීඨය	ආචාර්ය ඒ.ආර්. කුමාරසිංහ (2016.10.31 දින දක්වා)
විද්‍යා හා තාක්ෂණවේද පීඨය	කේ.ඩබ්ලිව්.එස්.එන්. කුමාරි මහතා (2016.11.01 දින සිට)
කළමනාකරණ පීඨය	ආචාර්ය කේ.එම්. එම්.සී.බී. කුලතුංග
කළමනාකරණ පීඨය	ආචාර්ය පී.එච්.ටී. කුමාර

සහකාර පුස්තකාලයාධිපතිවරු — ඩී.පී.සී. විතාන මිය (2016.09.30 දින දක්වා)
කේ.එම්.ආර්.කේ. කුලතුංග මිය (2016.10.01 දින සිට)

3. සංවිධාන ව්‍යුහය - ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය



අ.නි - අධ්‍යායනාංශ ප්‍රධානී
ජ්‍යෙ.ස.අ.වි - ජ්‍යෙෂ්ඨ සහකාර අභයන්තර විගණක
ශා.අ අධ්‍යක්ෂ- ශාරීරික අධ්‍යාපන අධ්‍යක්ෂ
ජ්‍යෙ.ස.ලේ - ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී
ජ්‍යෙ.ස.මු - ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී
ස.ලේ - සහකාර ලේඛකාධිකාරී
ස.මු - සහකාර මූල්‍යාධිකාරී

4. ශිෂ්‍යය ශිෂ්‍යයාවෝ සහ මානව සම්පත්

පීඨය	අධ්‍යයන පාඨමාලාව	මුළු ශිෂ්‍ය සංඛ්‍යාව	මුළු අධ්‍යයන කාර්යය මණ්ඩලය	මුළු අනධ්‍යයන කාර්යය මණ්ඩලය
සත්ත්ව විද්‍යා හා අපනයන කෘෂිකර්ම	සත්ත්ව විද්‍යාව	194	74	13
	අපනයන කෘෂිකර්මය	184		
	තේ තාක්ෂණවේදය හා අගය එක් කිරීම	132		
	ජලජ සම්පත් තාක්ෂණය	166		
	තාල හා ක්ෂීර තාක්ෂණය සහ අගය එක් කිරීම	138		
විද්‍යා හා තාක්ෂණවේද	විද්‍යාව හා තාක්ෂණය	195	73	13
	පරිගණක විද්‍යාව හා තාක්ෂණය	221		
	කර්මාන්ත තොරතුරු තාක්ෂණය	207		
	ඛනිජ සම්පත් හා තාක්ෂණය	175		
කළමනාකරණ	ව්‍යවසායකත්වය හා කළමනාකරණය	228	32	2
	ආගන්තුක සත්කාර, සංචාරක ව්‍යාපාර සහ සිද්ධි පිළිබඳ කළමනාකරණය	226		
එකතුව		**2066**	**179**	**28**

4.1 ශිෂ්‍යය ශිෂ්‍යයාවන් බඳවා ගැනීම පිළිබඳ විස්තර (2016.12.31 දිනට)

උඹ වෙල්ලස්ස විශ්වවිද්‍යාලයට ඇතුළත් කර ගැනීමට යෝජිත ශිෂ්‍යය සංඛ්‍යාව 2016 වර්ෂයේ දී වැඩි කරන ලදී. ඒ අනුව උඹ වෙල්ලස්ස විශ්වවිද්‍යාලය සත්ත්ව විද්‍යා හා අපනයන කෘෂිකර්ම පීඨයේ හා විද්‍යා හා තාක්ෂණවේද පීඨයේ එක් එක් උපාධි වැඩ සටහනක් සඳහා ශිෂ්‍යය ශිෂ්‍යයාවන් 60 දෙනකු බැගින් සහ කළමනාකරණ පීඨය සඳහා ශිෂ්‍යය ශිෂ්‍යයාවන් 65 දෙනකු ද බඳවා ගනී. ඔවුන් තෝරා ගනු ලැබුවේ අධ්‍යාපන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයේ ප්‍රතිඵල හා උඹ වෙල්ලස්ස විශ්වවිද්‍යාලය විසින් පවත්වන ලද අභියෝග්‍යතා පරීක්ෂණයක ප්‍රතිඵල පදනම් කර ගෙන ය.

පීඨය	අධ්‍යයන පාඨමාලාව	මාධ්‍යය	පළමු වසර (2014/2015)	දෙවන වසර (2013/2014)	තෙවන වසර (2012/2013)	සිව්වන වසර (2011/2012)
සත්ත්ව විද්‍යා හා අපනයන කෘෂිකර්ම	සත්ත්ව විද්‍යාව	ඉංග්‍රීසි	52	48	47	47
	අපනයන කෘෂිකර්මය		53	49	39	43
	තේ තාක්ෂණවේදය හා අගය එක් කිරීම		37	36	36	23
	ජලජ සම්පත් තාක්ෂණය		52	38	42	34
	තාල හා ක්ෂීර තාක්ෂණය සහ අගය එක් කිරීම		39	42	33	24
විද්‍යා හා තාක්ෂණවේද	විද්‍යාව හා තාක්ෂණය		54	42	50	49
	පරිගණක විද්‍යාව හා තාක්ෂණය		55	50	49	67
	කර්මාන්ත තොරතුරු තාක්ෂණය		60	60	49	38
	ඛනිජ සම්පත් හා තාක්ෂණය		48	52	43	32
කළමනාකරණ	ව්‍යවසායකත්වය හා කළමනාකරණය		63	60	53	52
	ආගන්තුක සත්කාර, සංචාරක ව්‍යාපාර සහ සිද්ධි පිළිබඳ කළමනාකරණය		62	61	48	55
එකතුව			**575**	**538**	**489**	**464**

4.2 ප්‍රථම උපාධි වැඩ සටහන් සඳහා අභිනවයෙන් ඇතුළත්වීම් - දේශීය ශිෂ්‍යය ශිෂ්‍යාවෝ

පීඨය	අධ්‍යයන වැඩ සටහන	ඇතුළත් කර ගැනීමේ වර්ෂය	ඇතුළත් කර ගැනීමට එකඟ වූ සංඛ්‍යාව	ලියාපදිංචි තථ්‍ය ශිෂ්‍යය සංඛ්‍යාව
සත්ත්ව විද්‍යා හා අපනයන කෘෂිකර්ම	සත්ත්ව විද්‍යාව	2014/15	60	52
	අපනයන කෘෂිකර්මය		60	53
	තේ තාක්ෂණවේදය හා අගය එක් කිරීම		60	37
	ජලජ සම්පත් තාක්ෂණය		60	52
	තාල හා ක්ෂීර තාක්ෂණය සහ අගය එක් කිරීම		60	39
විද්‍යා හා තාක්ෂණවේද	විද්‍යාව හා තාක්ෂණය		60	54
	පරිගණක විද්‍යාව හා තාක්ෂණය		60	55
	කර්මාන්ත තොරතුරු තාක්ෂණය		60	60
	ඛනිජ සම්පත් හා තාක්ෂණය		60	48
කළමනාකරණ	ව්‍යවසායකත්වය හා කළමනාකරණය		65	63
	ආගන්තුක සත්කාර, සංචාරක ව්‍යාපාර සහ සිද්ධි පිළිබඳ කළමනාකරණය		65	62
එකතුව			**670**	**575**

අභිනවයෙන් ඇතුළත් කර ගනු ලැබූ ශිෂ්‍යය කාණ්ඩයේ ස්ත්‍රී-පුරුෂ ව්‍යාප්තිය - 2016

(2014/2015 ශිෂ්‍යය කාණ්ඩය)



4.3 උපාධි ප්‍රතිදානය - 2016

උපාධි වැඩසටහනේ නම	වර්ෂය - 2016 (2011/2012 ශිෂ්‍යය කාණ්ඩය)		
	පිරිමි	කාන්තා	එකතුව
සත්ත්ව විද්‍යාව	7	24	**31**
අපනයන කෘෂිකර්මය	6	28	**34**
තේ තාක්ෂණවේදය හා අගය එක් කිරීම	5	14	**19**
ජලජ සම්පත් තාක්ෂණය	8	18	**26**
තාල හා ක්ෂීර තාක්ෂණය සහ අගය එක් කිරීම	4	13	**17**
විද්‍යාව හා තාක්ෂණය	20	31	**51**
පරිගණක විද්‍යාව හා තාක්ෂණය	29	39	**68**
කර්මාන්ත තොරතුරු තාක්ෂණය	12	19	**31**
ඛනිජ සම්පත් හා තාක්ෂණය	15	24	**39**
ව්‍යවසායකත්වය හා කළමනාකරණය	11	33	**44**
ආගන්තුක සත්කාර, සංචාරක ව්‍යාපාර සහ සිද්ධි පිළිබඳ කළමනාකරණය	15	35	**50**
එකතුව	**132**	**278**	**410**

2016 වර්ෂයේ උපාධි ලැබූ ශිෂ්‍යය ශිෂ්‍යාවන්ගේ ස්ත්‍රී-පුරුෂ ව්‍යාප්තිය (2011/2012 ශිෂ්‍යය කාණ්ඩය)



4.4 නේවාසිකාගාර

4.4.1 විශ්වවිද්‍යාලයට අයත් නේවාසිකාගාර

නම	පිහිටි ස්ථානය	ධාරිතාව			වර්ෂයකට ශිෂ්‍ය ගාස්තුව (රු.)
		පිරිමි	කාන්තා	එකතුව	
කොරල් බියුටි	විශ්වවිද්‍යාල පරිශ්‍රය	136	-	218	5000.00
සිල්ව ට්‍රිප්ස්		82	-		
බිලුසඟාය(ඊ)		-	138	276	
කැටලියා		-	138		

4.4.2 කුලියට ගනු ලැබූ නේවාසිකාගාර

පිහිටි ස්ථානය	වර්ෂයකට කුලී පිරිවැය	2016 දෙසැම්බර් 31 දිනට නේවාසිකව සිටි සංඛ්‍යාව			වර්ෂයට එක් ශිෂ්‍යයකු සඳහා ගාස්තුව (රු.)
		පිරිමි	කාන්තා	එකතුව	
අංක 4", ජල ටැකිය පාර, හිඳගොඩ, බදුල්ල	611,100.00	121	305	426	3500.00
අංක 2/79, රඹුක්පොත, බදුල්ල	252,000.00				
අංක 14/25, හංවැල්ල පාර, බදුල්ල	192,780.00				
අංක 14/25, හංවැල්ල පාර, බදුල්ල	192,780.00				
අංක 14/24, හංවැල්ල පාර, බදුල්ල	207,900.00				
අංක 08, කන්දවත්ත පාර, නුගේගොඩ	472,500.00				
පිනානන්දග පාර, හිඳගොඩ, බදුල්ල	240,000.00				
අංක 15", ජල ටැංකිය පාර, හිඳගොඩ, බදුල්ල	259,344.00				
අංක 29 ඊ, හංවැල්ල පාර, බදුල්ල	277,200.00				
අංක 37"/1, උයන්වත්ත, හංවැල්ල පාර, බදුල්ල	270,000.00				
අංක 70, බදුලුසිරිගම, බදුල්ල	300,000.00				
අංක 62/1, බදුලුසිරිගම, බදුල්ල	390,000.00				
අංක 03, ස්ප්‍රිංවැලි පාර, බදුල්ල	300,000.00				
අංක 05, ''ලීලසිරි'', 2 කනුව, පස්සර පාර, බදුල්ල	240,000.00				
අංක 47, ස්ප්‍රිංවැලි පාර, බදුල්ල	1,266,840.00				
''සම්පත් සෙවන'', වලව්වවත්ත, රඹුක්පොත	1,344,000.00				
අංක 06 ඣ/13, ජල ටැංකිය පාර, හිඳගොඩ, බදුල්ල	456,000.00				

4.5 ශිෂ්‍යත්ත්ව

4.5.1 2016 වර්ෂයේ මහපොළ ශිෂ්‍යත්ත්ව හා ශිෂ්‍යාධාර පිළිබඳ විස්තර

පීඨය	ඇතුළත් කර ගනු ලැබූ වර්ෂය	ශිෂ්‍ය කාණ්ඩ වර්ෂය	ශිෂ්‍යත්වලාභීන් සංඛ්‍යාව	
			මහපොළ	ශිෂ්‍යාධාර
සත්ත්ව විද්‍යා හා අපනයන කෘෂිකර්ම	2014/2015	**පළමු වසර**	39	89
	2013/2014	**දෙවන වසර**	25	79
	2012/2013	**තෙවන වසර**	61	35
	2011/2012	**සිව්වන වසර**	68	11
විද්‍යා හා තාක්ෂණවේදී	2014/2015	**පළමු වසර**	65	37
	2013/2014	**දෙවන වසර**	53	38
	2012/2013	**තෙවන වසර**	83	14
	2011/2012	**සිව්වන වසර**	72	17
කළමනාකරණ	2014/2015	**පළමු වසර**	52	19
	2013/2014	**දෙවන වසර**	17	62
	2012/2013	**තෙවන වසර**	51	13
	2011/2012	**සිව්වන වසර**	19	31
එකතුව			**605**	**445**

4.5.2 2016 වර්ෂයේ වෙනත් ශිෂ්‍යත්ත්ව පිළිබඳ විස්තර

ශිෂ්‍යත්ත්වයේ නම	පීඨය	ශිෂ්‍යත්වලාභීන් සංඛ්‍යාව
කුලපති ශිෂ්‍යත්ත්වය	සත්ත්ව විද්‍යා හා අපනයන කෘෂිකර්ම	2
	විද්‍යා හා තාක්ෂණවේදී	2
	කළමනාකරණ	2
චීන තානාපති ශිෂ්‍යත්ත්ව - 2016 (එක්වර ගෙවීම)	සත්ත්ව විද්‍යා හා අපනයන කෘෂිකර්ම	2
පරිත්‍යාග භාර ශිෂ්‍යත්ත්ව වැඩසටහන (විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ශිෂ්‍යත්ත්ව අරමුදල / කැත්ලීන් ඩොරිස් වීරසූරිය ශිෂ්‍යත්ත්ව අරමුදල)	විද්‍යා හා තාක්ෂණවේදී	2
ශ්‍රී ලංකා උපාධිධාරී සංගමය (SLGS) මෙල්බෝන් විශ්වවිද්‍යාලය	කළමනාකරණ	2
විදේශ ශිෂ්‍යයකුට පිරිනැමෙන ජනාධිපති ශිෂ්‍යත්ත්වය	විද්‍යා හා තාක්ෂණවේදී	3

5. මානව සම්පත්

5.1 අධ්‍යයන කාර්යය මණ්ඩලය

2016 වර්ෂයේ දී අධ්‍යයන කාර්යය මණ්ඩලයේ එක් එක් සේවක ගණය තුළ සේවය කළ සංඛ්‍යා

පීඨය	මාධ්‍යය	ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරු	මහාචාර්යවරු	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරු - I හා II ශ්‍රේණි	කථිකාචාර්යවරු	කථිකාචාර්යවරු (පරිවාස)	තාවකාලික කථිකාචාර්යවරු/ පදිංචිකරුවරු
සත්ත්ව විද්‍යා හා අපනයන කෘෂිකර්ම	ඉංග්‍රීසි	-	-	19	4	31	20
විද්‍යා හා තාක්ෂණවේද		-	2	16	-	21	34
කළමනාකරණ	සිංහල/ දමිළ/ ඉංග්‍රීසි	-	-	10	4	9	9
පුස්තකාලය		-	-		-	4 (සහකාර පුස්තකාලයාධිපති/නි වරු, පැවරුම් පදනම මත - 1)	-
එකතුව		**-**	**2**	**45**	**8**	**65**	**63**

5.2 පරිපාලන කාර්යය මණ්ඩලය

2016 වර්ෂයේ දී පරිපාලන කාර්යය මණ්ඩලයේ එක් එක් සේවක ගණය තුළ සේවය කළ සංඛ්‍යා

සේවක ගණය	අනුමත සේවක පිරිස	තථ්‍ය සේවක පිරිස	සටහන්
ලේඛකාධිකාරී	1	1	පැවරුම් පදනමින්
මූල්‍යාධිකාරී	1	1	--
ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී	7	6	ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරීවරුන් වෙනුවට සහකාර ලේඛකාධිකාරීවරුන් 5 දෙනෙක් ද ඇතුළුව
ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී	4	4	ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරීවරුන් වෙනුවට සහකාර මූල්‍යාධිකාරීවරයෙක් ද ඇතුළුව
ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණක	1	-	පුරප්පාඩු වී ඇත.
කාර්යය ඉංජිනේරු	1	1	--
ප්‍රධාන ආරක්ෂක නිලධාරි (කොන්ත්‍රාත් පදනම)	1	1	--
ප්‍රධාන මාෂල්	1	-	පුරප්පාඩු වී ඇත.
අධ්‍යක්ෂ - ශාරීරික අධ්‍යාපන	1	1	--
උප කුලපතිතුමාගේ පුද්ගලික ලේකම්	1	-	පුරප්පාඩු වී ඇත.
විශ්වවිද්‍යාලීය වෛද්‍ය නිලධාරී	2	1	පුරප්පාඩු වී ඇත.(1)
පූර්ණ කාලීන නේවාසිකාගාර පාලක	1	-	අධ්‍යයන නේවාසිකාගාර පාලක විසින් ආවරණය කෙරේ.
එකතුව	**22**	**16**	

5.3 අධ්‍යයන උපකාරක සහ අනධ්‍යයන කාර්යය මණ්ඩලය

2016 වර්ෂයේ දී අනධ්‍යයන හා අධ්‍යයන උපකාරක කාර්යය මණ්ඩලයේ එක් එක් සේවක ගණය තුළ සේවය කළ සංඛ්‍යා

සේවක ගණය	අනුමත සේවක පිරිස	තථ්‍ය සේවක පිරිස
ක්‍රම ලේඛක හා පද්ධති විශ්ලේෂක	2	2
ශාරීරික අධ්‍යාපනය පිළිබඳ උපදේශක	2	2
උපදේශක (පරිගණක තාක්ෂණවේදය)	4	0
උප පාලක (පූර්ණ-කාලීන)	4	4
මාෂල්	1	0
සුපරීක්ෂක (සිවිල්)	1	1
විගණන සහකාර	1	0
පොත් තබන්නා	1	1
ඖෂධවේදී	1	1
හෙද නිළධාරී/ හෙදිය	2	1
තාක්ෂණික නිළධාරී	16	9
පරිගණක යෙදුම් සහකාර	27	21
ලඝුලේඛක (ඉංග්‍රීසි)	5	5
දුරකථන ක්‍රියාකරු හා පිළිගැනීමේ නිළධාරී	2	2
පුස්තකාල සහකාර	3	3
සරප්	2	2
ලිපිකරු	6	5
ගබඩා භාරකරු	2	1
ආරක්ෂක නියාමක	1	0
ගොවිපල සුපරීක්ෂක	1	0
ආගන්තුක නිවාස භාරකරු	3	0
කම්කරු	4	3
විදුලි කාර්මික ශිල්පී	1	0
ජලනල ශිල්පී	1	0
වඩු කාර්මික ශිල්පී	1	0
වැද්දුම් ශිල්පී	1	0
සාත්තු සේවක (සෞඛ්‍ය සේවා)	1	0
පර්යේෂණාගාර පරිවාර සේවක	13	10
රියැදුරු	2	0
එකතුව	**111**	**73**

5.4 උපකාරක කාර්යය මණ්ඩල ව්‍යාප්තිය

පීඨය/ ශාඛාව	ජ්‍යෙෂ්ඨ කාර්යය මණ්ඩලය	කනිෂ්ඨ කාර්යය මණ්ඩලය	සුළු සේවකයෝ
උප කුලපතිතුමාගේ කාර්යාලය	--	2	--
ලේඛකාධිකාරීතුමාගේ කාර්යාලය	--	2	1
මූල්‍යාධිකාරීතුමාගේ කාර්යාලය	--	1	--
සත්ත්ව විද්‍යා හා අපනයන කෘෂිකර්ම පීඨය	1	7	5
විද්‍යා හා තාක්ෂණවේද පීඨය	1	3	7
කළමනාකරණ පීඨය	--	2	--
ශිෂ්‍ය කටයුතු අංශය	1	6	--
මානව සම්පත් අංශය	--	3	--
පොදු පරිපාලන අංශය	--	3	--
විභාග අංශය	--	4	--
ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණක	--	1	--
මූලධන කාර්යය අංශය	--	1	--
ප්‍රසම්පාදන අංශය	2	2	--
ගෙවුම් අංශය	--	2	--
වැටුප් අංශය	--	3	--
වාර්තාකරණ අංශය	--	2	--
නඩත්තු අංශය	--	1	--
පුස්තකාලය	1	3	--
වෛද්‍ය මධ්‍යස්ථානය	--	2	--
එකතුව	**6**	**50**	**13**

6. පර්යේෂණ හා සංවර්ධනය

6.1 පර්යේෂණ, නව්‍යකරණ හා ප්‍රකාශන

විෂයය	ප්‍රකාශිත	වාණිජකරණය කරන ලද	ඉදිරිපත් කරන ලද
පර්යේෂණ අධ්‍යයන සංඛ්‍යාව	247	02	14
නව්‍යකරණ/ නිපැයුම් සංවර්ධන සංඛ්‍යාව	10	--	05
සඟරා ලිපි සංඛ්‍යාව	63	01	--
ග්‍රන්ථ/ පරිච්ඡේද සංඛ්‍යාව	9	--	--
උධෘත සංඛ්‍යාව	237	--	71
පෝස්ටර් සංඛ්‍යාව	6	--	--
එකතුව	**572**	**03**	**90**

6.2 වැඩ සටහන්, සම්මන්ත්‍රණ හා වැඩ මුළු

විෂයය	සහභාගි වූ/ පිරිනමනු ලැබූ සංඛ්‍යාව	සම්පූර්ණ කරන ලද සංඛ්‍යාව	ඉදිරිපත් කරන ලද සංඛ්‍යාව
උපාධි වැඩ සටහන් සංඛ්‍යාව	9	--	--
සහතික පත්‍ර වැඩ සටහන් සංඛ්‍යාව	3	--	--
ප්‍රජා සේවා සම්පාදන වැඩ සටහන් සංඛ්‍යාව	31	25	01
කාර්යය මණ්ඩල සංවර්ධන සම්මන්ත්‍රණ හා වැඩ මුළු සංඛ්‍යාව	13	06	01
එකතුව	**56**	**31**	**02**

6.3 ලැබූ සම්මාන පිළිබඳ විස්තර

විෂයය	සම්මාන සංඛ්‍යාව	විද්වතුන් සංඛ්‍යාව	ශිෂ්‍යය සංඛ්‍යාව
දේශීය සම්මාන	26	13	--
ජාත්‍යන්තර සම්මාන	10	07	--
එකතුව	**36**	**20**	**--**

7. මූල්‍ය හා විගණනය

7.1 පුනරාවර්තන වියදම්

විෂයය	අයවැය - 2016 තථ්‍ය (රුපියල්)	තථ්‍ය - 2016 (රුපියල්)	%	අයවැය - 2015 (රුපියල්)	තථ්‍ය - 2015 (රුපියල්)	%
අ. පුද්ගල පඩිනඩි	364,220,000	293,374,721	81	222,163,000	213,723,414	96
ආ. ගමන් හා යැපුම්	3,540,000	4,107,564	116	1,958,000	1,004,694	51
ඇ. සැපයුම්	27,172,000	17,813,031	66	24,842,000	10,315,367	42
ඈ. නඩත්තුව	16,092,000	7,548,370	47	10,991,000	3,659,271	33
ඉ. ගිවිසුම්ගත සේවා	148,480,000	114,571,747	77	153,444,000	108,599,062	71
ඊ. වෙනත් පුනරාවර්තන වියදම්	78,496,000	40,469,426	52	53,602,000	27,172,161	51
එකතුව	**638,000,000**	**477,884,859**	**75**	**467,000,000**	**364,473,969**	**78**

7.2 ප්‍රාග්ධන වියදම්

විෂයය	අයවැය - 2016 තථ්‍ය (රුපියල්)	තථ්‍ය - 2016 (රුපියල්)	%	අයවැය - 2015 (රුපියල්)	තථ්‍ය - 2015 (රුපියල්)	%
අ. ඉඩම් හා ඉඩම් දියුණු කිරීම	-	52,979,553	-	-	50,000	
ආ. ගෘහ භාණ්ඩ හා වෙනත් උපකරණ අත්කර ගැනීම	218,494,000	70,780,337	63	51,000,000	16,872,165	78
ඇ. යන්ත්‍රෝපකරණ අත්කර ගැනීම		67,123,476			23,078,162	
ඈ. ගොඩනැගිලි හා ව්‍යුහ අත්කර ගැනීම	310,676,000	349,381,044	130	163,500,000	129,212,005	79
ඉ. වෙනත්	70,830,000	14,783,082	21	45,500,000	6,507,281	14
එකතුව	**600,000,000**	**555,047,492**	**93**	**260,000,000**	**175,719,613**	**68**

7.3 ව්‍යාපෘති (විදේශීය/දේශීය අරමුදල් සම්පාදිත)

නම හා විස්තර	ණය/ ප්‍රදානය (රුපියල් මිලියන)	අරමුදල් සම්පාදක නියෝජිතායතනය #	මුළු පිරිවැය ඇස්තමේන්තුව (රුපියල් මිලියන)	ලියාපදිංචි අරමුදල් ආයතන (රුපියල් මිලියන)	ආධාරදායක අරමුදල් (රුපියල් මිලියන)
ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය පිහිටුවීමේ ව්‍යාපෘතිය අදියර 1 හා 2	-	-	3,420.00	-	✓
එකතුව	-	-	**3,420.00**	-	-

7.4 ව්‍යාපෘති වියදම් (දේශීය/ විදේශීය අරමුදල් සම්පාදිත)

නම	මුළු පිරිවැය ඇස්තමේන්තුව (රුපියල් මිලියන)	2016 වියදම (රුපියල් මිලියන)	2015 වියදම (රුපියල් මිලියන)	2016.12.31 දිනට සමුච්චිත වියදම	භෞතික ප්‍රගතියේ ප්‍රතිශතය (%)
ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය පිහිටුවීමේ ව්‍යාපෘතිය අදියර 1 හා 2	3,420.00	84.36	122.87	2,113.60	70%
එකතුව	3,420.00	84.36	122.87	2,113.60	70%

7.5 මූල්‍ය ප්‍රගතිය (වියදම)

විෂයය	2016 ප්‍රතිපාදනය	2016 තුළ වියදම	%
අ. ව්‍යාපෘතිය නොවන පුනරාවර්තන වියදම	638,000,000	471,885,516	74
ආ. ව්‍යාපෘතිය නොවන මූලධන වියදම	323,226,000	182,483,247	56
ඇ. ව්‍යාපෘතිය - දේශීය අරමුදල්	276,774,000	84,356,154	30
ඈ. ව්‍යාපෘතිය - විදේශීය අරමුදල්	-	-	
එකතුව	**1,238,000,000**	**738,724,917**	**60**

7.6 මූල්‍ය ප්‍රගතිය (උත්පාදිත ආදායම)

ආදායම් මූලාශ්‍රය	අයවැය - 2016 (රුපියල්)	තථ්‍ය - 2016 (රුපියල්)	අයවැය - 2015 (රුපියල්)	තථ්‍ය - 2015 (රුපියල්)	අයවැය - 2014 (රුපියල්)	තථ්‍ය - 2014 (රුපියල්)	අයවැය - 2013 (රුපියල්)	තථ්‍ය - 2013 (රුපියල්)	අයවැය - 2012 (රුපියල්)	තථ්‍ය - 2012 (රුපියල්)	අයවැය - 2011 (රුපියල්)	තථ්‍ය - 2011 (රුපියල්)
අ. ප්‍රථම උපාධි අධ්‍යයනය (නේවාසිකාගාර හා ලියාපදිංචි කිරීමේ ගාස්තු ආදිය)	9,311,000	9,917,940	7,550,000	6,945,607	14,550,000	11,809,344	6,330,000	13,191,742	8,200,000	8,593,589	4,551,000	7,219,783
ආ. පශ්චාත් උපාධි අධ්‍යයනය	-	-	-	-	-	-	-	-	-	-	-	-
ඇ. විශේෂඥ උපදේශකත්වයන් (පුහුණුව" විභාග හා වෙනත්)	30,733,000	4,405,747	6,450,000	1,134,312	450,000	343,400	3,315,000	553,000	2,100,000	1,791,277	4,544,000	1,129,745
ඈ. වෙනත්	-	-	-	-	-	-	-	-	-	-	-	941,965
එකතුව	**40,044,000**	**14,323,687**	**14,000,000**	**8,079,919**	**15,000,000**	**12,152,744**	**9,645,000**	**13,744,742**	**10,300,000**	**10,384,866**	**9,095,000**	**9,291,493**

7.7 මූල්‍ය ප්‍රගතිය - 2016

විෂයය	සූත්‍රය	එක් එක් ශිෂ්‍යයකු සඳහා වියදම (රුපියල්)					
		2016	2015	2014	2013	2012	2011
අ. එක් ශිෂ්‍යයකු හෝ ශිෂ්‍යාවක සඳහා පුනරාවර්තන වියදම	මුළු පුනරාවර්තන වියදම / ශිෂ්‍යය සංඛ්‍යාව	338,719	272,748	240,948	139,942	125,392	103,410
ආ. එක් ශිෂ්‍යයකු හෝ ශිෂ්‍යාවක සඳහා මූලධන වියදම	මුළු මූලධන වියදම / ශිෂ්‍යය සංඛ්‍යාව	130,420	89,810	83,282	42,341	101,258	120,696

7.8 යටිතල පහසුකම් - 2016

යටිතල පහසුකම් පිළිබඳ විස්තර	වියදම (රුපියල්)	භෞතික ප්‍රගතිය
අ. සනාතන ගොඩනැගිල්ල	31,352,457	100%
ආ. භූමි අලංකරණය - සනාතන ගොඩනැගිල්ල	6,042,359	100%
ඇ. ක්‍රීඩා මධ්‍යස්ථානය	29,370,106	100%
ඈ. ක්‍රීඩා මණ්ඩපය	1,406,040	100%
ඉ. වැසි ජලාපවහන පද්ධතිය	1,774,568	100%
එකතුව	**69,945,530**	

7.9 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

	සටහන	2016 රුපියල්	2015 රුපියල්
වත්කම්			
ප්‍රංගම වත්කම්			
මුදල් හා මුදල් සම දේ	01	41,230,251	36,258,132
ආයෝජන	02	21,223,591	18,152,475
අයවිය යුතු දේ	03	23,107,408	14,665,875
පරිලේඛන තොග	04	35,908,679	7,368,400
අත්තිකාරම්	05	406,974	268,131
		121,876,903	**76,713,012**
ප්‍රංගම නොවන වත්කම්			
අයවිය යුතු දේ	06	5,700,839	5,872,383
දේපළ, පිරියත හා උපකරණ	07	1,767,403,374	1,421,626,674
සිදු කෙරෙමින් ඇති කාර්යයන්	08	-	290,865,005
ඉඩම් හා ඉඩම් වැඩිදියුණු කිරීම	09	111,395,952	58,416,399
ගුණාත්මකතා වර්ධන ව්‍යාපෘති	10	9,161,877	4,610,855
		1,893,662,043	**1,781,391,317**
මුළු වත්කම්		**2,015,538,945**	**1,858,104,329**
බැරකම්			
ප්‍රංගම බැරකම්			
උපචිත වියදම්	11	34,895,227	22,244,523
විවිධ ණයහිමියෝ හා වෙනත්	12	76,744,952	85,484,192
වියදම් නොකළ ප්‍රදානය		22,548,650	30,695,456
		134,188,828	**138,424,171**
ප්‍රංගම නොවන බැරකම්			
විලම්බිත ආදායම	13	288,919,570	165,605,191
පාරිතෝෂිකය සඳහා ප්‍රතිපාදනය	14	15,183,379	9,396,706
		304,102,950	**175,001,897**
මුළු බැරකම්		**438,291,778**	**313,426,067**
ශුද්ධ වත්කම්		**1,577,247,167**	**1,544,678,262**
ස්කන්ධ හා සංචිත			
සමුච්චිත අරමුදල	15	2,147,937,123	2,063,580,969
පොදු සංචිතය	16	(610,077,413)	(548,520,929)
විශේෂ සංචිතය	17	7,399,112	1,990,995
වෙනත් අරමුදල්	18	31,988,345	27,627,227
මුළු ශුද්ධ වත්කම්/ ස්කන්ධ		**1,577,247,167**	**1,544,678,262**

7.10 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය කාර්යය සාධනය පිළිබඳ ප්‍රකාශය

	සටහන	2016 රුපියල්	2015 රුපියල්
ආදායම			
පුනරාවර්තන ප්‍රදාන	19	477,500,000	343,371,000
ශිෂ්‍යාධාර හා මහපොල ප්‍රදාන	20	55,058,350	30,256,550
ස්වයං මූල්‍ය වැඩ සටහන් ආදායම	21	4,405,747	1,134,312
වෙනත් ආදායම	22	14,202,090	12,503,307
ක්‍රමක්ෂිත මූලධන ප්‍රදාන	23	64,370,645	49,166,033
මුළු ආදායම		**615,536,831**	**436,431,202**
වියදම්			
පුද්ගල පඩිනඩි	24	293,374,721	213,723,414
ගමන් හා යැපුම් වියදම්	25	4,17,564	1,004,694
සැපයුම්	26	17,813,031	10,315,367
නඩත්තුව	27	7,548,370	3,659,271
ගිවිසුම්ගත වියදම	28	114,571,747	108,599,062
වෙනත් පුනරාවර්තන වියදම්	29	40,469,426	27,172,161
ස්වයං මූල්‍ය වැඩ සටහන් වියදම්	30	3,451,957	600,410
ශිෂ්‍යාධාර හා මහපොල ගෙවීම්	31	55,058,350	30,256,550
ක්ෂය	32	160,075,552	138,765,610
මුළු වියදම්		**696,470,717**	**534,096,538**
වර්ෂය සඳහා අතිරික්තය/ (ඌණතාව)		**(80,933,886)**	**(97,665,336)**

7.11 2016 දෙසැම්බර් 31 දිනට මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	2016 රුපියල්	2015 රුපියල්
මෙහෙයුම් ක්‍රියාකාරකම් වෙතින් මුදල් ප්‍රවාහ		
සාමාන්‍ය ක්‍රියාකාරකම් වෙතින් හිඟය/අතිරික්තය	(80,933,886)	(97,665,336)
ගැලපුම්		
පෙර වර්ෂය ආශ්‍රිත ලැබීම්	745,392	
මුදල් නොවන සංචල		
ක්‍රමක්ෂිත මූලධන ප්‍රදාන	(64,370,645)	(49,166,033)
ක්ෂය	160,075,552	138,765,610
ප්‍රතිපාදන හා වෙනත්	6,088,013	1,673,792
කාරක මූලධන වෙනස්වීම් වලට පෙර මෙහෙයුම් ලාභය	21,604,425	(6,391,968)
කාරක මූලධනයේ වෙනස්වීම්		
අයවිය යුතු දේ (ප්‍රංගම වත්කම්) (වැඩි)/ අඩු වීම	(8,441,533)	(4,201,373)
අයවිය යුතු දේ (ප්‍රංගම නොවන වත්කම්) (වැඩි)/ අඩු වීම	171,544	545,504
පරිලේඛන වල (වැඩිවීම)/ අඩුවීම	(14,534,348)	(4,206,090)
අත්තිකාරමෙනි (වැඩිවීම)/ අඩුවීම	(138,843)	(154,387)
උපචිත වියදම් වල වැඩිවීම/ (අඩුවීම)	12,650,704	5,631,313
විවිධ ණයහිමියන් වැඩිවීම/ (අඩුවීම)	(6,844,710)	(2,435,824)
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් ප්‍රවාහ	**4,467,238**	**(11,212,825)**
ආයෝජන ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහ		
ස්ථාවර වත්කම් අත්කර ගැනීම	(261,590,592)	(175,683,099)
ආයෝජන	(3,071,116)	(5,597,667)
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් ප්‍රවාහ	**(264,661,707)**	**(181,280,767)**
මූල්‍යකරණ ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහ		
සම්චිචිත අරමුදල	84,356,154	122,869,919
විලම්බිත ආදායම	186,490,653	86,445,081
වියදම් නොකළ ප්‍රදාන - ප්‍රාග්ධන	(8,146,807)	-
වෙනත් අරමුදල්	2,466,588	10,910,718
මූල්‍යකරණ ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් ප්‍රවාහ වීම්	**265,166,588**	**220,225,718**
මුදල් හා මුදල් සමාන දේහි ශුද්ධ වැඩිවීම/ (අඩුවීම)	**4,972,119**	**27,732,126**
කාලපරිච්ඡේදය ආරම්භයේ දී මුදල් හා මුදල් සමාන දේ	**36,258,132**	**8,526,006**
කාලපරිච්ඡේදය අවසානයේ දී මුදල් හා මුදල් සමාන දේ	**41,230,251**	**36,258,132**

සටහන - 2016.12.31 දිනට බැංකු ශේෂය

බැංකුව	ගිණුම් අංකය	රුපියල්
ලංකා බැංකුව	3114820	22,548,650
ලංකා බැංකුව	3114820	2,741,541
ලංකා බැංකුව	78166821	7,003,851
ලංකා බැංකුව	78057047	5,729,960
මහජන බැංකුව	10100168384805	3,206,250
එකතුව		**41,230,251**

7.12 විගණකාධිපති වාර්තාව

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } යූවිපි/බීඩී/ඩී/යුඩබ්ලූ/1/16/0 | ඔබේ අංකය / உமது இல. / Your No. } | දිනය / திகதி / Date } 2017 අගෝස්තු 31 දින.

උපකුලපති
ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය.

ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108(1) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.

ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උප වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) උප වගන්තිය ප්‍රකාර විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. විශ්වවිද්‍යාල පනතේ 108(2) උපවගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් විශ්වවිද්‍යාලයේ උපකුලපති වරයා වෙත 2017 ජූනි 14 දින නිකුත් කරන ලදී.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, . - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 111 වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

(59)

2. මූල්‍ය ප්‍රකාශන

2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 02

විශේෂ අරමුදල් වල ආයෝජන රු.2,466,588 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලායාමක් ලෙස දැක්විය යුතු වුවත් එය මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලා ඒමක් ලෙස දක්වා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07

ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීව කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.114,325,384 ක්වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 09

ප්‍රමිතයේ 15 ඡේදය අනුව තොගය පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගය මත ගිණුම් ගතකර නොතිබුණු අතර 44 ඡේදය ප්‍රකාරව කාල පරිච්ඡේදයේ වියදමක් ලෙස හඳුනාගත් තොගවල අගය මූල්‍ය ප්‍රකාශනවලින් හෙළිදරව් කර නොතිබුණි.

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

රාජ්‍ය ප්‍රදාන යටතේ මිලදී ගන්නා සියළුම ප්‍රාග්ධන වත්කම් ඒවායේ ප්‍රයෝජනවත් ජීවිත කාලය පදනම් කරගෙන විලම්භීත ආදායමක් ලෙස ගිණුම්ගත කරන ආකාරයට ගිණුම්කරණ ප්‍රතිපත්තිය හඳුනාගෙන තිබුණද රාජ්‍ය ප්‍රාග්ධන ප්‍රදාන යටතේ ඉදිකර තිබුණු ගොඩනැගිල්ල සඳහා සමාලෝචිත වර්ෂයේ ක්ෂය රු.85,472,880 ක් වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණද එය ආදායම් ලෙස ගිණුම් ගත කර නොතිබුණි.

2.2.3 පැහැදිලි නොකල වෙනස්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ අවසානයට මූල්‍ය ප්‍රකාශන අනුව ලිපි ද්‍රව්‍ය තොගය රු.9,558,694 ක් වුවද භාණ්ඩ සමීක්ෂණ වාර්තාවට අනුව එය රු.6,897,511 ක් වුයෙන් රු.2,691,183 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශන අනුව මෘදුකාංග මිල දී ගැනීම රු.2,697,146 ක් වුවද ස්ථාවර වත්කම් ලේඛනයේ එය රු.970,000 ක් ලෙස දැක්වීමෙන් රු. 1,727,146 ක වෙනසක් නිරීක්ෂණය විය.

2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත දැක්වෙන ගිණුම් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවිය.

ගිණුම් විෂයය	වටිනාකම	ඉදිරිපත් නොකළ සාක්ෂි
	රු.	
ලැබිය යුතු ගිණුම් - පුනරාවර්තන	20,063,117	ශේෂ සනාථන ලිපි
ගෙවිය යුතු ගිණුම් - පුනරාවර්තන	4,629,328	කාල විශ්ලේෂණ
ගෙවිය යුතු ගිණුම් - ප්‍රාග්ධන	18,466,392	

2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට වර්ෂ 02 ඉක්මවූ විවිධ ඉදිකිරීම්, සැපයුම් හා සේවා ලබා ගැනීමේදී රැඳවුම් ගාස්තු රු.31,716,010 ක් විගණන දිනය වූ 2017 අප්‍රේල් 30 වනවිටත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශනවල ලැබිය යුතු ගිණුම් යටතේ 2014 වර්ෂයේ ආරම්භක ශිෂ්‍යාධාර මුදල් ශේෂයේ වෙනස ලෙස දක්වා තිබූ රු.443,771 ක් හා මහපොල ශිෂ්‍යත්ව මුදල් රු.84,050 ක ඍණ ශේෂය සමාලෝචිත වර්ෂයේදී ද නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

පහත සඳහන් අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

නීති රීති,රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම්
(අ) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 37(1) වගන්තිය	නියමාවලි මගින් සංයුතිය නියමකර තෝරා ගැනීම් කමිටුවක නිර්දේශය මත පාලක සභාව විසින් විශ්වවිද්‍යාලයක ලේඛකාධිකාරිවරයා පත්කළ යුතු නමුත් 2014 නොවැම්බර් 12 දින සිට මේ දක්වා කාර්ය පැවරුම් පදනම මත විශ්‍රාමික නිලධාරියෙකු එම තනතුර සඳහා පත්කර තිබුණි.
(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
(i) මුදල් රෙගුලාසි 396 (ඇ)	2017 මාර්තු 31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශයට අනුව නිකුත් කළ නමුත් බැංකුවට ඉදිරිපත් නොවූ මාස 06 ඉක්මවූ, එකතුව රු.69,612 ක්වූ චෙක්පත් 27 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ii) මුදල් රෙගුලාසි 757(2)	සමාලෝචිත වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණ වාර්තාව 2017 අප්‍රේල් 30 දින වන විටත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.
(iii) මුදල් රෙගුලාසි 772	වටිනාකම රු.584,566 ක්වූ කල් ඉකුත් වූ මුද්‍රණ තීන්ත ඒකක 92 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඇ) රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.2 ඡේදය	විශ්වවිද්‍යාලය ප්‍රධාන මෙහෙයුම් ක්ෂේත්‍ර ආවරණය වන පරිදි මෙහෙයුම් අත්පොත් පිළියෙල කර නොතිබුණි.

(ඈ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ

2013 අගෝස්තු 29 දිනැති අංක 12/2013 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිවරයාගේ ආයතනික චක්‍රලේඛය	ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ට භිමි නිවාසවල පදිංචි නිලධාරීන්ගෙන් නිවාස කුලී චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කුලී අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

03. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රතිඵලය රු.80,933,886 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.97,665,336 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචික වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.16,731,450 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව පුනරාවර්තන වියදම් සඳහා රජයෙන් ලැබුණු ප්‍රතිපාදනය රු.134,129,000 කින් වැඩිවීම ඉහත වර්ධනය කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි..

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා මූල්‍ය ඌනතාවයක් ඇති වී තිබුණි. කෙසේ වුවද, මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික රජයට ගෙවූ බදු හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය නැවත ගැලපීමේදී 2012 වර්ෂයට සාපේක්ෂව 2013 වර්ෂයේ දායකත්වය අඩු වී තිබුණි. කෙසේ වුවද, 2013 වර්ෂයේදී රු.113,423,662 ක්වූ දායකත්වය සමාලෝචිත වර්ෂයේදී රු.372,516,387 ක් දක්වා වර්ධනය වී තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විශ්වවිද්‍යාලය විසින් 2016 වර්ෂය සඳහා පිළියෙල කර තිබූ ක්‍රියාකාරී සැලැස්මේ ළඟා කර ගැනීමට අපේක්ෂිත උපාය මාර්ග අරමුණු 06 ක් දක්වා තිබූ අතර මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) විශ්වවිද්‍යාලය විසින් 2005/2006 සිට 2010/ 2011 කාලපරිච්ඡේදය තුළ බඳවාගනු ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව 2257 ක්වූ අතර උපාධිය ලබා පිටවූ ශිෂ්‍ය සංඛ්‍යාව 1840 ක් වුයෙන් එම ප්‍රමාණය ලියාපදිංචි මුළු ශිෂ්‍ය සංඛ්‍යාවෙන් සියයට 82 ක් පමණක් විය.

(ii) ඉහළ ගුණාත්මක භාවයෙන් යුත් අන්තර්ජාතික මට්ටමේ පාඨමාලා අවම පිරිවැයක් යටතේ හඳුන්වාදීම තුළින් බඳවාගනු ලබන විදේශීය ශිෂ්‍ය සංඛ්‍යාව ඉහළ නංවා ගැනීම අරමුණක් වී තිබුණද 2016 වර්ෂයේදී එක් විදේශීය ශිෂ්‍යයෙක් පමණක් බඳවාගෙන තිබුණි.

(iii) සමාලෝචිත වර්ෂය සඳහා උපාධි පාඨමාලා 13 ක් සඳහා සිසුන් 820 ක් බඳවාගත යුතු නමුත් සිසුන් 666 දෙනෙකු පමණක් බඳවාගෙන තිබුණි. ඒ අනුව අපේක්ෂිත ශිෂ්‍ය සංඛ්‍යාවෙන් 154 ක් අඩුවෙන් ඇතුළත් කර ගැනීම තුළින් සම්පූර්ණ ධාරිතාව උපයෝජනය කර ගැනීමට විශ්වවිද්‍යාලය අපොහොසත් වී තිබුණි.

(iv) ලෝක ශ්‍රේණිගත කිරීම සහ ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම අනුව (Web of Universities Ranking) 2015 වර්ෂයේදී ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය පිළිවෙලින් 15362 ස්ථානයේ සහ 20 ස්ථානයේ පැවති අතර 2017 අප්‍රේල් වන විට පිළිවෙලින් 10911 හා 09 වන ස්ථානයට පත්වී තිබුණි.

(v) විශ්වවිද්‍යාල වෙබ් අඩවියේ 2014,2015 වර්ෂවල වාර්ෂික වාර්තා ඇතුළත්ව යාවත්කාලීන කර නොතිබුණි.

(ආ) පර්යේෂණ ප්‍රගතිය

විශ්වවිද්‍යාල පර්යේෂණ කමිටුව විසින් 2013 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා පර්යේෂණ ව්‍යාපෘති 27 ක් අනුමත කර ඒ සඳහා රු. 33,397,302 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණි. අනුමත ව්‍යාපෘති අතරින් 2014 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා ව්‍යාපෘති 24 ක් ආරම්භ කර තිබූ අතර ඉන් ව්‍යාපෘති 21 ක් නිමකල යුතු කාලය අවසන් වී තිබුණද 2017 අප්‍රේල් 30 දින වන විටත් කිසිදු ව්‍යාපෘතියක් අවසන් කර නොතිබුණි. තවද එම ව්‍යාපෘති 24 සඳහා වෙන්කල ප්‍රතිපාදනයන්ගෙන් සමාලෝචිත වර්ෂයේ අවසානයට සියයට 23 ක ප්‍රතිපාදන පමණක් උපයෝජනය කර තිබුණි.

4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2008 පෙබරවාරි 10 දිනැති අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 05/0183/035/001 යටතේ විශ්වවිද්‍යාලය ස්ථාපිත කිරීම සඳහා කර්මාන්ත අමාත්‍යාංශයට අයත් ඉඩම අධ්‍යාපන අමාත්‍යාංශය වෙත පවරා ගැනීමට අදාළව ගත් තීරණය අනුව විශ්වවිද්‍යාලයට වෙන්කර තිබුණු හෙක්ටයාර් 30.9667 ක ඉඩම්වල අයිතිය මෙම වාර්තාවේ දිනවන විටත් විශ්වවිද්‍යාලයට නීත්‍යානුකූලව පවරාගෙන නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ විශ්වවිද්‍යාලයීය ආචාර්යවරු සඳහා ලබාදෙන ලද රු.66,072 ක්වූ පුස්තකාල පොත්පත් හා ලේඛන 21 ක් ආපසු භාරදී නොතිබුණු අතර ඒවා ආපසු ගෙන්වා ගැනීම සම්බන්ධයෙන් කළමනාකරණයේ අවධානය යොමු වී නොතිබුණි.

(ඇ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වන ආයතන සංග්‍රහයේ V පරිච්ඡේදයේ 7.6 ඡේදයේ ප්‍රකාරව බැඳුම්කර හා ගිවිසුම් කොන්ත්‍රාත් කඩ කිරීම සම්බන්ධයෙන් 2016 දෙසැම්බර් 31 දින වන විට ආචාර්යවරු දෙදෙනෙකුගෙන් අයවිය යුතු රු.7,659,146 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

4.3 අවධිමත් ගනුදෙනු

විශ්වවිද්‍යාලයට කුලී පදනම මත වාහන සැපයූ සැපයුම්කරුවන් සමග එළඹ තිබූ ගිවිසුමේ කුලී වාහන රියදුරන් සඳහා නවාතැන් පහසුකම් සැපයීමට එකඟ වී නොතිබුණද 2006 වර්ෂයේ සිට නවාතැන් පහසුකම් ලබාදී තිබුණි. ඒ අනුව 2014 වර්ෂයේ අගෝස්තු මාසයේ සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා කුලී පදනම මත ලබාගත් වාහන 11 ක රියදුරන් 11 දෙනෙකු සඳහා ලබාගත් කුලී නිවාසයක් වෙනුවෙන් රු.484,750 ක් සහ විදුලිය හා ජල බිල්පත් සඳහා රු.5,930 ක් විශ්වවිද්‍යාලය මගින් ගෙවා තිබුණි.

4.4 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2010 ජුනි 30 මිලදීගෙන තිබුණු රු.322,560 ක් වටිනා ගිනි ආරක්ෂක සේප්පු 05 ක යතුරු අස්ථානගත වීම හේතුවෙන් 2017 අප්‍රේල් 30 දිනවන විටත් ප්‍රයෝජනයට නොගෙන නිශ්කාර්යව තිබුණි.

(ආ) 2016 සැප්තැම්බර් 23 දින රු.1,645,000 ක් ගෙවා ශිෂ්‍ය ඉගෙනුම් ක්‍රියාකාරකම් වල යෙදවීමේ අරමුණින් මිලදීගෙන තිබුණු ට්‍රැක්ටරය හා නඟුල 2017 මාර්තු 17 විගණිත දිනවන විටත් කිසිදු ප්‍රයෝජනයකට නොගෙන විශ්වවිද්‍යාල භූමියේ ගාල්කොට තිබුණි.

(ඇ) 2012 වර්ෂයේදී ඉංජිනේරු වැඩහල සඳහා මිලදීගෙන තිබුණු රු.14,060,480 ක් වටිනා 3 – Axis CNC යන්ත්‍රය 2013 හා 2014 වර්ෂවලදී කිසිදු කාර්යයකට යොදා ගෙන නොතිබුණු අතර 2015 වර්ෂයේ සිට විගණිත දිනය වූ 2017 අප්‍රේල් 30 දින වනවිටත් ප්‍රායෝගික ක්‍රියාකාරකම් 05 ක් සඳහා පැය 46 ½ ක් පමණක් යොදාගෙන තිබුණි.

(ඈ) අවශ්‍යතාවය සලකා බැලීමකින් තොරව මිලදී ගැනීම හේතුවෙන් 2017 ජුනි 17 දින වන විට 2014 හා 2015 වර්ෂවලදී මිලදී ගෙන තිබූ A3 වර්ගයේ කාඩ්දාසි පැකට් 1306 ක් නිෂ්කාර්යව ගබඩාවේ පැවතුණි.

52
AGDSL
විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் நாயகம் அதிபதி திணைக்களம்
Auditor General's Department

4.5 අරමුදල් ඌන උපයෝජනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඌව කර්මාන්ත කේන්ද්‍රීය අරමුදල, උපකුලපති අරමුදල සහ සුභ සාධක අරමුදල්හි එකතුව රු.3,340,990 ක් සමාලෝචිත වර්ෂය දක්වා ප්‍රයෝජනයට නොගැනීම නිසා අදාළ අරමුදල් වලින් එම අරමුදල් පිහිටුවීමේ අරමුණු ඉටු වී නොමැති බව නිරීක්ෂණය විය.

(ආ) සුභ සාධන අරමුදල රු.177,364 ක් හා විශේෂ අවශ්‍යතා අරමුදල රු.1,894,530 ක් ආයෝජනය නොකිරීමෙන් එම අරමුදලට ලැබෙන පොළී ආදායම අහිමි වී ගොස් තිබුණි.

4.6 ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ 01 වන අදියර යටතේ 2006 වර්ෂයේ රු.මිලියන 350 ක් වටිනා ගොඩනැගිලි ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව නිර්මාණය කර ඉදිකිරීම් ක්‍රමයට ඉටු කිරීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් මධ්‍යම ඉංජිනේරුමය කාර්යාංශයට පවරා දී තිබුණි. 2007 වර්ෂයේදී නැවත එම කොන්ත්‍රාත්තුව මිණුම් කර ගෙවීමේ ක්‍රමය යටතේ විශ්වවිද්‍යාලය විසින් කොන්ත්‍රාත්කරු සමගම නව කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹ තිබුණි. ඒ අනුව නව ගිවිසුමට එළඹීමට අදාළ අනුමැතිය විගණනයට ඉදිරිපත් නොවූ අතර කොන්ත්‍රාත්කරු විසින් කරන ලද ඉල්ලීමකට අනුව නව ගිවිසුමේ කොන්දේසිවලට අනුව මිල විචලන ගණනය කිරීම හේතුවෙන් රු.10,622,507 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.

4.7 කාර්යමණ්ඩල පරිපාලනය

විශ්වවිද්‍යාලයේ පීඨයන්හි අනුමත මහාචාර්යය තනතුරු 10 ක් හා සත්ත්ව විද්‍යාව හා අපනයන කෘෂිකර්ම පීඨය සහ විද්‍යා හා තාක්ෂණ පීඨය සඳහා අනුමත කථිකාචාර්ය තනතුරු 21 ක් පුරප්පාඩුව පැවති අතර කළමනාකරණ පීඨයේ කථිකාචාර්යවරු 05 ක් අතිරික්තව පැවතුණි. තවද 2006 ජූනි 06 දිනැති අංක 876 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ චක්‍රලේඛය ප්‍රකාරව විශ්වවිද්‍යාලයේ අනධ්‍යයන කාර්යමණ්ඩලයේ පුරප්පාඩු 43 කට නිලධාරීන් බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

5.1 සංයුක්ත සැලැස්ම

2003 ජූනි 02 දිනැති අංක පී.ඊ.ඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.2 ඡේදය පරිදි පූර්ව තෙවර්ෂයෙහි මෙහෙයුම් ප්‍රතිඵල පිළිබඳ සමාලෝචනයක් යටෝක්ත සංයුක්ත සැලැස්මෙහි අන්තර්ගතව නොතිබුණු අතර ඉටු කර ගත යුතු ඉලක්කයන්ගේ මූල්‍ය අගයන් දක්වා නොතිබුණු බැවින් වාර්ෂික ප්‍රගතිය ඇගයීමට හැකි ආකාරයෙන් සංයුක්ත සැලැස්ම ඉදිරිපත් කර නොතිබුණි.

5.2 ක්‍රියාකාරී සැලැස්ම

2014 පෙබරවාරි 17 දිනැති හා අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04 ඡේදය ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්ම වාර්ෂිකව පිළියෙල කළයුතු වුවත් 2016 – 2020 දක්වා වර්ෂ 05කට පිළියෙල කර තිබූ අතර යාවත්කාලීන කල ආයතනයේ සංවිධාන ව්‍යුහය, අනුමත හා තථ්‍ය කාර්ය මණ්ඩල විස්තර එම සැලැස්ම තුළ ඇතුළත් කර නොතිබුණි.

5.3 අභ්‍යන්තර විගණනය

ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණන නිලධාරීන් දෙදෙනෙකු ඇතුළුව නිළධාරීන් තිදෙනෙකුගෙන් සමන්විත අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා තිබුණ ද ස්ථිර ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණකවරයෙකු බඳවා ගෙන නොතිබුණි.

5.4 ප්‍රසම්පාදන සැලැස්ම

2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 ප්‍රකාරව ප්‍රසම්පාදන සැලැස්ම යාවත්කාලීන කර නොතිබුණි.

5.5 අයවැය ලේඛනමය පාලනය

ඇස්තමේන්තුගත වියදම්, තථ්‍ය වියදම් සමග සැසඳීමේදී පුනරාවර්තන වැය විෂයයන් 07 ක සියයට 24 සිට සියයට 113 දක්වා සහ ප්‍රාග්ධන වැය විෂයයන් 07 ක සියයට 14 සිට සියයට 341 දක්වා වූ සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා වරින්වර විශ්වවිද්‍යාලයේ උපකුලපති වෙත දැනුම් දෙන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් පිළිබඳව විශේෂ අවධානය යොමුකළ යුතුවේ.

පද්ධති හා පාලන ක්ෂේත්‍ර	නිරීක්ෂණ
(අ) ගිණුම්කරණය	ගිණුම්කරණ ප්‍රමිති අනුගමනය නොකිරීම, ගිණුම්කරණ අඩුපාඩු හා නොසැසඳු ගිණුම් පැවතීම.
(ආ) වත්කම් කළමනාකරණය	ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය නොකිරීම, ස්ථාවර වත්කම් ලේඛන නිසි පරිදි නඩත්තු නොකිරීම.
(ඇ) ගබඩා පාලනය	දුර්වල තොග කළමනාකරණයක් පැවතීම.
(ඈ) කාර්ය මණ්ඩල පරිපාලනය	තනතුරුවල පුරප්පාඩු පැවතීම හා අතිරික්ත සේවකයින් සිටීම

එච්.එම්.ගාමිණී විජේසිංහ
විගණකාධිපති.

7.13 විගණකාධිපති වාර්තාව තුළ මතු කරන ලද කාරණා සඳහා පිළිතුරු

2.2	මූල්‍ය ප්‍රකාශණ පිළිබඳ අදහස් දැක්වීම		
2.2.1	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති		
	විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	වර්තමාන තත්ත්වය
(අ)	විශේෂ අරමුදල් වල ආයෝජන රු.2,466,588 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලායාමක් ලෙස දැක්විය යුතු වුවත්, එය මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලා ඒමක් ලෙස දක්වා තිබුණි.	එකඟ නොවේ. විගණකාධිපති වාර්තාවේ පෙන්වා ඇති පරිදි මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ පෙන්වා ඇති රු.2,466,588 ක් වූ විශේෂ අරමුදල්, ‘‘ආයෝජන ක්‍රියාකාරකම්’’ යටතේ පෙන්විය යුතු බව දක්වා ඇතත්, එම මූලාශ්‍රය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත අංක 02 ට අනුව ‘‘ආයෝජන ක්‍රියාකාරකම්’’ යටතේ පෙන්විය යුතු අයිතමයක් නොවන බව අවධාරණය කරමු. උක්ත ප්‍රමිතියට අනුව ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දැක්විය යුත්තේ එම මුදල් ප්‍රවාහය (ලැබීම් හෝ ගෙවීම්) ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීමකට හෝ විකිණීමකට, ණය උපකරණයක ආයෝජනය , ඉදිරි ගිවිසුමක ප්‍රතිෂ්ඨාවකට සම්බන්ධ වන්නේ නම් පමණි. නමුත් ඉහත විශේෂ අරමුදල් එම වර්ගීකරණයෙන් බැහැර වේ.	විශේෂ අරමුදල් වල ආයෝජන රු.2,466,588 ක් වූ ප්‍රමාණය මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලා ඒමක් ලෙස ද, ආයෝජන ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලා යාමක් ලෙස ද දක්වා ඇත.
(ආ)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 ප්‍රකාරව ජංගම නොවන වත්කම් සඳහා ඵලදායි ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු. 114,325,384 ක් වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තව දුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.	මෙම නිරීක්ෂණය සමඟ එකඟ වෙමි. විශ්වවිද්‍යාලයේ ආරම්භයේ (වර්ෂ 2006) සිට මේ දක්වා ජංගම නොවන වත්කම් ප්‍රත්‍යාගණනයක් හෝ ඒවායේ ජීවිත කාලයන් වාර්ෂිකව සමාලෝචනයක් සිදු කර නැත. මේ වන විට ක්‍රමානුකූල ස්ථාවර වත්කම් ලේඛණය සැකසෙමින් පවතින හෙයින්, එය අවසන් වූ විගසම විශ්වවිද්‍යාලය සතු සියළුම ජංගම නොවන වත්කම් වල ඵලදායි ජීවිත කාලය සමාලෝචනය කිරීමටත් ඒවා ප්‍රත්‍යාගණනය කිරීමටත් කටයුතු කරමි. මෙම විගණන නිරීක්ෂණය අනුව සම්පූර්ණයෙන් ක්ෂය කර ඇති ස්ථාවර වත්කම් වල වටිනාකම රු.81,539,447 ක් ලෙස	ස්ථාවර වත්කම් අංකනය කර නියමිත පරිදි ස්ථාවර වත්කම් ලේඛණය සැකසෙමින් පවතී. ඉන් අනතුරුව වත්කම් ප්‍රත්‍යාගණනය කොට නැවත පොත් වලට ගැනීමට කටයුතු කරනු ලැබේ.

		දක්වා ඇතත්, මූල්‍ය ප්‍රකාශන වලට අදාලව සකස් කල උප ලේඛණය අනුව මෙය රු. 114,325,383.60 කි.	
(ඇ)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 09 හි 15 ඡේදය ප්‍රකාරව තොගය පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගය මත ගිණුම් ගතකර නොතිබුණු අතර 44 ඡේදය ප්‍රකාරව කාල පරිච්ඡේදයේ වියදමක් ලෙස හඳුනාගත් තොගවල අගය මූල්‍ය ප්‍රකාශන වලින් හෙළිදරව් කර නොතිබුණි.	මෙම නිරීක්ෂණය සමඟ එකඟ වෙමි. ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත අංක 9 හි 15 ඡේදය ප්‍රකාරව, තොග පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් වඩා අඩු අගය මත ගිණුම්ගත කල යුතු වුවත්, ඇතැම් අයිතම් වල ශුද්ධ උපලබ්ධි අගය හඳුනා ගැනීමේ දී තිබූ ප්‍රායෝගික අපහසුතා හේතුවෙන් සියළුම තොග අයිතම්, “පිරිවැයට” ගිණුම්ගත කොට ඇත. ඉදිරියේ දී මෙම ගිණුම්කරණ ප්‍රමිතයට අනුකූලව තොග අගය කිරීම සඳහා කටයුතු කරමි.	තොග අයිතමයන්හි අගය පිරිවැයට වඩා අඩු වූ අවස්ථාවේ ඒවායේ ශුද්ධ උපලබ්ධි අගය මත තොග ගණනය කිරීමට 2016 වර්ෂයේ දී අසමත් විය. නමුත් 2017 වර්ෂයේ තොග පිරිවැය හා ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගය මත ගිණුම්ගත කිරීමට කටයුතු කෙරේ.
2.2.2	**ගිණුම්කරණ අඩුපාඩු**		
	රාජ්‍ය ප්‍රදාන යටතේ මිළදී ගන්නා සියළුම වත්කම් ඒවායේ ප්‍ර යෝජනවත් ජීවිත කාලය පදනම් කරගෙන විලම්භීත අදායමක් ලෙස ගිණුම්ගත කරන ආකාරයට ගිණුම්කරණ ප්‍රතිපත්ත්ය හඳුනාගෙන තිබුණ ද රාජ්‍ය ප්‍රග්ධන ප්‍රදාන යටතේ ඉදිකර තිබුණු ගොඩනැගිල්ල සඳහා සමාලෝචිත වර්ෂයේ ක්ෂය රු.85,472,880 ක් වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණ ද එය ආදායම ලෙස ගිණුම් ගත කර නොතිබුණි.	මෙම නිරීක්ෂණය සමඟ එකඟ වෙමි.**(පහත කරුණු වලට යටත්ව)** විශ්වවිද්‍යාලය ස්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ ඉදිකරන ලද ගොඩනැගිලි වල මුළු වටිනාකම, ක්‍රමක්ෂය යටතේ කපාහැරීමක් නොකරන ලෙස 2012 වර්ෂයේ රජයේ විගණන අංශයේ සාමාජිකයන් සමඟ කරන ලද සාකච්ජාවකින් පසුව තීරණය කරන ලද අතර, ඒ අනුව එම ප්‍රතිපත්තියම තවදුරටත් 2012 වර්ෂයේ සිට අඛණ්ඩව 2016 වර්ෂය සඳහා ද යොදා ගෙන ඇත. ඒ අනුව ස්ථාපනය කල ගිණුම්කරණ ප්‍රතිපත්තිය, 2016 වර්ෂයේ මූල්‍ය වාර්ථාවේ පිටු අංක 09 හි ගිණුම්කරණ ප්‍රතිපත්ති යටතේ හෙළිදරව් කර ඇත. ඒ අනුව විගණනයේ දි නිරීක්ෂණය වී ඇති රු. 85,472,880 ක වෙනස තුළ ගොඩනැගිලි වලට අදාල ක්ෂය රු. 85,427,768 ක් ඇතුළත් වී ඇත. ඉතිරිය, එනම් රු .45,112 ක් වූ වෙනස පහත පරිදි සැසඳීම මඟින් පැහැදිලි කරමි.	විශ්වවිද්‍යාලය ස්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ ඉදිකරන ලද ගොඩනැගිලි වල මුළු වටිනාකම, ක්‍රමක්ෂය යටතේ කපා හැරීමක් නොකරන ලෙස 2012 වර්ෂයේ රජයේ විගණන අංශයේ සාමාජිකයන් සමඟ කරන ලද සාකච්ජාවකින් පසුව තීරණය කරන ලද අතර ඒ අනුව එම ප්‍රතිපත්තියම තවදුරටත් අඛණ්ඩව 2016 වර්ෂය සඳහා ද යොදා ගෙන ඇත. ඒ අනුව ස්ථාපනය කල ගිණුම්කරණ ප්‍රතිපත්තිය 2016 වර්ෂයේ මූල්‍ය වාර්තාවේ , පිටු අංක 09 හි ගිණුම්කරණ ප්‍රතිපත්ති යටතේ හෙළිදරව් කර ඇති අතර, ඒ අනුව ගිණුම් පිළියෙල කොට ඇත.

		<table><tr><td>සසැඳීම</td><td></td><td>රු:</td></tr><tr><td>මූල්‍ය ප්‍රකාශන වලට අනුව ක්ෂය වියදම</td><td></td><td>149,843,493</td></tr><tr><td>එකතු කළා (+)</td><td></td><td></td></tr><tr><td>දෙවරක් ගිණුම්ගත කර ඇති ගෘහ භාණ්ඩ ක්ෂය</td><td>121,017</td><td>121,017</td></tr><tr><td></td><td></td><td>149,964,510</td></tr><tr><td>අඩු කළා (-)</td><td></td><td></td></tr><tr><td>ගොඩනැගිලි ක්ෂය</td><td>85,427,768</td><td></td></tr><tr><td>මහහැරී ඇති පුනරුත්ථාපිත ගොඩනැගිලි ක්ෂය</td><td>159,807</td><td></td></tr><tr><td>මහහැරී ඇති කාර්යාල උපකරණ ක්ෂය</td><td>1,150</td><td></td></tr><tr><td>මහහැරී ඇති පර්යේෂණ හා ඉගෙනුම් උපකරණ ක්ෂය</td><td>5,142</td><td></td></tr><tr><td>විගණන නිරීක්ෂණය තුළ පිටපත් කිරීමේ දෝෂ (කාර්යාල උපකරණ)</td><td>30</td><td>(85,593,897)</td></tr><tr><td>මූල්‍ය ප්‍රකාශන තුළ ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය</td><td></td><td>64,370,613</td></tr></table>	
2.2.3	**පැහැදිලි නොකළ වෙනස්කම්**		
(අ)	සමාලෝචිත වර්ෂයේ අවසානයට මූල්‍ය ප්‍රකාශන අනුව ඉතිරි ලිපි ද්‍රව්‍ය තොගය රු. 9,558,694 ක් වුවද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව එය රු. 6,897,511 ක් විය. ඒ අනුව රු. 2,691,183 ක ඌණතාවයක් නිරීක්ෂණය විය.	මෙම නිරීක්ෂණය සමඟ එකඟ වෙමි. 2016.12.31 දිනට, මූල්‍ය වර්තා වල හෙළිදරව් කර ඇති වර්ෂය අග ලිපි ද්‍රව්‍ය තොගයේ වටිනාකම සහ තොග සමීක්ෂණ වාර්ථාව අනුව ලිපි ද්‍රව්‍ය තොගයේ වටිනාකම අතර රු. 2,691,183 ක වෙනසක් (ඌණතාවයක්) නිරීක්ෂණය වුවද, පසුව කරන ලද පරීක්ෂා කිරීම් වල ප්‍රතිඵලයක් ලෙස මෙම වෙනස, රු. 26,289.90 (අතිරික්තයක්) දක්වා අඩු වී ඇත. මෙම වෙනස, අතීත ගිණුම් වර්ෂ වල නොසැසඳු තොග වටිනාකම් වල ප්‍රතිඵලයක් ලෙස හඳුනාගත හැක. මෙම වෙනස විශ්වවිද්‍යාලයේ පාලක සභාවේ අනුමැතිය සහිතව, මූල්‍ය කාර්යය සාධන වාර්තාව තුළ පෙර වර්ෂයට අදාල ගැලපීමක් ලෙස සටහන් කිරීමට බලාපොරොත්තු වෙමි.	2016 වර්ෂයේ දී හඳුනාගත් මූල්‍ය ප්‍රකාශන අනුව ලිපි ද්‍රව්‍ය තොගයේ වටිනාකම හා භාණ්ඩ සමීක්ෂණ වාර්ථාවට අනුව ලිපි ද්‍රව්‍ය තොගයේ වටිනාකම අතර වූ වෙනස 2017 වර්ෂය තුළදී හෙළිදරව් කර අදාල ගැලපීම් සිදුකරන ලදි.

(ආ)	සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශනය අනුව මෘදුකාංග මිළ දී ගැනීම රු. 2,697,146 ක් වුව ද ස්ථාවර වත්කම් ලේඛනයේ එය රු. 970,000 ක් ලෙස දැක්වීමෙන් රු. 1,727,146 ක වෙනසක් නිරීක්ෂණය විය.	මෙම නිරීක්ෂණය සමඟ එකඟ වෙමි. **(නමුත් පහත පැහැදිලි කිරීම් වලට යටත්ව,)** මූල්‍ය ප්‍රකාශන තුළ සටහන් අංක 10, "අස්පෘශ්‍ය වත්කම්" යටතේ, " මෘදුකාංග" ශීර්ෂය තුළ රු. 2,697,146 ලෙස මෘදුකාංග වල මුළු වටිනාකම දක්වා ඇතත්, එයින් රු. 970,000 ක් වූ, ප්‍රවර්තන වර්ෂය තුළ අත්පත් කර ගත් මෘදුකාංග වටිනාකම ස්ථාවර වත්කම් ලේඛනයේ "අස්පෘශ්‍ය වත්කම්" පිටුව තුළ ඉදිරිපත් කොට ඇත. ඉතිරිය, එනම් රු. 1,727,146 වූ අස්පෘශ්‍ය වත්කම් (මෘදුකාංග) වටිනාකම පෙර වර්ෂ වල දී අත්පත් කරගත් ARC GIS මෘදුකාංගයේ වටිනාකම වන අතර, එය ස්ථාවර වත්කම් ලේඛනයේ, "විද්‍යාගාර හා ඉගැන්වීම් උපකරණ"යටතේ දක්වා ඇත. ස්ථාවර වත්කම් ලේඛනයේ සංගතභාවය සඳහා, මෙම රු. 1,727,146 වූ වටිනාකම ද, මෘදුකාංග යටතේ නිවැරදිව ඉදිරිපත් කිරීමට කටයුතු කරමි.	මූල්‍ය ප්‍රකාශන තුළ සටහන් අංක 10, "අස්පෘශ්‍ය වත්කම්" යටතේ, " මෘදුකාංග" ශීර්ෂය තුළ රු. 2,697,146 ලෙස මෘදුකාංග වල මුළු වටිනාකම දක්වා ඇතත්, එයින් රු. 970,000 ක් වූ, ප්‍රවර්තන වර්ෂය තුළ අත්පත් කර ගත් මෘදුකාංග වටිනාකම ස්ථාවර වත්කම් ලේඛනයේ "අස්පෘශ්‍ය වත්කම්" පිටුව තුළ ඉදිරිපත් කොට ඇත. ඉතිරිය, එනම් රු. 1,727,146 වූ අස්පෘශ්‍ය වත්කම් (මෘදුකාංග) වටිනාකම පෙර වර්ෂ වල දී අත්පත් කරගත් ARC GIS මෘදුකාංගයේ වටිනාකම වන අතර, එය ස්ථාවර වත්කම් ලේඛනයේ, " විද්‍යාගාර හා ඉගැන්වීම් උපකරණ"යටතේ දක්වා ඇත. ස්ථාවර වත්කම් ලේඛනයේ සංගතභාවය සඳහා, මෙම රු. 1,727,146 වූ වටිනාකම ද, මෘදුකාංග යටතේ නිවැරදිව ඉදිරිපත් කිරීමට කටයුතු කරමි.
2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම			
ලැබිය යුතු ගිණුම් - පුනරාවර්තන	20,063,117 • ශේෂ සනාථන ලිපි • කාල විශ්ලේෂණය	මෙම නිරීක්ෂණය සමඟ එකඟ විය නොහැක. මෙහි සඳහන් රු.20,063,117 ක් වූ "ලැබිය යුතු පුනරාවර්ථන ගිණුම් " ශීර්ෂය යටතේ දක්වා ඇති වටිනාකමට අදාල විස්තරාත්මක ශේෂයන් තුළ ඇතුළත් වන්නේ නිරන්තරයෙන් වෙනස් වීම් සිදු නොවන එමෙන්ම වෙන වෙනම ණයගැති ලෙජර පවත්වාගත යුතු අයිතම් නොවන හෙයින් ඒවා සඳහා ලේඛන පමණක් පවත්වා ගැනීම පරිවය වේ. නිදසුන් - ශිෂ්‍යාධාර ලැබිය යුතු ශේෂ, මහපොළ ලැබිය යුතු	මෙහි සඳහන් රු. 20,063,117 ක් වූ "ලැබිය යුතු පුනරාවර්ථන ගිණුම්" ශීර්ෂය යටතේ දක්වා ඇති වටිනාකමට අදාල විස්තරාත්මක ශේෂයන් තුළ ඇතුලත් වන්නේ නිරන්තරයෙන් වෙනස්වීම් සිදු නොවන අයිතමයන් වේ. උදා: ශිෂ්‍යාධාර ලැබිය යුතු ශේෂ, මහපොළ ලැබිය යුතු ශේෂ ,ගිවිසුම්

		ශේෂය, ගිවිසුම් කඩ කිරීම් මත ලැබිය යුතු දෑ ..... වැනි දෑ එසේම රු.76,744,952 ක් වූ ගෙවිය යුතු ගිණුම් එකතුව තුළ ඇතුලත් වන්නේ ආරක්ෂණ තැන්පතු හා ඒ මත ගෙවිය යුතු පොළි, වෙනත් තැන්පතු සහ ගෙවිය යුතු දෑ (අයභාර හා ප්‍රාග්ධන), ගෙවිය යුතු උපයන විට ගෙවීම් බදු සහ මුද්දර බදු වැනි නිරන්තරයෙන් ඇති නොවන ගෙවිය යුතු දෑ වන අතර, ඒ සඳහා ණයහිමි ලෙජර පවත්වා නොගන්නා අතර, ලේඛන පමණක් පවත්වා ගැනේ. මෙම ලේඛන, මූල්‍ය ගිණුම්කරණ කටයුතු සඳහා උපරිම ලෙස ප්‍රමාණවත් වන බව අවධාරණය කරමි.	කඩකිරීම මත ලැබිය යුතු දෑ, ලැබිය යුතු පොලී මුදල් ආදිය වේ. මින් ලැබිය යුතු පොලී මුදල් සඳහා සනාථ කිරීමේ ලිපි ලබාගෙන ඇති අතර, අනෙකුත් ශේෂයන් වෙනුවෙන් ශේෂ සනාථන ලිපි ලබා ගැනීමට ඉදිරියේ දී කටයුතු යොදමි.
ගෙවිය යුතු ගිණුම් - පුනරාවර්තන	4,629,328 • ශේෂ සනාථන ලිපි • කාල විශ්ලේෂණය	මෙම නිරීක්ෂණය සමඟ එකඟ වෙමි. නමුත් ඉහත ශේෂය තුළ ඇතුලත් වන රු.1,100 ක් මඟින් නියෝජනය වන්නේ පේරාදෙණිය විශ්වවිද්‍යාලයට මාරු වූ සේවකයෙකු වෙනුවෙන් එම විශ්වවිද්‍යාලයේ සුභසාධක සංගමයට, ගෙවූ දායක මුදලක් වන අතර, එම චෙක්පත කල් ඉකුත් වී ඇත. ඒ සඳහා නැවත ගෙවීමක් සිදු කොට නැති අතර, එය දෝෂයක් බව පිළිගනිමි. එම ගෙවීම නැවත කිරීම සඳහා කටයුතු කරමි. ඉතිරිය එනම් 4,628,267.63 වූ වටිනාකම තුළ අඩංගු වන්නේ, "වාර්ෂික සිම්පෝසියම්", "දසවන සංවත්සර සැමරුම", සිසුන් වෙනුවෙන් ලැබුණු "ජර්මානු හා ඔස්ට්‍රේලියා "ශිෂ්‍යත්ත්ව අරමුදල් සහ"පර්යේෂණ ප්‍රදාන -බාහිර මුලාශ්‍ර " වැනි දෑ වේ. මෙම ශේෂ සඳහා "ශේෂ සනාථ ලිපි" ලබා ගත නොහැකි අතර, "කාල විශ්ලේෂයන්"සකස් කිරීම සාමාන්‍යයෙන් සිදු නොවේ. මන්ද ඒවා කෙටිකාලීනව නිරවුල් වන නිසාය.	මෙම නිරීක්ෂණය සමඟ එකඟ වෙමි. නමුත් ඉහත ශේෂය තුළ ඇතුලත් වන රු.1,100 ක් මඟින් නියෝජනය වන්නේ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සුභසාධක සංගමයට, මාරු වූ සේවකයෙකු වෙනුවෙන් ගෙවූ දායක මුදලක් වන අතර, එම චෙක්පත් කල් ඉකුත් වී ඇත. ඒ සඳහා නැවත ගෙවීමක් සිදු කොට නැති අතර, එය දෝෂයක් බව පිළිගනිමි. එම ගෙවීම කිරීම සඳහා කටයුතු කරමි. ඉතිරිය එනම් 4,628,267.63 වූ වටිනාකම තුළ අඩංගු වන්නේ, "වාර්ෂික සිම්පෝසියම", "දසවන සංවත්සර සැමරුම", සිසුන් වෙනුවෙන් ලැබුනු "ජර්මානු හා ඔස්ට්‍රේලියා " ශිෂ්‍යත්ත්ව අරමුදල් සහ "පර්යේෂණ ප්‍රදාන - බාහිර

			මුලාශ්‍ර ” වැනි දෑ වේ. මෙම ශේෂ සඳහා “ශේෂ සනාථ ලිපි” ලබා ගත නොහැකි අතර, “කාල විශ්ලේෂණයන්”සකස් කිරීම සාමාන්‍යයෙන් සිදු නොවේ. මන්ද ඒවා කෙටිකාලීනව නිරවුල් වන නිසාය.
ගෙවිය යුතු ගිණුම් - ප්‍රාග්ධන	18,466,392 • ශේෂ සනාථන ලිපි • කාල විශ්ලේෂණය	මෙම නිරීක්ෂණය සමඟ එකඟ වෙමි. නමුත් මෙම වටිනාකම තුළ අඩංගු වන්නේ බාහිර සැපයුම්කරුවන්ට කළ යුතු ගෙවීම් ශේෂයන් වන අතර ඒ සඳහා සනාථන ලිපි ලබා ගැනීමට කටයුතු කර නැති අතර ඒවා ලබා ගැනීමට ඉදිරියේ දී කඩිනමින් කටයුතු යොදමි. මේ සඳහා ගෙවිය යුතු ලෙජරයන් තබා ගැනීමට කටයුතු කරමි. මෙම ශේෂයන් සඳහා, “කාල විශ්ලේෂණයන් “ සිදු කොට නැති ලෙස විගණන නිරීක්ෂණය තුළ සඳහන් වුව ද මූල්‍ය ප්‍රකාශන තුළ, සටහන් අංක 12 අදාලව ඉදිරිපත් කළ උප ලේඛන අංක 18 යටතේ එම වයස් විශ්ලේෂණය ඉදිරිපත් කොට ඇත. ඒ අනුව විගණන නිරීක්ෂණය නිවැරදි නොවේ.	මෙම නිරීක්ෂණය සමඟ එකඟ වෙමි. නමුත් මෙම වටිනාකම තුළ අඩංගු වන්නේ බාහිර සැපයුම්කරුවන්ට කළ යුතු ගෙවීම් ශේෂයන් වන අතර, ඒ සඳහා සනාථන ලිපි ලබා ගැනීමට කටයුතු කර නැති අතර, ඒවා ලබා ගැනීමට ඉදිරියේ දී කටයුතු යොදමි.
2.3	**ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**		
(අ)	සමාලෝචිත වර්ෂය අවසානයට වර්ෂ 02 ක් ඉක්මවූ විවිධ ඉදිකිරීම්, සැපයුම් හා සේවා ලබා ගැනීමේ දී අත රැඳවුම් වශයෙන් රඳවාගෙන තිබුණු රු. 31,716,010 ක් විගණන දිනය වූ 2017 අප්‍රේල් 30 දින වන විටත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.	මෙම නිරීක්ෂණය සමඟ එකඟ වෙමි. නමුත් රු. 31,716,010 ක් වූ විගණන නිරීක්ෂණය තුළ සඳහන් අත රැඳවුම් වල මුළු වටිනාකම තුළ රු.23,884,279 ක වටිනාකම අදාල වන්නේ “කොන්ත්‍රාත්” සඳහා වන අතර ඒවා ස්ථාවර තාක්ෂණික ඇගයීම් කමිටු (STC) අනුමැතිය නොමැති නිසා අවසාන බිල්පත් ගෙවීමට නොහැකි වීම මත නිරවුල් නොවූ අත රැඳවුම් වේ. ඉතිරිය, එනම් රු. 7,831,731 ක් වූ වටිනාකම, මිළදී ගත් ගෘහ භාණ්ඩ, පරිගණක හා විද්‍යාගාර උපකරණ වලට අදාල අත රැඳවුම් වන අතර, ඒවා සැපයුම්කරුවන් ඉල්ලීමක් කළ විට පමණක් නිදහස් කෙරේ. සැපයුම්කරුවන්ට, විශ්වවිද්‍යාලයෙන් අත රැඳවුම් මත යම් මුදලක් අය වීමට ඇති නම් ඒ බව	රු.31,716,010 ක් වූ විගණන නිරීක්ෂණය තුළ සඳහන් අත රැඳවුම් වල මුළු වටිනාකම රු.23,884,279 ක වටිනාකම අදාල වන්නේ “කොන්ත්‍රාත්” සඳහා වන අතර ඒවා සඳහා ස්ථාවර තාක්ෂණික ඇගයීම් කමිටු (STC) අනුමැතිය නොමැති නිසා අවසාන බිල්පත් ගෙවීමට නොහැකි වීම මත නිරවුල් නොවූ අත රැඳවුම් වේ. ඉතිරිය, එනම් රු.7,831,731 ක් වූ වටිනාකම, මිළදී ගත් ගෘහ භාණ්ඩ, පරිගණක හා විද්‍යාගාර උපකරණ

		විශ්වවිද්‍යාලයට ලිඛිතව දන්වන ලෙස ඉල්ලීමක් කිරීම මඟින් ඉහත අත රැඳවුම් ශේෂයන් නිදහස් කිරීමට කටයුතු කරමි. එහිදි සැපයුම්කරුවන් විසින් ඉල්ලීමක් නොකරන අත රැඳවුම් ශේෂයන් විශ්වවිද්‍යාලයේ පාලක සභාවේ අනුමැතිය සහිතව මූල්‍ය ප්‍රකාශන තුළ ආදායමක් ලෙස හඳුනා ගැනිමට කටයුතු කරමි	වලට අදාල අත රැඳවුම් වන අතර ඒවා සැපයුම්කරුවන් ඉල්ලීමක් කළ විට පමණක් නිදහස් කෙරේ. සැපයුම්කරුවන්ට, විශ්වවිද්‍යාලයෙන් අත රැඳවුම් මත යම් මුදලක් අය වීමට ඇති නම් ඒ බව විශ්වවිද්‍යාලයට ලිඛිතව දන්වන ලෙස ඉල්ලීමක් කිරීම මඟින් ඉහත අත රැඳවුම් ශේෂයන් නිදහස් කිරීමට කටයුතු කරමි. එහිදි සැපයුම්කරුවන් විසින් ඉල්ලීමක් නොකරන අත රැඳවුම් ශේෂයන් විශ්වවිද්‍යාලයේ පාලක සභාවේ අනුමැතිය සහිතව මූල්‍ය ප්‍රකාශන තුළ ආදායමක් ලෙස හඳුනා ගැනිමට කටයුතු කරමි.
(ආ)	ලැබිය යුතු ගිණුම් යටතේ දක්වා තිබුණු 2014 වර්ෂයේ ආරම්භක ශිෂ්‍යාධාර මුදල් ශේෂයේ නොසැසඳුණු වෙනස වූ රු.443,771 ක් හා මහපොල ශිෂ්‍යත්ව මුදල් රු.84,050 ක ඍණ ශේෂය සමාලෝචිත වර්ෂයේ දී නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.	මෙම නිරීක්ෂණය සමඟ එකඟ වෙමි. මෙම නොසැසඳුනු ශිෂ්‍යාධාර මුදල් ශේෂය හා මහපොළ ශිෂ්‍යත්ව මුදල් ශේෂය, පසුගිය වර්ෂ වල ගිණුම් පොත්පත් පරීක්ෂා කිරීම මඟින් සොයා බැලීමේදී අනාවරණය වූයේ එය ගිණුම්කරණ දෝෂයක් බවයි. විශ්ව විද්‍යාලයේ පාලක මණ්ඩලයේ අනුමැතිය සහිතව, “ පෙර වර්ෂ වලට අදාල වැරදි නිවැරදි කිරීම්”යටතේ නිවැරදි කිරීම සඳහා කටයුතු කරමි.	මෙම නොසැසඳුනු ශිෂ්‍යාධාර මුදල් ශේෂය හා මහපොළ ශිෂ්‍යත්ව මුදල් ශේෂය, පසුගිය වර්ෂ වල ගිණුම් පොත්පත් පරීක්ෂා කිරීම මඟින් සොයා බැලීමේ දී අනාවරණය වූයේ එය ගිණුම්කරණ දෝෂයක් බවයි. විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලයේ අනුමැතිය සහිතව, “ පෙර වර්ෂ වලට අදාල නිවැරදි කිරීම්”යටතේ නිවැරදි කිරීම සඳහා කටයුතු කර ඇත.

2.4	**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**			
(අ)	1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත 37(1) වගන්තිය	නියමාවලි මඟින් සංයුතිය නියම කර තෝරා ගැනීම් කමිටුවක නිර්දේශය මත පාලක සභාව විසින් විශ්වවිද්‍යාලයක ලේඛකාධිකාරිවරයා පත්කළ යුතු නමුත් අමාත්‍ය මණ්ඩල අනුමැතිය නොමැතිව එම තනතුර සඳහා 2014 නොවැම්බර් 12 දින සිට මේ දක්වා කාර්යය පැවරුම් පදනම මත විශ්‍රාමික නිලධාරියෙකු යොදවා තිබුණි.	ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරී තනතුර 2014.03.13 දින සිට පුරප්පාඩුව පැවති අතර, එම තනතුරෙහි රාජකාරී ආවරණය කිරීම සඳහා විධායක නිලධාරීන් දෙදෙනෙකුට (2) වෙනම කාර්යයන් පැවරූ අතර, එය පසුකාලීනව සාර්ථක බවක් පෙන්නුම් කර නොමැත. එම තනතුරට 2014.07.20 වෙනි දින පුවත්පත් දැන්වීමක් මඟින් අයදුම්පත් කැඳවා ඇති අතර, 2015.03.04 වෙනි දින එම තේරීම් මණ්ඩලය පැවැත්වූ අතර, එකම අයදුම්කරු තේරීම් මණ්ඩලය ඉදිරියේ පෙනී සිටිය ද, ඔහු තනතුරට නුසුදුසු වූ බැව් තේරීම් මණ්ඩලය තීරණය කර ඇත. එබැවින් එය 2015.05.15 වෙනි දින පැවති පාලක සභාවට වාර්තා කොට නැවත අයදුම්පත් කැඳවීමට තීරණය කොට ඇත. 2015.02.20 වෙනි දින පැවති පාලක සභා රැස්වීමෙන් පසු මාර්තු මස පැවැත්වීමට නියමිත පාලක සභා රැස්වීම නොපැවති අතර, ඊට හේතුව වූයේ සියළු පාලක සභා විසුරුවා හැරීමය. නැවත පාලක සභා සාමාජිකයින් පත්කර ඇත්තේ 2015.04.20 වෙනි දින සිට ක්‍රියාත්මක වන පරිදි ය. නැවත ලේඛකාධිකාරී තනතුර සඳහා 2016 දෙසැම්බර් මස 04 දාතමින් පුවත්පත් දැන්වීම් මඟින් අයදුම්පත් කැඳවූ අතර, කිසිවෙකු අයදුම් කර නොමැති බැවින් ඒ.ජී. කරුණාරත්න මහතා විශ්වවිද්‍යාල පාලක සභාවේ අනුමැතිය මත නැවතත් පැවරුම් පදනම මත පත්කොට ඇත. කෙසේ වුවද, කරුණාරත්න මහතා විශ්වවිද්‍යාල සේවයේ දීර්ඝ කාලීනව වසර (16) ආසන්න කාලයක් ලේඛකාධිකාරී තනතුරේ සේවය කර ඇති බැවින්, ඔහුගේ පළපුරුද්ද සලකා සහ සේවා අවශ්‍යතාවය සලකා මෙම තනතුර සඳහා සුදුස්සකු නොමැති බැවින්, ඔහුගේ සේවය ලබා ගෙන ඇත. ලේඛකාධිකාරී තනතුර පිරවීම සඳහා නැවතත් 2017 අප්‍රේල් 30 වෙනි දින අයදුම්පත් කැඳවා ඇති අතර, ඉල්ලුම්පත් භාරගන්නා අවසන් දිනය 2017 මැයි 29	2017.11.15 දින සිට ස්ථිර ලේඛකාධිකාරිවරයෙකු පත්කොට ඇත.

			වෙනි දින යෙදී තිබූ අතර, කඩිනමින් තේරීම් මණ්ඩල රැස්වීමක් පැවැත්වීමට කටයුතු කරනු ඇත.	
(ආ)	**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි**			
(i) මුදල් රෙගුලාසි 396 (ඈ)	2017 මාර්තු 31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශයට අනුව නිකුත් කළ නමුත් බැංකුවට ඉදිරිපත් නොවූ මාස 06 ඉක්ම වූ, එකතුව රු. 69,612 ක් වූ චෙක්පත් 27 ක් සම්බන්ධව මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	මෙම නිරීක්ෂණය සමඟ එකඟ වෙමි. මෙම මුදල් රෙගුලාසි 396 (ඈ) ට අනුව, නිකුත් කල නමුත් වලංගු කාලය තුළ ඉදිරිපත් නොවූ චෙක්පත් අවලංගු කොට නැවතත් "ලැබීම්" සේ ගිණුම්ගත කළ යුතු වුවත්, යම් ප්‍රමාද දෝෂයකින් එය සිදු වී නැත. නමුත් ඒවා අවලංගු කොට නැවත ලැබීම් සේ මේ වන විට ගිණුම්ගත කොට ඇත.	නිකුත් කළ නමුත් බැංකුවට ඉදිරිපත් නොකළ මාස 06 ක් ඉක්මවූ චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කරන ලදි.
(ii) මුදල් රෙගුලාසි 757 (2)	සමාලෝචිත වර්ෂය සඳහා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව 2017 අප්‍රේල් 30 දින වන විටත් විගණනයට ඉදිරිපත් නොවීය.	මෙම නිරීක්ෂණය සමඟ එකඟ වෙමි. නමුත් 2016 වර්ෂය අග තොග සමීක්ෂණ පත්‍ර සහ ඒ මත සාරාංශ ගත වාර්ථාව, මූල්‍ය අංශය මඟින් ලේඛකාධිකාරී කාර්යාලයට 2017.01.05 දින භාර දී ඇති අතර (මූලික පිටපත් 02 කින් යුක්තව) යම් හෙයකින් එය අස්ථාන ගත වී ඇත. නමුත් මූල්‍ය අංශයෙන් පවත්වා ගත් පිටපතහි ඡායා පිටපතක් විගණනය සඳහා ඉදිරිපත් කොට ඇත.	2016 වර්ෂයේ තොග සමීක්ෂණ වාර්තා හා ඒ මත සැකසූ සාරාංශ ගත වාර්තාවෙහි පිටපතක් විගණන අංශය වෙත ඉදිරිපත් කර ඇත.
(iii) මුදල් රෙගුලාසි 772	රු. 584,566 ක් වටිනා කල් ඉකුත් වූ මුද්‍රණ තීන්ත අංක 92 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	මෙම නිරීක්ෂණය සමඟ එකඟ වෙමි. නමුත් කල් ඉකුත් වූ අයිතමයන් පිළිබඳව අදාල වන්නේ මූල්‍ය රෙගුලාසි 762 නොව 772 වේ.එම මූල්‍ය රෙගුලාසි 772 ට අනුව කල් ඉකුත් වූ තොග, මහජන දැන්වීමකින් පසුව, මහජන වෙන්දේසියක් මඟින් නැතහොත් විවෘත ටෙන්ඩරයක් මඟින් විකිණීම කළ යුතු වේ. ඒවා ප්‍රයෝජනයට ගත නොහැකි තත්ත්වයක ඇති නම්, එම	මූල්‍ය රෙගුලාසි 772 ට අනුව කල් ඉකුත් වූ තොග, මහජන දැන්වීමකින් පසුව, මහජන වෙන්දේසියක් මඟින් නැතහොත් විවෘත ටෙන්ඩරයක් මඟින් විකිණීම කළ යුතු වේ. ඒවා ප්‍රයෝජනයට ගත නොහැකි තත්ත්වයක ඇති නම්, එම මූල්‍ය රෙගුලාසි 772 හි

		මූල්‍ය රෙගුලාසි 772 හි සඳහන් කොන්දේසි වලට යටත්ව එම අයිතම විනාශ කළ යුතු වේ. නමුත් එම පියවරයන් අනුගමනය කොට නැත. ඉදිරියේ දී සියළුම කල් ඉකුත් වූ අයිතම හඳුනා ගෙන, ඉහත මුදල් රෙගුලාසියට අනුව කටයුතු කරමි.	සඳහන් කොන්දේසි වලට යටත්ව එම අයිතම විනාශ කළ යුතු වේ. නමුත් එම පියවරයන් අනුගමනය කොට නැත. ඉදිරියේ දී සියළුම කල් ඉකුත් වූ අයිතම හඳුනා ගෙන, ඉහත මුදල් රෙගුලාසියට අනුව කටයුතු කරමි.
(ඇ)	**රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ**		
2003 ජුනි 03 දිනැති අංක පීඊඩී/12 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.2 ඡේදය	විශ්වවිද්‍යාලය ප්‍රධාන මෙහෙයුම් ක්ෂේත්‍ර ආවරණය වන පරිදි මෙහෙයුම් අත්පොත් පිළියෙල කර නොතිබුණි.	අනධ්‍යයන කාර්ය්‍ය මණ්ඩල සහ පරිපාලන ශ්‍රේණි වල නිළධාරීන් සඳහා රාජකාරී ලැයිස්තු (Job descriptions) ලබා දී ඇති අතර, මෙතෙක් රාජකාරී ලැයිස්තු ලබා නොදුන් නිළධාරීන් සහ කාර්යය මණ්ඩල වෙනුවෙන් කඩිනමින් රාජකාරී ලැයිස්තු ලබා දීමට කටයුතු කරමි.	2017.11.29 දින පැවති පොදු ව්‍යාපාර කාරක සභාවේ නිර්දේශය ප්‍රකාර විශ්වවිද්‍යාලය ප්‍රධාන මෙහෙයුම් ක්ෂේත්‍ර ආවරණය වන පරිදි මෙහෙයුම් අත්පොතක් පිළියෙල කිරීම ආරම්භ කොට ඇත.
(ඈ)	**විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ**		
2013 අගෝස්තු 29 දිනැති අංක 12/2013 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිවරයාගේ ආයතනික චක්‍රලේඛය	ජ්‍යෙෂ්ඨ නිළධාරීන්ට හිමි නිවාස වල පදිංචි නිළධාරීන්ගේ නිවාස කුලී චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය ස්ථාපිත කරනු ලැබුයේ නේවාසික විශ්වවිද්‍යාලයක් (Residence University) ලෙසත්, එය ඌව පළාතේ බදුල්ල දිස්ත්‍රික්කයේ ස්ථාපනය කෙරුණු නිසා ඒ සඳහා කාර්යය මණ්ඩලය (අධ්‍යයන/අනධ්‍යයන) බඳවා ගැනීමටත්, එසේම ඔවුන් රඳවා ගැනීමටත්, මුල් අවුරුදු 10 තුළ ලබා දුන් නිවාස සඳහා කුලී මුදලක් අය කර නොගන්නා ලදී. එසේම, විශ්වවිද්‍යාලයට අයත් නේවාසිකාගාර හෝ නිවාස කාර්යය මණ්ඩල සඳහා ස්ථාපනය කරණු ලැබුවේ ද 2012-2013 වසර වල දී ය. නමුත්, මේ වන විට විශ්වවිද්‍යාලයට අයත් නිවාස හා නේවාසිකාගාර වල කාර්යය මණ්ඩලය පදිංචි වී ඇති අතර, ඔවුන්ගේ නිවාස කුලිය අය කර ගැනීමට අදාල අනුමැතිය සඳහා පාලක සභාව වෙත යොමු කර ඇත. එය 2017 ජූනි 23 පැවැත්වීමට නියමිත 122 පාලක	විශ්වවිද්‍යාලයේ නිවාස කමිටුව විසින්, නාමික කුලියක් අය කර ගැනීම සඳහා නිර්දේශ කොට ඇති අතර, ඒ සඳහා විශ්වවිද්‍යාල පාලක සභාවේ අනුමැතිය ලබා ගැනීමට, 2017.06.23 පැවති පාලක සභා රැස්වීමට මෙමෝ පත්‍රයක් ඉදිරිපත් කොට ඇත. මෙහිදි, අදාල නිවාස සඳහා නාමික කුලියක් අය කර ගැනීමට අනුමැතිය ලබා දී ඇත.

		සභාවේ අනුමැතිය මත ක්‍රියාත්මක කිරීමට කටයුතු යොදා ඇත.	

3.	**මූල්‍ය සමාලෝචනය**
3.1	**මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රතිඵලය රු:80,933,886 ක ඌණතාවයක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ ඌණතාවය රු: 97,665,336 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු: 16,731,450 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව පුනරාවර්තන වියදම් සඳහා රජයෙන් ලැබුණු ප්‍රතිපාදනය රු: 134,129,000 කින් වැඩිවීම ඉහත වර්ධනය කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේ දී 2012 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා මූල්‍ය ඌණතාවයක් ඇති වී තිබුණි. කේසේ වුවද, මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික රජයට ගෙවූ බදු සහ ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය නැවත ගැලපීමේ දී 2012 වර්ෂයට සාපේක්ෂව 2013 වර්ෂයේ දායකත්වය අඩු වී තිබුණි. කේසේ වුවද, 2013 වර්ෂයේ දී රු:113,423,662 ක් වූ දායකත්වය සමාලෝචිත වර්ෂයේ දී රු: 372,516,387 ක් දක්වා වර්ධනය වී තිබුණි.

4.	**මෙහෙයුම් සමාලෝචනය**
4.1	**කාර්යය සාධනය**
(අ)	විශ්වවිද්‍යාලය විසින් 2016 වර්ෂය සඳහා පිළියෙල කර තිබූ ක්‍රියාකාරී සැලැස්මේ ළඟා කර ගැනීමට අපේක්ෂිත උපාය මාර්ග අරමුණු 06 ක් දක්වා තිබුණ අතර, මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	**කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම**	**වර්තමාන තත්ත්වය**
(i)	විශ්වවිද්‍යාලය විසින් 2005/2006 සිට 2010/ 2011 කාලපරිච්ඡේදය තුළ විශ්වවිද්‍යාලය විසින් බඳවාගනු ලැබූ ශිෂ්‍යයන් ගණන 2257 ක් වූ අතර, උපාධිය ලබා පිටවූ ශිෂ්‍යය සංඛ්‍යාව 1840 ක් විය. එම ප්‍රමාණය ලියාපදිංචි මුළු ශිෂ්‍යය සංඛ්‍යාවෙන් සියයට 82 ක් විය.	2005/2006 වර්ෂයේ සිට 2010/2011 දක්වා කාලපරිච්ඡේදය තුළ විශ්වවිද්‍යාලය විසින් බඳවාගනු ලැබූ ශිෂ්‍යය සංඛ්‍යාව 2257 ක් වන අතර, එම ශිෂ්‍ය ය සංඛ්‍යාවෙන් ශිෂ්‍යයන් 1988 ක් එනම් අදාල ශිෂ්‍යය සංඛ්‍යාවෙන් 88% ක ප්‍රතිශතයක් උපාධිය ලබා පිට වී ඇත. පාඨමාලා අතහැරයාම,ලියාපදිංචිය අවලංගු කර ගැනීම, විභාග සඳහා පෙනී නොසිටීම මෙන්ම විභාග අසමත්වීම යනාදී කාරණු මත 12% ක ශිෂ්‍යය ප්‍රතිශතයකට උපාධිය ලබාගත නොහැකි වී ඇත. තවද, විගණන අංශයේ අංක UVP/BD/D/UWU/01/17/05 සහ 2017.03.22 දිනැති ලිපියෙහි ඉල්ලීම පරිදි අප විසින් ඉදිරිපත් කරන ලද්දේ	ඇතැම් සිසුන් රැකියා අවස්ථා සහ විදේශ ශිෂ්‍යත්ව ලබා පාඨමාලා හැර යන අතර, ප්‍රායෝගිකව එවැනි තත්ත්වයන් වැලැක්විය නොහැක.

		2011 වර්ෂයේ සිට ලියාපදිංචි වූ සහ උපාධිය ලබා පිටවූ ශිෂ්‍යය සංඛ්‍යාව වේ. ඒ අනුව එම කාලසීමාවට අදාලව උපාධිය ලබා පිට වූ සංඛ්‍යාව 1840 කි.	
(ii)	ඉහළ ගුණාත්මක භාවයෙන් යුක්ත අන්තර්ජාතික මට්ටමේ පාඨමාලා අවම පිරිවැයක් යටතේ හදුන්වාදීම තුළින් බඳවාගනු ලබන විදේශීය ශිෂ්‍යය සංඛ්‍යාව ඉහළ නංවා ගැනීම අරමුණක් වී තිබුණ ද 2016 වර්ෂයේ දී එක් විදේශ ශිෂ්‍යයෙක් පමණක් බඳවා ගෙන තිබුණි.	පාඨමාලා සඳහා විදේශීය ශිෂ්‍යයන් උසස් අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් විශ්වවිද්‍යාලය වෙත යොමු කරන අතර, එසේ යොමු කරන ලද ශිෂ්‍යයන් බඳවා ගැනීමට කටයුතු කර ඇත.	වර්තමානයේ විශ්වවිද්‍යාලය තුළ විදේශ සිසුන් 04 දෙනෙක් අධ්‍යයන කටයුතු වල නිරත වෙන අතර, මෙම සිසුන් බඳවා ගැනීම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හරහා සිදු කරනු ලබයි.
(iii)	සමාලෝචිත වර්ෂය සඳහා උපාධි පාඨමාලා 13 ක් සඳහා සිසුන් 820 ක් බඳවාගත යුතු නමුත් සිසුන් 666 දෙනෙකු පමණක් බඳවා ගෙන තිබුණි. ඒ අනුව අපේක්ෂිත ශිෂ්‍යය සංඛ්‍යාවෙන් 154 ක් අඩුවෙන් ඇතුළත් කර ගැනීම තුළින් සම්පූර්ණ ධාරිතාව උපයෝජනය කර ගැනීමට විශ්වවිද්‍යාලය අපොහොසත් වී තිබුණි.	2015/2016 අධ්‍යයන වර්ෂය සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් අවස්ථා 07 දී විශ්වවිද්‍යාලය වෙත ලියාපදිංචිය සඳහා ශිෂ්‍යය ලැයිස්තු යොමු කළ අතර, එම ලැයිස්තු වලට අදාලව ශිෂ්‍යයන් බඳවාගැනීමට කටයුතු කර ඇත. නමුත් ඇතැම් ශිෂ්‍යයන් ලියාපදිංචිය සඳහා සහභාගී වූයේ නැත. ලියාපදිංචි වූ ශිෂ්‍යයන් ද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ උපදෙස් මත වෙනත් විශ්වවිද්‍යාල වෙත මාරු වී යන ලද අතර, ශිෂ්‍යයන් කිහිප දෙනෙකු ඔවුන්ගේ ලියාපදිංචිය අවලංගු කර ගෙන ඇත. මෙවැනි හේතූන් මත අපේක්ෂිත ශිෂ්‍යය සංඛ්‍යාව අඩු වී ඇත. අපේක්ෂිත ශිෂ්‍යයන් සංඛ්‍යාව අඩු වීම හේතුවෙන් අතිරේක ශිෂ්‍යයන් අප විශ්වවිද්‍යාලය වෙත අනුයුක්ත කරන ලෙස ඉල්ලා 2017.02.02 දාතමින් අප විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරීතුමා විසින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ලේකම්තුමා වෙත ලිපියක් ද යොමු කරන ලදී. ඉන් අනතුරුව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් විශ්වවිද්‍යාලය වෙත යොමු කරන ලද ලැයිස්තු වලට අදාලව ද ශිෂ්‍යයන් බඳවා ගැනීමට කටයුතු කළ ද අපේක්ෂිත ශිෂ්‍යය සංඛ්‍යාව සම්පූර්ණ නොවීය.	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් අදාල ශිෂ්‍යයන් බඳවා ගැනීම් කරන බැවින්, ඇතිවන තත්ත්වයන් සම්බන්ධයෙන් හැකිතාක් දුරට පුරප්පාඩු පිරවීමට කටයුතු කරනු ඇත.
(iv)	ලෝක ශ්‍රේණිගත කිරීම සහ ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම අනුව (Web of Universities Ranking) 2015 වර්ෂයේ දී	විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කටයුතු, පර්යේෂණ කටයුතු වල ප්‍රගතියක් ලබා ඇති බැව් ලෝක ශ්‍රේණිගත කිරීම්	2018.01.26 වන දිනට විශ්වවිද්‍යාල වෙබොමෙට්රික් තරාව

	ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය පිළිවෙලින් 15362 ස්ථානයේ සහ 20 තත්ත්වයේ පැවතුන ද 2017 අප්‍රේල් වන විට පිළිවෙලින් 10911 හා 09 වන ස්ථානය දක්වා ඉහළට පැමිණීමක් නිරීක්ෂණය විය.	සහ ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම ලබා ඇති ප්‍රගතිය පෙන්නුම් කරයි.	(webometric Ranking) තුළ, ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය 10,726 වන ස්ථානය ලෙස ඇගයීමට ලක්වී ඇති අතර, ශ්‍රී ලංකාව තුල 17 වන ස්ථානය හිමි වී ඇත.
(v)	විශ්වවිද්‍යාල වෙබ් අඩවියේ 2014, 2015 වර්ෂ වල වාර්ෂික වාර්තා ඇතුලත්ව යාවත්කාලීන කර නොතිබුණි.	2014/2015 වර්ෂ වලට අදාලව වාර්ෂික වාර්තා වෙබ් අඩවියේ ඇතුළත් කිරීමට කටයුතු යොදනු ඇත.	2014 වාර්ෂික වාර්තා මේ වන විටත් විශ්වවිද්‍යාල වෙබ් අඩවිය සඳහා ඇතුලත් කොට ඇත.
(ආ)	**පර්යේෂණ ප්‍රගතිය**		
විශ්වවිද්‍යාල පර්යේෂණ කමිටුව විසින් 2013 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා පර්යේෂණ ව්‍යාපෘති 27 ක් අනුමත කර ඒ සඳහා රු. 33,397,302 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණි. අනුමත ව්‍යාපෘති අතුරින්, 2014 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා ව්‍යාපෘති 24 ක් ආරම්භ කර තිබූ අතර, ඉන් ව්‍යාපෘති 21 ක් නිම කළ යුතු කාලය අවසන් වී තිබුණ ද 2017 අප්‍රේල් 30 දින වන විටත්, කිසිදු ව්‍යාපෘතියක් අවසන් කර නොතිබුණි. තවද, එම ව්‍යාපෘති 24 සඳහා වෙන් කල ප්‍රතිපාදනයන්ගෙන් සමාලෝචිත වර්ෂයේ අවසානයට 23% ක ප්‍රතිපාදන පමණක් උපයෝජනය කර තිබුණි.	2014,2015 සහ 2016 වර්ෂ සඳහා පර්යේෂණ ව්‍යාපෘති 27 ක් සඳහා රු. 33,397,302 ක් අනුමත කොට ඇතත් 2016.12.31 දින වන විට වැය වී ඇත්තේ රු. 7,619,850 ක් පමණි. පර්යේෂණ මූල්‍ය ප්‍රගතිය ඉතා අඩු මට්ටමක පවතින බව පිළිගන්නා අතර, වැය වීම් කඩිනම් කිරීම සඳහා විශ්වවිද්‍යාලයේ පර්යේෂණ කමිටුව හරහා උපාය මාර්ග සැක සෙමින් පවතී.	2015 වර්ෂය තුළ දී පර්යේෂණ යෝජනා 32 ක් අනුමත වී තිබුණ ද, ඒවාට අදාළ වියදම් දැරීම ප්‍රධාන වශයෙන් සිදුවූයේ 2016 වර්ෂය තුළයි. මෙහි ප්‍රතිඵලයක් ලෙස 2016 වර්ෂය තුළ දී දැරූ මුළු පර්යේෂණ වැය රු. 7,162,475.00 ක් වූ අතර, එය එම වර්ෂයේ මූලික අයවැය ප්‍රතිපාදනය ද ඉක්මවා ඇත. 2017 වර්ෂය සඳහා වෙන් කර තිබූ රු.මිලියන 7.5 ක වුව ද, එය වර්ෂ අවසාන වන විට මිලියන 8.3 පර්යේෂණ වියදම් ලෙස දරා ඇත. මෙය අදාල වර්ෂය සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදනයෙන් 110% ක ප්‍රතිශතයකි. තවද 2014,2015,2016 වර්ෂ සඳහා ආරම්භ කරන ලද පර්යේෂණ ව්‍යාපෘති සියල්ලම 2017 වර්ෂය තුළ අවසන් කර ඇත.
4.2	**කළමනාකරණ ක්‍රියාකාරකම්**		
(අ)	අමාත්‍යය මණ්ඩල පත්‍රිකා අංක: 05/0183/035/001 යටතේ ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ ස්ථාපිත කිරීම සඳහා පෙබරවාරි 10	අමාත්‍යය මණ්ඩල පත්‍රිකා අංක 05/0183/035/001 යටතේ ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය ස්ථාපිත කිරීම	වන්දි කමිටුවක් පත් කිරීම සඳහා උසස් අධ්‍යාපන ආමාත්‍යාංශය වෙත

	දින පැවැත්වුණු අමාත්‍යය මණ්ඩල රැස්වීමේ දී කර්මාන්ත අමාත්‍යාංශයට අයත් ඉඩම අධ්‍යාපන අමාත්‍යාංශය වෙත පවරා ගැනීමට අදාළව ගත් තීරණය අනුව ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය සඳහා දැනට වෙන් කරනු ලැබ ඇති හෙක්ටයාර් 30.9667 ක ඉඩම් වල අයිතිය විශ්වවිද්‍යාලය වෙත නීත්‍යානුකූලව පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.	සඳහා කර්මාන්ත අමාත්‍යාංශයෙන් ලබා දුන් ඉඩම් උසස් අධ්‍යයාපන අමාත්‍යාංශය වෙත වෙන් කර දී ඇත. එහි දී කර්මාන්තකරුවන් 06 දෙනෙකු එම භූමියේ කෙලවරක තාවකාලිකව කර්මාන්ත පවත්වා ගෙන යනු ලැබේ. එහි දී ඔවුන් 06 දෙනා එලෙස එම භූමියේ කෙලවරක පදිංචි කරණු ලැබුවේ කඩිනමින් විශ්වවිද්‍යාලය ස්ථාපනය සිදු කළ යුතු බැවිනි. විශ්වවිද්‍යාලයේ පරිපාලනය මඟින් බොහෝ ඉල්ලීම් උසස් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ද, ඉඩම් අමාත්‍යාංශය වෙත ද බදුල්ල දිස්ත්‍රික් ලේකම් තුමාට ද ඉදිරිපත් කළත්, මේ වන තෙක් එම කර්මාන්තකරුවන් 06 දෙනා ඉවත් කිරීමට නොහැකි වී ඇත. එසේ හෙයින් මෙම ඉඩම් නීත්‍යානුකූල පැවරීම ද ප්‍රමාද වී ඇත. කරුණු එසේ වුව ද, 2017.04.06 වන දින විශ්වවිද්‍යාලයේ උපකුලපතිතුමා, දිස්ත්‍රික් ලේකම්තුමා, අතිරේක අධ්‍යක්ෂක ඉඩම් හා අනෙකුත් නිළධාරීන්ගෙන් සමන්විත කමිටුවක් මඟින්, මෙම ඉඩම නිරවුල් කිරීම හා විශ්වවිද්‍යාලය වෙත පැවරීමට අදාල සාකච්ඡාවක් පැවති අතර, එහි ප්‍රතිඵලයක් ලෙස මෙම ක්‍රියාවලිය ඉක්මන් වනු ඇතැයි අපෙක්ෂා කරමි. මේ අනුව නීත්‍යානුකූල පවරා ගැනීමේ කටයුතු සඳහා විශ්වවිද්‍යාලය සෑම උත්සහයක්ම දරා ඇති බවත්, එය නොබෝ දිනකින් සිදුකරගත හැකි බවත් දන්වා සිටිමි .	ඉල්ලීම් කර ඇත. එසේම විශ්‍රාමික ඉඩම් කොමසාරිස්වරයෙකු, උපදේශකවරයෙකු ලෙස පත් කිරීම සඳහා වූ තීරණයක් විශ්වවිද්‍යාලීය පාලකසභාව මඟින් ගෙන ඇත. මේ වන විට ඒ සඳහා අවශ්‍ය කටයුතු සිදු වෙමින් පවතී.
(ආ)	සමාලෝචිත වර්ෂයේ විශ්වවිද්‍යාලයීය ආචාර්යවරු සඳහා ලබා දෙන ලද රු. 66,072 ක් වූ පුස්තකාල පොත්පත් හා ලේඛන 21 ක් නැවත භාරදීමට කටයුතු කර නොතිබූ අතර ඒවා ආපසු ගෙන්වා ගැනීම සම්බන්ධයෙන් කළමනාකරණයේ අවධානය යොමු වී නොතිබුණි.	නියමිත කාලය තුළ දී නැවත පොත් භාර නොදෙන කාර්යය මණ්ඩලය සඳහා පුස්තකාලය විසින් සිහිකැඳවීමේ ලිපි යැවීම සෑම මසකම 25 වන දින සිදු කරන ලදී. අනු අංක UVP/BD/D/UWU/17/03 - 2017.04.19 දින අප විසින් ලබා දුන් විගණන තොරතුරු වලට අනුව ආචාර්යවරු සඳහා ලබා දෙන ලද පොත් 21 න් මේ වන විට පොත් 9 ක් නැවත පුස්තකාලයට ගෙන්වා ගැනීමට කටයුතු කර ඇත. 47 වන වරට පවත්වනු ලැබූ පුස්තකාල කමිටු රැස්වීමේ දී (2017.05.04) සහකාර පුස්තකාලයාධිපතිවරුන්	අදාල ආචාර්යවරු ලබා දුන් පොත් 21 නැවත පුස්තකාලයට ආපසු භාරදීමට කටයුතු කර ඇත.

		විසින් කාර්යය මණ්ඩලයට පොත් බැහැර දීම සම්බන්ධව හා නැවත භාරදීම සම්බන්ධව ක්‍රමවේදයක් හඳුන්වා දෙන ලෙස ඉල්ලීමක් සිදු කළ අතර, පළමු උප කුලපති උපදේශක මණ්ඩල රැස්වීමේ දී (2017.05.17) පොත් බැහැර දී නැවත භාර දීමට තිබූ මසක කාලය මාස 04 ක් දක්වා දීර්ඝ කරන ලදී. එම කාලය තුළ දී නැවත පොත් භාර නොදෙන කාර්යය මණ්ඩලය සඳහා පුස්තකාලය විසින් පෙර සිදුකල පරිදිම සිහිකැඳවීමේ ලිපි යැවීමට තීරණය කරන ලදී. නියමිත දිනට නැවත පොත් පුස්තකාලයට භාර නොදීම සම්බන්ධව සාකච්ඡා කළ අතර, ඒ සම්බන්ධව ඉදිරියේ දී දඩ මුදල් අය කිරීම සම්බන්ධව ද අවධානය යොමු කළ අතර, එම කරුණු පිළිබඳ පුස්තකාල කාර්යය මණ්ඩලය විසින් සාමාජිකයින් දැනුවත් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස නැවත භාර නොදී තිබූ පොත් බොහෝ ප්‍රමාණයක් නැවත අප පුස්තකාලය වෙත ගෙන්වා ගැනීමට හැකි විය.	
(ඇ)	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වන ආයතන සංග්‍රහයේ V පරිච්ඡේදයේ 7.6 ඡේදය බැඳුම්කර හා ගිවිසුම් කොන්ත්‍රාත් කඩ කිරීම සම්බන්ධයෙන් ආචාර්යවරු දෙදෙනෙකුගේ 2016 දෙසැම්බර් 31 දින වන විට රු.7,659,146 ක මුදලක් විශ්වවිද්‍යාලය වෙත අයවිය යුතුව තිබුණි.	බැඳුම්කර හා ගිවිසුම් කොන්ත්‍රාත් කඩ කිරීම සම්බන්ධයෙන් ආචාර්යවරුන් දෙදෙනෙකුගේ රු: 7,659,146 ක මුදල් විශ්වවිද්‍යාලය වෙත අයවිය යුතුව තිබුණි. 1. ඇප බැඳුම්කර හා ගිවිසුම් කොන්ත්‍රාත් කඩ කිරීම හේතුවෙන් සේවය හැරගියා සේ සළකා ඇති ආචාර්යවරු දෙදෙනාගෙන් එම්.ඒ.පී.එන් පෙරේරා මහතා රු: 1,280,912.01 ක මුදලක් විශ්වවිද්‍යාලය වෙත ගෙවා ඇති අතර, ඉතිරි මුදල වූ රු: 893,923.49 ක මුදල අර්ථ සාධක අරමුදලින් පියවා ගැනීමට කැමැත්ත පළකර අදාල අයදුම්පත් භාර දී ඇති අතර, එය අයකර ගැනීමට කටයුතු සිදුකරමින් පවතී. 2. තවද ඊ.කේ.එන්.ඩී. ප්‍රනාන්දු මහත්මිය හට යවන ලද අවසන් සිහිකැඳවීමට ද ප්‍රතිචාරයක් නොලැබූ හෙයින් ඒ පිළිබඳව ඔස්ට්‍රේලියාවේ ශ්‍රී ලංකා මහකොමසාරිස් කාර්යාලය හා ශ්‍රී ලංකාවේ	වර්තමාන තත්ත්වය පහත පරිදි වේ. I. <u>M.A.P.N.පෙරේරා රු.2,174,835.50</u> මෙයින් රු. 1,280,912.01 ක් අය කර ගෙන ඇති අතර, ඉතිරිය, එනම් රු.893,923.49 ක මුදල විශ්වවිද්‍යාල අර්ථ සාධක අරමුදලේ ශේෂය මඟින් අය කර ගැනීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත දැනටමත් දැනුම් දී ඇත. II. <u>E.K.N.D.ප්‍රනාන්දු - 6,765,222.99</u>

		ඔස්ට්‍රේලියානු මහකොමසාරිස් කාර්යාලය දැනුවත් කර ලියා යවා ඇත.	අදාල මුදල ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට නීතිමය පියවර ගනිමින් පවතී.
4.3	**අවධිමත් ගනුදෙනු**		
ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයට කුලී පදනම මත වාහන සැපයූ සැපයුම්කරුවන් සමඟ එළඹ තිබූ ගිවිසුමේ කුලී වාහන රියදුරන් සඳහා නවාතැන් පහසුකම් සැපයීමට එකඟ වී නොතිබුණද 2006 වර්ෂයේ සිට නවාතැන් පහසුකම් ලබා දී තිබුණි. ඒ අනුව 2014 වර්ෂයේ අගෝස්තු සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා කුලී පදනම මත ලබාගත් වාහන 11 ක රියදුරන් 11 දෙනෙකු සඳහා කුලී නිවාසයක් ලබාගෙන ඒ වෙනුවෙන් රු. 484,750 ක මුදලක් හා විදුලිය හා ජල බිල්පත් සඳහා 5,930 ක් විශ්වවිද්‍යාලය මඟින් ගෙවා තිබුණි.	ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය බදුල්ල දිස්ත්‍රික්කයේ ස්ථාපනය කිරීමේ දී හා එහි අවශ්‍යතා සඳහා කුලී පදනම මත වාහන ලබා ගන්නා ලදී. එහි දී 2006 සිට මේ දක්වා විශ්වවිද්‍යාලය වෙනුවෙන් යොදවා ඇති රියදුරන් සඳහා රියදුරු නේවාසිකාගාරයක් හෝ රියදුරන් හට රැඳී සිටීමට හෝ විවේක ගැනීමට හා රාත්‍රියේ ශිෂ්‍යාය අවශ්‍යතා හා අනෙකුත් කටයුතු වලට වාහන යෙදවීමට අපහසු විය. එම නිසා විශ්වවිද්‍යාලයේ ප්‍රධාන පිවිසුමේ සිට මීටර් 25 පමණ දුරින් පිහිටි නිවසක් හඳුනාගෙන කුලී පදනම මත ලබා ගන්නා ලදී. එහි රියදුරන්ට අමතරව ජලනල කාර්මික හා විදුලි කාර්මික ද නවාතැන් කටයුතු වෙනුවෙන් භාවිතා කරන ලදී. එම නිසා විශ්වවිද්‍යාලයේ ඉහත සේවකයින්ගේ සේවා අවශ්‍යතාවය පැය 24 පුරා ලබා ගැනීමටත් එම සේවාව කඩිනමින් අවශ්‍ය වේලාවට ලබා ගැනීම සඳහා මෙම ක්‍රියා මාර්ගය ගන්නා ලදී. මෙහිදී කුලී පදනම මත ලබා ගන්නා ටෙන්ඩරයේ කොන්දේසි මාලාවේ හෝ ගිවිසුම්පතේ නිවාස විශ්වවිද්‍යාලය විසින් ලබා දීම සඳහන් කර නොතිබූ අතර, එය වාහන අයිතිකරු විසින් දිය යුතු බව ද සඳහන් කර නොමැත. කෙසේ වෙතත් ඉදිරියේ දී ටෙන්ඩර් පත්‍ර නිකුත් කිරීමේ දී මේ සම්බන්ධයෙන් අවධානය යොමුකොට කටයුතු කරන බව දන්වා සිටිමි.	2017.11.29 දින පැවති පොදු ව්‍යාපාර කාරක සභාවේ නිර්දේශය ප්‍රකාර විශ්වවිද්‍යාලය විසින් කුලි වාහන රියදුරන් සඳහා නවාතැන් පහසුකම් සැපයීම වෙනුවෙන් රු. 2,000 (එක් රියදුරෙක් සඳහා) ක මුදලක් වාහන හිමිකරුගෙන් අයකිරීමට තීරණය කරන ලදී.
4.4	**නිශ්ක්‍රීය ඌණ උපයෝජිත වත්කම්**		
(අ)	2010 ජුනි 30 මිළ දී ගෙන තිබූ රු. 322,560 ක් වටිනා ගිනි ආරක්ෂක සේප්පු 05 ක යතුරු අස්ථානගත වීම හේතුවෙන් 2017 අප්‍රේල් 30 දිනවන විටත් ප්‍රයෝජනයට නොගෙන නිශ්කාර්යව තිබුණි.	ගිනි ආරක්ෂණ සේප්පු මිළ දී ගැනීම සහ මෙතෙක් පාවිච්චියට නොගැනීමට අදාලව විශ්වවිද්‍යාලීය විගණන හා කළමනාකරණ කමිටුවේ දීර්ඝ වශයෙන් රැස්වීම් කිහිපයක දීම සාකච්ඡා කර ඇති අතර, විගණන කමිටු නිර්දේශය මත පාලක සභාවේ අනුමැතිය මත මූලික	මෙහි සඳහන් සේප්පු 05, විශ්වවිද්‍යාලයේ නිළධාරීන් විසින් භාවිතා කරයි.

		විමර්ශණයක් පවත්වා සිද්ධියට සම්බන්ධ යැයි හඳුනා ගෙන ඇති නිළධාරීන් දෙදෙනෙකුට (2) විනයානුකූලව කටයුතු කිරීම ආරම්භ කර ඇත. මෙම සේප්පු මිළ දී ගන්නා අවස්ථාවේ සැපයුම් අංශය භාරව කටයුතු කළ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරීවරිය උසස්වීමක් ලබා දැනට කොළඹ විශ්වවිද්‍යාලයේ සේවය කරන අතර, ඇය වෙත චෝදනා පත්‍රයක් යොමු කොට ඇත. ඊට අමතරව මෙම විශ්වවිද්‍යාලයේ ගබඩා පාලකවරයාට එරෙහිව විනය පරීක්ෂණයක් ආරම්භ කිරීමට කටයුතු කර ඇත. තවද පාලක සභාවේ අනුමැතිය මත අස්ථාන ගතව ඇති යතුරු වෙනුවට දැනටමත් අළුතින් යතුරු අදාළ නියෝජිත ආයතනයෙන් මිළ දී ගෙන සේප්පු පාවිච්චියට ගැනීමට අවශ්‍ය කටයුතු යොදා ඇත.	
(ආ)	2016 සැප්තැම්බර් 23 දින 21553 වැය ශීර්ෂය යටතේ රු.1,645,000 ක් ගෙවා ශිෂ්‍යාය ඉගෙනුම් ක්‍රියාකාරකම් වල යෙදවීමේ අරමුණින් මිළ දී ගෙන තිබූ ට්‍රැක්ටරය හා නඟුල 2017 මාර්තු 17 විගණිත දින වන විටත් කිසිදු ප්‍රයෝජනයට නොගෙන විශ්වවිද්‍යාල භූමියේ ගාල්කොට තිබුණි.	මෙම නිරීක්ෂණය සමඟ එකඟ වෙමි. 2015/2016 අධ්‍යන වර්ෂය සඳහා තාක්ෂණ විෂය ධාරාවට අදාලව උපාධි පාඨමාලා 02 ක් සඳහා සිසුන් කණ්ඩායම් 2 ක් බඳවා ගෙන ඇති අතර, ඔවුන්ගේ අධ්‍යයන ප්‍රායෝගික ක්‍රියාකාරකම් සඳහා ඉගැන්වීමේ උපකරණ යටතේ මෙම ට්‍රැක්ටරය සහ නඟුල භාවිතා කිරීමට කටයුතු කරනු ඇත.	අදාල යන්ත්‍ර මේ වන විටත් භාවිතයට ගෙන ඇත.
(ඇ)	2012 වර්ෂයේ දී ඉංජිනේරු වැඩ හල සඳහා මිළ දී ගෙන තිබුණු රු. 14,060,480 ක් වටිනා 3 – Axis CNC යන්ත්‍රය භාවිතය පිළිබඳ ඉදිරිපත් කර තිබූ වාර්තාව අනුව 2013 හා 2014 වර්ෂ වලදී කිසිදු කාර්යයකට යොදා නොගෙන තිබූ අතර, 2015 වර්ෂයේ සිට විගණිත දිනට වූ 2017 අප්‍රේල් 30 දින වන විටත් ප්‍රායෝගික ක්‍රියාකාරකම් 05 ක් පැය 46 ½ පමණක් යොදාගෙන තිබුණි.	3-Axis CNC යන්ත්‍රය විද්‍යා හා තාක්ෂණ පීඨය සඳහා මිළ දී ගන්නා ලද්දේ විද්‍යා හා තාක්ෂණ උපාධි පාඨමාලාවේ Mechatronics අංශයේ සිසුන්ට අවශ්‍ය CAD/CAM ප්‍රායෝගික දැණුම ලබා දීමට මෙන්ම අනෙකුත් උපාධි පාඨමාලා වල සිසුන්ට අවශ්‍ය විෂයය දැණුම ලබා දීමට ය. 2012 වර්ෂයේ දී ඉංජිනේරු වැඩහල සඳහා මෙම උපකරණය මිළ දී ගන්නා ලදි. වාර්ථාගත තොරතුරු අනුව මෙම යන්ත්‍රය ආශ්‍රිතව ප්‍රායෝගික ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් 2017 අප්‍රේල් මස 30 වන දිනට මෙම යන්ත්‍රය යොදා ගෙන තිබුණේ පැය 46 ½ ක ප්‍රායෝගික ක්‍රියාකාරකම් 05 ක් සඳහා පමණි. එසේ වුවද, වාර්තා ගත නොවූ උපකරණය ආශ්‍රිත ප්‍රායෝගික පාඨමාලා තොරතුරු රැසක් ඇති බැවින්, එම	මේ වන විට විද්‍යා හා තක්ෂණ උපාධි පාඨමාලාවේ Mechatronics අංශයේ තෙවන වසර ශිෂ්‍යයන්ගේ දෙවන අර්ධ වර්ෂිකය තුළ මෙම උපකරණය යොදා ගෙන ප්‍රයෝගික ක්‍රියාකාරකම් සිදුවෙමින් පවතින අතර, එම ශිෂ්‍යයන්ගේ ඉදිරි අවසාන වාර ව්‍යාපෘති සඳහා ද මෙම යන්ත්‍රය මඟින් ක්‍රියාකාරකම් සිදුකරයි. තවද, මෙම යන්ත්‍රය මඟින් ආරම්භ වූ නව තාක්ෂණික අධ්‍යයන පීඨයේ ශිෂ්‍යයන් සඳහා ද ප්‍රයෝගික ක්‍රියාකරකම් සිදුකිරීමට

		අදාල තොරතුරු ඔබගේ කාරුණික අවධානය පිණිස මේ සමඟ අමුණා ඇත. තවද, ඉදිරි කාලයේ දී සිදු කිරීමට සැළසුම් කර ඇති ප්‍රායෝගික ක්‍රියාකාරකම්වල මෙන්ම උපකරණය ආශ්‍රිත වෙනත් ක්‍රියාකාරකම් පිළිබඳ වාර්තාවක් ද මේ සමඟ අමුණා එවමි. තවද, මෙම උපකරණයෙහි ඇති මෙම උපකරණයටම ආවේණික වූ ක්‍රියාකාරිත්වයන් හා පහසුකම් විශ්වවිද්‍යාලයේ වැඩහලෙහි ඇති අනෙකුත් උපකරණයන් ගෙන් ලබාගත නොහැකි බව ඔබගේ කාරුණික දැන ගැනීම සඳහා යොමු කරන්නට කැමැත්තෙමි. විද්‍යා හා තාක්ෂණ උපාධි පාඨමාලාවේ Mechatronics අංශයේ තෙවන වසර සිසුන්ගේ පළමු අර්ධ වාර්ෂිකය තුළ මෙම උපකරණය හඳුන්වා දීමක් සිදුකරන අතර, ඒ හා සම්බන්ධ සාමාන්‍ය ප්‍රායෝගික ක්‍රියාකාරකම් පමණක් සිදුකෙරේ. ඒ අනුව පහත සඳහන් ක්‍රියාකාරකම් තෙවන වසර පළමු අර්ධ වර්ෂිකය තුළ අන්තර්ගත වේ. 1. CNC යන්ත්‍රයේ ක්‍රියාකාරීත්වය පිළිබඳ ශිෂ්‍යයින්ට හඳුන්වා දීම. 2. CNC යන්ත්‍රය තනිව ක්‍රියාත්මක කරවීම සඳහා ප්‍රායෝගික පුහුණුවක් ලබා දීම. 3. කේත ක්‍රමය මඟින් (Coding) යන්ත්‍රයේ ක්‍රියාකාරිත්වය පිළිබඳව ශිෂ්‍යය/ශිෂ්‍යාවන් පුහුණු කරවීම. 4. දෙන ලද අක්ෂරයක් CNC යන්ත්‍රය මඟින් කැපීම සඳහා ප්‍රායෝගික පරීක්ෂණයක් පැවැත්වීම. 5. සිසුන් කැමැති අක්ෂරයක් කැපීම සඳහා ප්‍රායෝගික පරීක්ෂණයක් පැවැත්වීම. 6. දෙන ලද හැඩතලයක් යන්ත්‍රය මඟින් කැපීම සඳහා ප්‍රායෝගික පරීක්ෂණයක් පැවැත්වීම.	කටයුතු කරමින් පවතින බව ද දන්වමි. මෙම යන්ත්‍රය නියමිත තත්ත්වයේ පවතින බවද තවදුරටත් දන්වමි.

		7. දෙන ලද හැඩතලයක් යන්ත්‍රය මඟින් කැපීම සඳහා සිසුන්ට අවස්ථාව ලබා දීම. මෙම උපකරණය ආශ්‍රිත උසස් ප්‍රායෝගික පාඨමාලාවන් හතර වන වසරෙහි ඇතුලත් වන ලෙසම මෙම උපකරණය අවසාන වසර සිසුන්ගේ සහ විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්යය මණ්ඩලයේ පර්යේෂණ කටයුතු සඳහා විවිධ ආකාරයෙන් යොදා ගැනීම් සිදුකරනු ලැබේ.	
(ඇ)	අවශ්‍යතාවය සළකා බැලීමකින් තොරව මිළ දී ගැනීම හේතුවෙන් 2017 ජූනි 17 වන දින වන විට 2014, 2015 හා වර්ෂ වල දී මිළ දී ගෙන තිබූ A3 වර්ගයේ කඩදාසි පැකට්1306 නිෂ්කාශනව ගබඩාවේ පැවතුනි.	මෙම නිරීක්ෂණය සමඟ එකඟ වෙමි. නමුත් විශ්වවිද්‍යාලයේ විභාග අංශයේ ප්‍රශ්න පත්‍ර මුද්‍රණය කිරීම සඳහා A3 වර්ගයේ ඡායා පිටපත් කඩදාසි භාවිතා කරනු ලබන අතර, මෙම වර්ෂයේ දී අදාල තොගය භාවිතා කිරීමට කටයුතු කරමි.	පෙර වර්ෂ වල දී මිළ දී ගන්නා ලද A3 වර්ගයේ කඩදාසි විශ්වවිද්‍යාලයේ විභාග කටයුතු සඳහා යොදා ගැනේ. විගණන නිරීක්ෂණයේ සඳහන් A3 වර්ගයේ කඩදාසි පැකට් 1306 කින් පැකට් 521 ක් 2017 වර්ෂයේ නිකුත් කර ඇති අතර, පැකට් 785 ක ප්‍රමාණයක් පමණක් 2017.12.31 දිනට ගබඩාවේ ඉතිරිව පැවතිණි.
4.5	**අරමුදල් ඌණ උපයෝජනය**		
	ඌව කර්මාන්ත කේන්ද්‍රීය අරමුදල, උප කුලපති අරමුදල සහ සුභ සාධක අරමුදල් වල එකතුව වූ රු. 3,340,990 ක් වර්ෂය තුළ ප්‍රයෝජනයට නොගැනීම නිසා අදාළ අරමුදල් වලින් එම අරමුදල් පිහිටුවීමේ අරමුණු ඉටු නොවී ඇති බව නිරීක්ෂණය විය.	මෙම නිරීක්ෂණය සමඟ එකඟ වෙමි. මෙම අරමුදල් සඳහා ලැබීම් මූලාශ්‍ර පැහැදිළිව නිර්වචනය කොට තිබුණ ද, ඒවා භාවිතා කිරීම සඳහා පැහැදිලි උපදෙස් සකස් කොට නැත. ඒ සඳහා උපදෙස් මාලාවක් සකස් කොට විශ්වවිද්‍යාලයේ පාලක සභාවේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරමි.	විගණන වාර්තාවේ සඳහන් පරිදි 2016 වර්ෂය තුළ දී මෙම අරමුදල් කිසිදු කාර්යයක් සඳහා භාවිතා කර නොමැත. කෙසේ වුවද මෙම අරමුදල් භාවිතය පිළිබඳව උපදෙස් මාලාවක් සකස් කිරීම සඳහා කමිටුවක් පත් කිරීමට 2017.08.25 දින පැවති 48 වන මූල්‍ය කමිටුව නිර්දේශ කර ඇත.එම නිර්දේශය 126 වැනි පලක

			සභා රැස්වීමේ දී අනුමත වී ඇති අතර, කමිටුවේ නිර්දේශ මත අරමුදල් ප්‍රයෝජනයට ගැනීමට බලාපොරොත්තු වෙමි.
(ආ)	සුභ සාධන අරමුදල රු.177,364 ක් හා විශේෂ අවශ්‍යතා අරමුදල රු.1,894,530 ක මුදලක් ආයෝජනය නොකිරීමෙන් එම අරමුදලට ලැබෙන පොළී ආදායම අහිමි වී ගොස් තිබුණි.	මෙම නිරීක්ෂණය සමඟ එකඟ වෙමි. සුභ සාධන අරමුදල සහ විශේෂ අවස්ථා සඳහා වූ අරමුදල මෑතක දී මුදල් කමිටුවේ අනුමැතිය යටතේ ආරම්භ කළ ඒවා වන අතර, එම ශේෂයන් පොළී ජණනය වන මූලාශ්‍රයක ආයෝජනය කිරීමට වහාම කටයුතු කරමි.	ඉහත පිළිතුරෙහි සඳහන් පරිදි කමිටුවෙහි නිර්දේශ මත, මෙම අරමුදල ආයෝජනය කිරීමට බලාපොරොත්තු වෙමි
4.6	**ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය**		
(අ)	ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ 1 අදියර යටතේ 2006 වර්ෂයේ රුපියල් මිලියන 350 ක් වටිනා ගොඩනැගිලි ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව නිර්මාණය කර ඉදිකිරීම් ක්‍රමයට ඉටු කිරීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් මධ්‍යම ඉංජිනේරුමය කර්යාංශයට පවරා දී තිබුණි. 2007 වර්ෂයේ දී නැවත එම කොන්ත්‍රාත්තුව මිනුම් කර ගෙවීමේ ක්‍රමය යටතේ විශ්වවිද්‍යාලය විසින් කොන්ත්‍රාත්කරු සමඟම නව ගිවිසුමකටය එළඹ තිබුණි. ඒ අනුව නව ගිවිසුමට එළඹීමට අදාල අනුමැතිය විගණනයට ඉදිරිපත් නොවූ අතර, කොන්ත්‍රාත්කරු විසින් කරන ලද ඉල්ලීමකට අනුව නව කොන්ත්‍රාත් ගිවිසුමේ සඳහන් කොන්දේසි වලට අනුව මිළ විවලන ගණනය කිරීම හේතුවෙන් රු.10,622,507 ක් වැඩිපුර ගෙවා තිබුණි.	CIDA මිළ වෙනස් වීම් ගණනය කිරීමේ ICTAD ආයතනයේ නියමයන් (Formula) මත 90% ක BOQ වටිනාකම ගණනය කර ඇති අතර විගණනයේ දී එය 50% ක ප්‍රතිශතයක් මත ගණනය කිරීම හේතුවෙන් මෙම වෙනස් වීම සිදුව ඇත. කෙසේ නමුත්, අප විසින් ගෙවා ඇත්තේ BOQ මුදලින් 90% ක දායකත්වය සහ යොමුගත ගිවිසුමේ සඳහන් මිල වෙනස් වීමට අදාලව වෙන්ව ඇති මුදලට යටත්ව ය. ඒ අනුව වැඩිපුර ගෙවා නොමැති බව නැවතත් පෙන්වා දෙමි. .	CIDA මිළ වෙනස් වීම් ගණනය කිරීමේ ICTAD ආයතනයේ නියමයන් (Formula) මත 90% ක BOQ වටිනාකම ගණනය කර ඇති අතර විගණනයේ දී එය 50% ක ප්‍රතිශතයක් මත ගණනය කිරීම හේතුවෙන් මෙම වෙනස් වීම සිදුව ඇත. කෙසේ නමුත්, අප විසින් ගෙවා ඇත්තේ BOQ මුදලින් 90% ක දායකත්වය සහ යොමුගත ගිවිසුමේ සඳහන් මිල වෙනස් වීමට අදාලව වෙන්ව ඇති මුදලට යටත්ව ය. ඒ අනුව වැඩිපුර ගෙවා නොමැති බව නැවතත් පෙන්වා දෙමි.

4.7	**කාර්යය මණ්ඩල පරිපාලනය**		
විශ්වවිද්‍යාලයේ පීඨයන් හි අනුමත මහාචාර්ය තනතුරු 10 ක් හා සත්ත්ව විද්‍යා හා අපනයන කෘෂිකර්ම පීඨය සහ විද්‍යා හා තක්ෂණ පීඨය සඳහා අනුමත කථිකාචාර්ය තනතුරු 21 ක් පුරප්පාඩුව පැවති අතර, කළමනාකාරණ පීඨයේ කථිකාචාර්යවරු 05 ක් අතිරික්තව පැවතුනි. තවද, 2006 ජූනි 06 දිනැති අංක 876 දරණ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ චක්‍රලේඛය ප්‍රකාරව විශ්වවිද්‍යාලයේ අනධ්‍යයන කාර්යය මණ්ඩලයේ පුරප්පාඩු 43 කට නිළධාරීන් බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි.	**අධ්‍යයන කාර්යය මණ්ඩලය** මහාචාර්ය තනතුරු සඳහා මීට පෙර අවස්ථාවන් වල දී පළකරනු ලැබූ පුවත්පත් දැන්වීම් අනුව සුදුසුකම් ලත් අයදුම්පත් ලැබී නොමැති බව වාර්තා වන අතර, චක්‍රලේඛ 916 ට අනුව සුදුසුකම් සපුරා ඇති අයගේ අයදුම්පත් කැඳවීම සඳහා පුවත්පත් දැන්වීම් පළකිරීමට කටයුතු කර ඇත. විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්යය මණ්ඩලය බඳවා ගැනීමට 2015 හා 2016 වසර වල පළකරන පුවත්පත් දැන්වීම් වලට අදාලව සියළුම සම්මුඛ පරීක්ෂණයන් සිදුකොට අවසන් වී ඇති අතර, 2016.12.31 දින වන විට අධ්‍යයන කාර්යය මණ්ඩලය තත්‍ය පුරප්පාඩු සංඛ්‍යාව 16 ක් දක්වා අඩු කර ඇත. කළමනාකරණ පීඨය සඳහා පැවති තනතුරු සංඛ්‍යාව ප්‍රමාණවත් නොවීම හේතුවෙන් අනෙකුත් පීඨයන් හි පුරප්පාඩු තනතුරු වලින් කථිකාචාර්යවරු 05 දෙනෙකු බඳවා ගැනීම් සිදුකිරීමට කටයුතු කර තිබුණි. **අනධ්‍යයන කාර්යය මණ්ඩය** අදාළ බඳවා ගැනීම් පටිපාටි අනුගමනය කරමින් අනධ්‍යයන කාර්යය මණ්ඩල බඳවා ගැනීමේ කටයුතු සිදුකරමින් පවතින අතර, පසුගිය වසරේ 70 ක් වූ පුරප්පාඩු සංඛ්‍යාව 2016.12.31 දිනට 43 දක්වා අඩුකර ගැනීමට හැකි වී ඇත.	2017.02.01 සිට ක්‍රියාත්මක නව කාර්යය මණ්ඩල වාර්තාවට (Cadre Report) අනුව මේ වන විට බඳවා ගැනීම් සිදුකරමින් පවතී.
05.	**ගිණුම් කටයුතු භාවය හා යහපාලනය**		
5.1	**සංයුක්ත සැළැස්ම**		
2003 ජූනි 02 දිනැති අංක පී.ජී.ඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.2 ඡේදය පරිදි පූර්ව තෙවර්ෂයෙහි මෙහෙයුම් ප්‍රතිඵල පිළිබඳ සමාලෝචනයක් යථෝක්ත සංයුක්ත සැළැස්මෙහි අන්තර්ගතව	සංයුක්ත සැළැස්ම 2016 සිට 2020 දක්වා වන අවුරුදු පහක (5) කාලය සඳහා පිළියෙල කර ඇති අතර, වාර්ෂිකව පිළියෙල කරන ලද ක්‍රියාකාරී සැළැස්ම මත	විගණන කළමනාකරණ කමිටුවේ දී තීරණය කළ පරිදි ඉදිරි වසර 3 ක කාලය සඳහා සංශෝධනය කරන

නොතිබුණු අතර ඉටු කර ගත යුතු ඉලක්කයන්ගේ මූල්‍ය අගයන් දක්වා නොතිබුණු බැවින්, වාර්ෂික ප්‍රගතිය ඇගයීමට හැකි ආකාරයෙන් සංයුක්ත සැළැස්ම ඉදිරිපත් කර නොතිබුණි.	කටයුතු කරන අතර, පසුගිය වර්ෂ වල මෙහෙයුම් ප්‍රතිඵල පිළිබඳ සමාලෝචනයක් වෙනම ඉදිරිපත් කිරීමට කටයුතු කරමි.	ලද සංයුක්ත සැළැස්ම පිළියෙල කිරීම සඳහා කළමනාකරණ පීඨයේ පීඨාධිපතිතුමාගේ උපදෙස් මත අචාර්ය පී.එච්.ටී. කුමාර මහතාගේ සේවය ලබා ගැනීමට තීරණය කෙට ඇත.
5.2	**ක්‍රියාකාරී සැළැස්ම**	
2014 පෙබරවාරි 17 දිනැති හා අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04 ඡේදය ප්‍රකාරව ක්‍රියාකාරී සැළැස්ම වාර්ෂිකව පිළියෙල කළ යුතු වුවත් 2016 – 2020 දක්වා වර්ෂ 05 කට පිළියෙල කර තිබූ අතර, යාවත්කාලීන කළ ආයතනයේ සංවිධාන ව්‍යුහය, අනුමත හා තථ්‍ය කාර්යය මණ්ඩල විස්තර එම සැළැස්ම තුළ ඇතුලත් කර නොතිබුණි.	ක්‍රියාකාරී සැළැස්ම සංයුක්ත සැළැස්මේ කොටසක් වශයෙන් අදාල කාර්යයන් ඉටු කළ ආකාරය වාර්ෂිකව වෙන් වෙන්ව දක්වා ඇත. කෙටුම්පත් වාර්තාවේ අංක එක (1) යටතේ සඳහන් සංවිධාන ව්‍යුහය ක්‍රියාකාරී සැළැස්මට ඇතුලත් කළ අතර, වාර්ෂික අයවැය සහ මූල්‍ය ප්‍රතිඵල මූල්‍ය ප්‍රකාශ වල ඇතුලත් කර නැත. තවද අභ්‍යන්තර විගණන සැළැස්ම ඉදිරියේ දී ක්‍රියාකාරී සැළැස්මට ඇතුලත් කිරීමට කටයුතු කරමි.	විගණන කළමනාකරණ කමිටුවේ දී තීරණය කළ පරිදි ඉදිරි වසර 3 ක කාලය සඳහා වෙන වෙනම ක්‍රියාකාරී සැළසුම් පිළියෙල කිරීමට උපදෙස් දී ඇත.
5.3	**අභ්‍යන්තර විගණනය**	
ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණක හා අභ්‍යන්තර විගණන නිළධාරීන් දෙදෙනෙකු ඇතුළුව නිළධාරීන් තිදෙනෙකුගෙන් සමන්විත උප කුලපතිවරයාට සෘජුවම වග කියන අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා තිබුණ ද, ස්ථීර ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණකවරයෙකු බඳවා ගෙන නොතිබුණි.	විශ්වවිද්‍යාලයට අනුයුක්තව සිටි ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණකවරිය 2016.11.30 දින සිට සේවයෙන් ඉල්ලා අස්වී ඇත. එබැවින් පුරප්පාඩු පිරවීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගන්නා ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති අමතා 2016.12.01, 2017.02.20 සහ 2017.03.24 දිනැති ලිපි මඟින් ඉල්ලීම් සිදුකර ඇත. එකී ලිපි වලට පිළිතුරු වශයෙන් 2017.05.16 වන දින විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ලේකම් විසින් මාස 03 ක කාල සීමාවක් සඳහා කොන්ත්‍රාත් පදනම මත ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණකවරයෙකු බඳවා ගැනීමට අනුමැතිය ලබා දී ඇත. එම පුරප්පාඩුව පිරවීමට අදාල සම්මුඛ පරීක්ෂණයක් සිදු කිරීමට කටයුතු කරමින් පවතී. තවද, අභ්‍යන්තර විගණන අංශයේ කටයුතු බාධාවකින් තොරව පවත්වාගෙන යාම සඳහා	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය මත 2017.08.09 දින සිට කොන්ත්‍රාත් පදනම මත ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණකවරයකු පත් කොට ඇත.

<table>
<tr><td colspan="2"></td><td>සබරගමුව විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණකවරයා 2017.01.27 දින සිට වැඩ ආවරණය කිරීමේ පදනම මත අභ්‍යන්තර විගණන අංශයේ රාජකාරී සඳහා අනුයුක්ත කර ඇත.</td><td></td></tr>
<tr><td>5.4</td><td colspan="3">ප්‍රසම්පාදන සැළැස්ම</td></tr>
<tr><td colspan="2">රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 ප්‍රකාරව, ප්‍රධාන ප්‍රසම්පාදන සැළැස්ම යාවත්කාලීන කර නොතිබුණි.</td><td>මෙම නිරීක්ෂණය සමඟ එකඟ විය නොහැක.
2017 වර්ෂයේ විස්තරාත්මක ප්‍රසම්පාදන සැළැස්ම සකස් කොට ඇති අතර, 2017 අප්‍රේල් මාසයේ සිට ප්‍රසම්පාදන ප්‍රගති සාමාලෝචන රැස්වීම් මාසිකව පවත්වා ඇති අතර, එයට අදාලව 2017 ප්‍රසම්පාදන සැළැස්ම දැනටමත් යාවත්කාලීන කොට ඇත.</td><td>2017 වර්ෂය තුළ දී ප්‍රසම්පාදන සැළැස්ම යාවත්කාලීන කිරීම සිදු කර ඇත.</td></tr>
<tr><td>5.5</td><td colspan="3">අයවැය ලේඛනමය පාලනය</td></tr>
<tr><td colspan="2">සමාලෝචිත වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයේ මුළු ප්‍රතිපාදන හා වියදම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

විස්තරය | ප්‍රතිපාදනය | උපයෝජනය | වෙනස | වෙනස ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස
--- | --- | --- | --- | ---
| රු. | රු. | රු. | %
පුනරාවර්තන | 638,000,000 | 481,336,815 | 156,663,185 | 25
ප්‍රාග්ධන | 600,000,000 | 266,839,401 | 333,160,599 | 56
| 1,238,000,000 | 738,176,216 | 489,823,784 |</td><td></td><td rowspan="2">2016 වර්ෂය මුළ දී පිළියෙල කරනු ලැබූ අයවැය ලේඛනය වර්ෂය තුළ දී සිදු වූ මෙහෙයුම් හා අනෙකුත් විචලනයන් පාදක කරගෙන, 2016 වර්ෂය තුළ දී අයවැය ලේඛනය වෙනස් කරන ලදි. ඉදිරි කාලපරිච්ඡේද වල දී අයවැය ලේඛනය ඵලදායී කලමණාකරණ පාලන කර්යයක් ලෙස යොදා ගැනීමට බලාපොරොත්තු වෙමි.</td></tr>
<tr><td>(අ)</td><td>2016 වර්ෂයේ සංශෝධිත අයවැය ඇස්තමේන්තුවෙන් මූලධන වියදම සඳහා ලබා දී තිබුණ රු. 600,000,000 ක් වූ ප්‍රතිපාදනයෙන් රු. 333,160,599 ක් ඉතිරි කර තිබූ අතර එම</td><td>මෙම නිරීක්ෂණය සමඟ එකඟ වෙමි.
විශ්වවිද්‍යාලය ඉදිකිරීම් අදියර II ව්‍යාපෘතියේ විෂයය පථය වෙනස් වීම සහ විශ්වවිද්‍යාල භූමියේ කර්මාන්ත</td></tr>
</table>

	ඉතිරිය සමස්ථ මූලධන ප්‍රතිපාදනයෙන් සියයට 56 ක් විය.	කරුවන් කිහිපදෙනෙකු ඉවත් නොවීම හේතුවෙන් එම ස්ථානයන්හි සැළසුම් කරන ලද ඉදිකිරීම් කටයුතු සිදු කිරීමට නොහැකි වීම හේතු කොට ගෙන ඉදිකිරීම් කටයුතු වලට වෙන් කරන ලද මූලධන වියදම් හි ඇති වූ ඉතිරිය මේ සඳහා හේතු වේ.	
(ආ)	සංශෝධිත අයවැය ඇස්තමේනතුවෙන් පුනරාවර්තන වියදම් සඳහා ලබා දී තිබූ රු.638,000,000 ක් වූ ප්‍රතිපාදනයෙන් රු.156,663,185 ක් ඉතිරි කර තිබුණු අතර, එම ඉතිරිය සමස්ථ පුනරාවර්තන ප්‍රතිපාදනයෙන් සියයට 25 ක් විය.	පුනරාවර්තන වියදම් වල රු. 156,663,185 ක් වූ ඉතිරිය ප්‍රධාන වශයෙන් සිදු වී ඇත්තේ විශ්වවිද්‍යාලයේ අධ්‍යයන හා අනධ්‍යයන සේවක කාර්යය මණ්ඩල වල පවතින පුරප්පාඩු පිරවීම සිදු නොවීම හේතුවෙන් වැටුප් ගෙවීම සඳහා වූ ප්‍රතිපාදනයන් ඉතිරි වීම නිසා වේ.	
(ඇ)	2016 වර්ෂය සඳහා සත්‍ය වශයෙන් ලැබී තිබූ ස්වයං මූල්‍ය වැඩ සටහන් ආදායම රු.4,405,747 ක් හා වෙනත් ආදායම් රු.14,202,090 ක් අයවැය ඇස්තමේන්තුව පිළියෙල කිරීමේ දී හඳුනා ගෙන නොතිබුණි.	මෙම නිරීක්ෂණය සමඟ එකඟ විය නොහැක. 2016 අයවැය වාර්තාවේ “ආකෘති අංක II”, “ආදායම් ඇස්තමේන්තු” යටතේ ස්වයං මූල්‍ය වැඩ සටහන් ආදායම රු. 24,687,000 ක් වූ “Income from Extension Programme”නම් වූ ශීර්ෂය තුළ ඇතුලත් වන අතර, වෙනත් ආදායම් එක් එක් ශීර්ෂයන් යටතේ දක්වා ඇත.	
(ඈ)	සමාලෝචිත වර්ෂයේ අයවැය ඇස්තමේන්තුවේ සඳහන් වෙනත් ප්‍රදාන රු. 10,000,000 ක් පුනරාවර්තන ලැබීම් රැස්කර නොතිබුණි.	මෙම නිරීක්ෂණය සමඟ එකඟ විය නොහැක. වර්ෂයේ අයවැය ඇස්තමේන්තුවේ වෙනත් ප්‍රදාන කිසිවක් ඇතුලත් නොවේ.	
(ඉ)	2016 වර්ෂය තුළ ස්වයං මූල්‍ය වැඩ සටහන් වියදම් ලෙස රු. 3,451,957 ක පුනරාවර්තන වියදමක් දරා තිබුණ ද, එම වටිනාකම අයවැය ඇස්තමේන්තු කිරීමේ දී හඳුනා ගෙන නොතිබුණි.	මෙම නිරීක්ෂණය සමඟ එකඟ විය නොහැක. 2016 වර්ෂයේ ස්වයං මූල්‍ය වැඩ සටහන් වලට අදාල වියදම් වෙනුවෙන් අදාල 2016 අයවැය වාර්ථාවේ ආකෘති අංක III හි වෙනත් පුනරාවර්ථන වියදම් යටතේ “Expenditure on Extension programme” තුළ ඇතුලත් කොට ඇත.	
(ඊ)	ඉඩම් අත්පත් කර ගැනීම සඳහා අයකර තිබුණු රු. 74,884 ක ප්‍රාග්ධන වියදම අයවැය ඇස්තමේන්තු පිළියෙල කිරීමේ දී හඳුනා ගෙන නොතිබුණි.	මෙම නිරීක්ෂණය සමඟ එකඟ වෙමි. විශ්වවිද්‍යාල පරිශ්‍රයට යාබද ඉඩමක් අත්පත් කර ගැනීම සඳහා ඉඩම මැනීමේ කටයුතු වෙනුවෙන් ඉහත වියදම දරා ඇත.	
(උ)	2016 වර්ෂයේ මුළු පුනරාවර්තන ආදායම ලෙස රු.638,000,000 ක් ඇස්තමේන්තු කර තිබුණ ද රු. 496,107,836 ක ආදායමක් රැස් කර තිබුණි. එහි වෙනස රු. 141,892,164 ක් වූ අතර, එය	මෙම නිරීක්ෂණය සමඟ එකඟ වෙමි. මුළු පුනරාවර්ථන ආදායම් ඇස්තමේන්තු හා සත්‍ය පුනරාවර්ථන ආදායම අතර වෙනසක් නිරීක්ෂණය	

	ඇස්තමේන්තු ගත මුළු පුනරාවර්තන ආදායම ප්‍රතිශතයක් ලෙස සියයට 22 කි.	වන්නේ පුනරාවර්ථන ප්‍රදානයන් වෙන් කිරීම් වලට සාපේක්ෂව අඩුවෙන් ලැබීමයි.	
(ඌ)	පුනරාවර්තන වියදම ලෙස රු.638,000,000 ක මුදලක් ඇස්තමේන්තු ගත කර තිබුණ ද, එම ප්‍රතිපාදනයෙන් රු. 481,336,815 ක මුදලක් උපයෝජනය කර තිබීමෙන් රු.156,663,185 ක ඌණ උපයෝජනයක් දක්නට ලැබුණි. ඉතිරිය ඇස්තමේන්තු ගත මුළු පුනරාවර්තන වියදමේ ප්‍රතිශතයක් ලෙස සියයට 25 කි.	පිළිතුර ඉහත 5.5. ආ. යටතේ දක්වා ඇත.	
(එ)	සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන ආදායම ලෙස රැස් කර ගැනීමට අපේක්ෂා කල ආදායම රු. 600,000,000 ක් වූ අතර වර්ෂය තුළ රැස් කර ගෙන තිබූ ආදායම රු. 262,700,000 කි. ඒ අතර වෙනස රු. 337,300,000 වන අතර එය ඇස්තමේන්තු ගත මුළු ප්‍රාග්ධන ආදායමේ ප්‍රතිශතයක් ලෙස සියයට 56 කි.	මෙම නිරීක්ෂණය සමඟ එකඟ වෙමි. සාමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන ආදායම ලෙස රැස්කර ගැනීමට අපේක්ෂා කළ ආදායම හා රැස්කල ප්‍රාග්ධන ආදායම අතර වෙනසක් නිරීක්ෂණය වන්නේ ප්‍රාග්ධන ප්‍රදානයන් වෙන් කිරීම් වලට සාපේක්ෂව අඩුවෙන් ලැබීමයි.	
(ඒ)	ප්‍රාග්ධන වියදම ලෙස රු.600,000,000 ක මුදලක් ඇස්තමේන්තු ගත කර තිබුණ ද, එම ප්‍රතිපාදනයෙන් රු. 266,839,401 ක මුදලක් උපයෝජනය කර තිබුණු අතර, රු. 333,160,599 ක ඌණ උපයෝජනයක් දක්නට ලැබුණි. එම ඉතිරිය ඇස්තමේන්තු ගත මුළු ප්‍රාග්ධන වියදමේ ප්‍රතිශතයක් ලෙස සියයට 56 කි.	පිළිතුර ඉහත 5.5 අ. යටතේ දක්වා ඇත.	
6.	**පද්ධති හා පාලනයන්**		
විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා වරින් වර විශ්වවිද්‍යාලයේ උප කුලපති වෙත දැනුම් දෙන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් පිළිබඳ විශේෂ අවධානය යොමු කළ යුතු වේ.			
පද්ධති හා පාලන ක්ෂේත්‍ර		**නිරීක්ෂණ**	
(අ)	ගිණුම්කරණය	ගිණුම්කරණ ප්‍රමිති අනුගමනය නොකිරීම, ගිණුම්කරණ අඩුපාඩු හා නොසැසඳූ ගිණුම් පැවතීම.	අදාල ක්ෂේත්‍රයන් කෙරෙහි වැඩි අවධානය යොමු කරන ලදී.
(ආ)	වත්කම් කළමනාකරණය	ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය නොකිරීම, ස්ථාවර වත්කම් ලේඛන නිසි පරිදි නඩත්තු නොකිරීම.	

(ඇ)	ගබඩා පාලනය	දුර්වල තොග කළමනාකරණයක් පැවතීම.	
(ඈ)	කාර්යය මණ්ඩල පරිපාලනය	තනතුරු වල පුරප්පාඩු පැවතීම හා අතිරික්ත සේවකයින් සිටීම.	